# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,044 - 2017 නොවැම්බර් මස 02 වැනි බ්‍රහස්පතින්ද - 2017.11.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## (IVආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු- ඇබෑර්තු ... ... ... | 2042 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 2057 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 2080 |


සැ. යු. - සුරාබදු (සංශෝධන) පනත් කෙටුම්පත 2017 ඔක්තෝබර් මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2017 නොවැම්බර් මස 24 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 නොවැම්බර් මස 10 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*)

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# තනතුරු - ඇබෑර්තු

## ගල්ගමුව ප්‍රාදේශීය සභාව

### ප්‍රාථමික ශිල්පීය නොවන සේවක ගණයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීම

වයඹ පළාත් රාජ්‍ය සේවයේ ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති ගල්ගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිය ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ දැනටමත් සේවයේ නියුතු අනියම්, තාවකාලික, ආදේශක, ස්වේච්ඡා සේවකයින් ගැන වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.

| *අනු අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | | *අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම්* |
|---|---|---|---|---|---|
| 01 | වැඩ/ක්ෂේත්‍ර කම්කරු | 02 | (රා.ප.ච. 3/2016) PL-1-1 රු.24,250 - 10x250 - 10x270 - 10x300 -12x330 - රු. 36,410 | 1. | අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් 02 ක් වත් සමත් වී තිබිය යුතු යි. (වෛකල්පිත විෂයන් හැර) |
| | | | | 2. | දැනට පළාත් සභා රාජ්‍ය සේවයේ අදාල ආයතනයක ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් රජයේ අනුමත පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබීම ප්‍රමාණවත් වේ. |
| 02 | සෞඛ්‍ය කම්කරු | 02 | (රා.ප.ච. 3/2016) PL-1-1 රු.24,250 - 10x250 - 10x270 - 10x300 -12x330 - රු. 36,410 | 1. | රජයේ අනුමත පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබීම ප්‍රමාණවත් වේ. |
| 03 | පුස්තකාල උපස්ථායක | 02 | (රා.ප.ච. 3/2016) PL-1-1 රු.24,250 - 10x250 - 10x270 - 10x300 -12x330 - රු. 36,410 | 1. | අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් 02 ක් වත් සමත් වී තිබිය යුතු යි. (වෛකල්පිත විෂයන් හැර) |
| | | | | 2. | දැනට පළාත් සභා රාජ්‍ය සේවයේ අදාල ආයතනයක ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් රජයේ අනුමත පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබීම ප්‍රමාණවත් වේ. |

*02. අවශ්‍ය වෙනත් සුදුසුකම් :*

1. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු යි.
2 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට පූර්වාසන්න වසර තුනක් ගල්ගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු යි. (පදිංචිය වසමේ ග්‍රාම නිළධාරී විසින් නිකුත් කරනු ලබන සහතිකයක් මත අදළ ප්‍රදේශීය ලේකම් විසින් අනු අත්සන් කර සනාථකර තිබිය යුතු යි.)

3. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට වයස අවු. 18 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතු යි. (දැනට පළාත් සභා රාජ්‍ය සේවයේ ස්ථිර, අනියම්, තාවකාලික, ආදේශක, සවේච්ඡා තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව අදාළ නොවේ.)
4. යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයෙන් විය යුතුයි.
5. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබූවෙකු හෝ රජයේ/පළාත් පාලන හෝ සංස්ථා සේවයෙන් පහකරනු ලැබූවෙකු නොවිය යුතු යි.

03. *බඳවා ගැනීමේ ක්‍රමය :*

1. සේවා අවශ්‍යතාවයට අනුව විධිමත් සම්මුඛ පරීක්ෂණ සහ ප්‍රායෝගික පරීක්ෂණ මගින් සුදුස්සන් තෝරාගනු ලැබේ.
2. සම්මුඛ පරීක්‍ෂණයට පැමිණෙන විට අයදුම්කරුවන් සියලුම සහතිකවල මුල් පිටපත් රැගෙන ආ යුතු ය.
3. දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ ස්ථිර/තාවකාලික/අනියම්/ආදේශක/දීමනා/ස්වේච්ඡා පදනම මත සේවයේ නියුතු අයදුම්කරුවන්ට වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.
4. නියමිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ට පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලැබේ.
5. සුදුස්සන් තෝරා ගැනීම පිළිබඳව ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වේ.

04. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි:*

1. සියලුම තනතුරු ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය.
2. අදාළ පරිදි වැන්දඹු හා අනත්දරු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුයි.
3. බඳවා ගනු ලබන තැනැත්තන් වසර 03 ක පරිවාස කාලයකට යටත් වන අතර, ශ්‍රේණිගත උසස්වීමක් නම් එක් අවුරුදු වැඩ බැලීමේ කාලයකට යටත් වේ.
4. රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු සඳහාත්, විශේෂයෙන්ම රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කරනු සඳහාත්, දැනටමත් සම්පාදනය කොට ඇති හා මින් මතු සම්පාදනය කළ හැකි විධිවිධානයන්ට එකඟව ක්‍රියා කළ යුතු යි.
5. මෙම බඳවා ගැනීමේ කොන්දේසිවලට අමතරව වයඹ ගරු ආණ්ඩුකාරතුමා අනුමත කර ඇති සේවා ව්‍යවස්ථාවේ කොන්දේසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, රජයේ දෙපාර්තමේන්තු නියෝගවලට ද, වයඹ පළාත් සභාව හෝ වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලටද, අනුකූලව කටයුතු කිරීමට ඉල්ලුම්කරු බැඳී සිටී.

*අයදුම්පත් ඉදිරිපත් කිරීම :*

1. අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2017.11.17 වැනි දින හෝ ඊට ප්‍රථම "ලේකම්, ගල්ගමුව ප්‍රාදේශීය සභාව" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු යි.
2. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ, තනතුර සඳහන් කර අයදුම්පත එවිය යුතු යි.
3. අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු යි.
   i. උප්පැන්න සහතිකය
   ii. අධ්‍යාපන සහතික
   iii. තම පදිංචිය තහවුරු කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම්වරයාගේ සහතිකය.
   iv. මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක් (එකක් ග්‍රාම නිලධාරිගෙන් ලබාගත් එකක් විය යුතු යි.)
   v. වෘත්තීය පළපුරුද්ද පිළිබඳ සහතික (රජයේ/පළාත් පාලන සේවයේ නියුක්ත වූවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.)
   vi. ජාතික හැඳුනුම්පතේ පිටපත.

ඒ. බී. නිමල් රත්නායක,
ලේකම්,
ගල්ගමුව ප්‍රාදේශීය සභාව.

2017 ඔක්තෝබර් මස 13 වැනි දින,
ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ දී ය.

**වයඹ පළාත් රාජ්‍ය සේවයේ ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ .......................... තනතුර සඳහා අයදුම් පත්‍රය**

01. (i) අයදුම්කරුගේ මුලකුරු සමග නම :——————————.
(ii) මුලකුරුවලින් හැඳින්වෙන නම :——————————.
02. ස්ථිර ලිපිනය :——————————.
03. (i) උපන් දිනය : අවුරුද්ද:———— මාසය:———— දිනය :————
(ii) 2017.11.17 දිනට වයස : අවුරුදු :————.මාස :———— දින :———— .
04. ජාතික හැඳුනුම්පත් අංකය :——————————.
05. ස්ත්‍රී/ පුරුෂ භාවය :——————————.
06. විවාහක/ අවිවාහක බව :——————————.
07. ජාතිය :——————————.
08. වයඹ පළාත තුළ ස්ථිර පදිංචි කාලය :————
09. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද? එසේනම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද යන වග :——————————.

10. අධ්‍යාපන සුදුසුකම් (සමත් වූ විභාග පිළිබඳ විස්තර) ෘ
(i) සමත් වූ වසර/ ශ්‍රේණිය :————. වර්ෂය :————
(ii) අ. පො. ස. (සා.පෙළ) විභාගය ෘ

විභාග අංකය:———— වර්ෂය :————.

| විෂයය | සමාර්ථය | විෂයය | සමාර්ථය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

(iii) අ. පො. ස. (උ.පෙළ) විභාගය

විභාග අංකය :————. වර්ෂය :————.

| විෂයය | සමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |

11. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :——————————.
12. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් එම සේවා කාලය සහ විස්තර :——————————.
13. ඔබ කවරදක හෝ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබ තිබේ ද ? :——————————.

මෙම ඉල්ලුම්පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු මාගේ දැනීමේ මා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය බව මා එම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, තෝරා ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දනිමි.

——————————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය*
*(දැනට සේවයේ නියුක්ත වූවන්ට පමණි)*

අයදුම්කරු ඉහතින් දක්වා ඇති තොරතුරු නිවැරදි බවත්, තෝරාගනු ලැබුවහොත් සේවයෙන් මුදාහැරීමට එකඟවන බවත් දැනට .......................... වශයෙන් සේවය කරන බවත් සහතික කරමි.

______ .
දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ අත්සන
(නිල මුද්‍රාව තැබිය යුතුයි)

දිනය :______ .

11-123

---

## දකුණු පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

### කරන්දෙණිය ප්‍රාදේශීය සභාව

කරන්දෙණිය ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුර සඳහා බඳවා ගැනීමට නියමිත සුදුසුකම් සපුරා ඇති දකුණු පළාත් සභා සීමාව තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *මාසික වැටුප් පරිමාණය* | *බඳවා ගැනීමේ අවම අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|
| වැඩ/ක්ෂේත්‍ර කම්කරු III ශ්‍රේණිය | 02 | PL1-2016 Grade III 24,250-10x250-10x270-10x300-12x330-36,410/- | 08 වන ශ්‍රේණිය (09 වසර) සමත්ව තිබීම |

02. *වයස් සීමාව* :

i. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු 45ට නොවැඩි විය යුතුය.

03. *පොදු සුදුසුකම්* :

i. අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචිවීමෙන් ශ්‍රී ලාංකික පුරවැසියෙක් විය යුතු ය.

ii. අයදුම්කරුවන් දකුණු පළාත් සභා සීමාව තුළ අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර තුනක කාලයක් ස්ථිර පදිංචි කරුවෙකු විය යුතුය. කරන්දෙණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචිකරුවන්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

iii. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය. තෝරාගනු ලැබුවහොත් මාසයක් ඇතුළත රජයේ වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර එම පරීක්ෂාවේදී ශාරීරික වශයෙන් නුසුදුස්සෙකු බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.

iv. දණ්ඩ නීති සංග්‍රහ යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු හෝ රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබූවෙකු නොවිය යුතුය.

v. අයදුම්කරුවන් අදාළ තනතුර සඳහා සඳහන් වී ඇති අවම සුදුසුකම් සපුරා තිබිය යුතුය.

04. *පොදු කොන්දේසි*-

i. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාලසීමාවේ දී හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම, සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීමේ බලය කරන්දෙණිය ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

ii. දැනට කරන්දෙණිය ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුක්ත ස්ථිර, ආදේශක සේවකයින්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ

05. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :-*

i. මෙම තනතුර ස්ථිරය.

ii. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට යටත්විය යුතුය.

iii. පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ. එම කාලය තුළ දී වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක වේ නම් පරිවාස කාලය අවසානයේ දී සේවය කරනු ලැබේ. දැනටමත් රාජ්‍ය සේවයේ, පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත තනතුරේ ස්ථිරකර තැනැත්තන් එක් වසරක වැඩ බැලීමේ කාලයකට යටත් කර බඳවා ගැනු ලැබේ.

06. මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසිවලට ද, දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝගවලට ද, දකුණු පළාත් සභාවේ හෝ දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත්කරන රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

07. *බඳවාගැනීමේ ක්‍රමය :*

i. සුදුසුකම් සපුරන අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරාගනු ලැබේ.

08. *අයදුම්පත් එවිය යුතු ආකාරය :-*

අයදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කරන ලද පිටපත් ද අමුණා එවිය යුතුය.

i. උප්පැන්න සහතිකය

ii. අධ්‍යාපන සහතික හා පාසල් හැරයාමේ සහතිකය

iii. පදිංචිය සනාථ කිරීමේ සහතිකය (පදිංචි කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි විසින් මාස 06ක් තුළ දී නිකුත්කරන ලදුව අදාළ ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිතව තිබිය යුතුය.)

iv. මෑතක දී ලබාගත් චරිත සහතික 2 ක්

v. වෘත්තිය හෝ පළපුරුද්ද පිළිබඳ සහතික (තිබේ නම්)

vi. සේවා පළපුරුද්ද පිළිබඳ සහතික.

මෙම නිවේදනයේ දක්වා ඇති ආදර්ශ අයදුම් පත්‍රය අනුව සකස්කරන ලද අයදුම්පත් 2017.11.22 දිනට පෙර "ලේකම්, කරන්දෙණිය ප්‍රාදේශීය සභාව, කරන්දෙණිය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. (අයදුම්පත A4 ප්‍රමාණයේ කඩදාසිවල සකස්කළ යුතුය.) අසම්පූර්ණ, අපැහැදිලි මෙන්ම නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ද කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

පී.එච්.ටී.කේ. හේමචන්ද්‍ර,
ලේකම්,
කරන්දෙණිය ප්‍රාදේශීය සභාව.

2017 ඔක්තෝබර් මස 16 වැනි දින,
කරන්දෙණිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

ආදර්ශ අයදුම් පත

*කරන්දෙණිය ප්‍රාදේශීය සභාව*

*වැඩ/ක්ෂේත්‍ර කම්කරු තනතුර සඳහා අයදුම් පත්‍රය*

1. නම :————————————.
   මුලකුරුවලින් හැඳින්වෙන නම් :————————————.
2. ස්ථිර ලිපිනය :————————————.
3. දිස්ත්‍රික්කය :————————————.

4. උපන් දිනය :——————————.
   අවුරුද්ද :————මාසය :————  දිනය :————
5. ජාතික හැඳුනුම්පත් අංකය :——————————.
6. ස්ත්‍රී / පුරුෂ භාවය :——————————.
7. අයදුම්පත් භාරගන්නා 2017.11.22 දිනට වයස :——————————.
   අවුරුදු:———— මාස:———— දින :————
8. විවාහක/අවිවාහක බව :——————————.
9. ජාතිය :——————————.
10. ඔබ ශ්‍රී ලාංකිකයෙක් ද? ලියාපදිංචියෙන්ද යන වග :——————————.
11. අධ්‍යාපන සුදුසුකම් (සමත් වූ විභාග පිළිබඳ විස්තර) :

    i. සමත් වූ වසර/ශ්‍රේණිය :——————————.

    ii. අ.පො.ස. (සා/පෙළ) විභාගය :——————————.
    විභාග අංකය:————
    විභාග වර්ෂය හා මාසය :————
    සමත් වූ විෂයයන් :————.

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

12. වෘත්තීය සුදුසුකම් (සහතික මගින් සනාථ කළ යුතුයි) :——————————.
13. සේවා පළපුරුද්ද :——————————.
14. ඔබ කවරදක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද? :——————————.
    එසේ නම් තොරතුරු :——————————.

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව මෙයින් ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳව කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇති බවට සනාථ වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

දිනය :————.  ————.
අයදුම්කරුගේ අත්සන

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු ඉල්ලුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය :*

මෙම ඉල්ලුම්කරු වන ................................ මහතා/මහත්මිය/මෙනවිය, දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ........................ වශයෙන් සේවය කරයි. ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ ඇය මොනම ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

————.
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

නම :——————————.
පදවි නාමය :——————————.
දෙපාර්තමේන්තුව/ආයතනය :——————————.
(නිල මුද්‍රාව යොදන්න)

දිනය :————.

11-133

## ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාව

### ශිල්පීය නොවන/අර්ධ ශිල්පීය III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීම

ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාවේ පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02.

| *තනතුරු නාමය* | *පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෘත්තීය වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|
| විදුලි කාර්මික (අර්ධ ශිල්පීය) | 01 | රා.ප.ච.03/2016 - පී.එල්. 2-2016<br><br>රු. 25,250 - 10x270 - 10x300 - 10x330 - 12x350 = රු. 38,450/= | * අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක් සමත් විය යුතුයි. (වෛකල්පිත විෂයයන් හැර)<br>* රජයේ පිළිගත් කාර්මික විද්‍යාලයක හෝ වෘත්තීය පුහුණු ආයතනයක හෝ තෘතීය ආයතනය විසින් පිළිගත් ආයතනයක විදුලි කාර්මික ශිල්පය පිළිබඳ පුහුණු සහතිකයක් ලබා තිබීම.<br>* අදාළ ක්ෂේත්‍රයේ (පුහුණු කාලය හැර) වසර 02 ක ප්‍රායෝගික පළපුරුද්දක් ලබා තිබිය යුතුය. (සහතිකයක් මගින් සනාථ කළ යුතුය.) |
| කාර්යාල කාර්ය සහයක (ශිල්පීය නොවන) | 01 | රා.ප.ච.03/2016 - පී.එල්. 1-2016<br><br>රු. 24,250 - 10x250 - 10x270 - 10x300 - 12x350 = රු.36,410/= | අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක් සමත් විය යුතුයි. (වෛකල්පිත විෂයයන් හැර) |
| මුරකරු (ශිල්පීය නොවන) | 01 | | |
| වැඩ/ක්ෂේත්‍ර කම්කරු (ශිල්පීය නොවන) | 01 | | |
| සෞඛ්‍ය කම්කරු (ශිල්පීය නොවන) | 02 | රා.ප.ච.03/2016 - පී.එල්. 1-2016<br><br>රු. 24,250 - 10x250 - 10x270 - 10x300 - 12x330 = රු. 36,410/= | රජය විසින් අනුමත කරන ලද පාසැලකින් 9 වසර (8 ශ්‍රේණිය) සමත්ව තිබීම. |

03. *පොදු සුදුසුකම් :*

i. අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙකු වීම.

ii. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03 කට නොඅඩු කාලයක් ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. (ඡන්ද හිමි නාමලේඛනය හෝ ප්‍රාදේශීය ලේකම් විසින් අත්සන් කළ සහතිකයකින් සනාථ විය යුතුය.)

iii. තනතුරු සඳහා ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නො අඩු සහ 45ට නොවැඩි විය යුතුය. (දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයට මෙම වයස් සීමාව අදළ නොවේ.)

iv. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.

v. යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

04. *බඳවා ගැනීමේ ක්‍රමය :*

සම්මුඛ පරීක්ෂණයක් සඳහා සහභාගී වන අයදුම්කරුවන්ගේ අධ්‍යාපන සුදුසුකම් සහ වාචික පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනීම කරනු ලැබේ.

05. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. පත්වීම වසර 03 ක පරිවාස කාලයට යටත් වේ.

(ii) මෙම බඳවා ගැනීමේ කොන්දේසි වලට අමතරව වයඹ ගරු ආණ්ඩුකාරතුමා අනුමත කර ඇති සේවා ව්‍යවස්ථාවේ කොන්දේසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, රජයේ දෙපාර්තමේන්තු නියෝග වලටද වයඹ පළාත් සභාව හෝ වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට එකඟ විය යුතුය.

06. *අයදුම්පත් ඉදිරිපත් කිරීම :*

(i) අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත ප්‍රකාරව පිළියෙල කර ගන්නා ලද අයදුම්පත 2017.11.29 දිනට හෝ ඊට පෙර "ලේකම්, ප්‍රාදේශීය සභාව, ආරච්චිකට්ටුව" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය.

(ii) අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම්කරන තනතුර සඳහන් කළ යුතුය.

(iii) අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතිකවල අනු පිටපත් අමුණා එවිය යුතුය :

1. උප්පැන්න සහතිකය,
2. අධ්‍යාපන සහතිකය,
3. පාසලෙන් අස්වීමේ සහතිකය,
4. පදිංචිය සහතික කිරීම සඳහා ග්‍රාම නිලධාරී සහතිකය (ප්‍රාදේශීය ලේකම් සහතික කර තිබිය යුතුය.),
5. පොලිස් සහතිකය,
6. මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක්,
7. වෘත්තීය පළපුරුද්ද පිළිබඳ සහතික.

මෙම අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරේ දී හෝ මෙම බඳවා ගැනීම හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ නිවේදනය අවලංගු කිරීමේ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

ඒ. එෆ්. පී. ප්‍රනාන්දු
ලේකම්,
ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාව,
ආරච්චිකට්ටුව.

ආරච්චිකට්ටුව,
ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

*ශිල්පීය නොවන/අර්ධ ශිල්පීය III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීම - ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාව - 2017*

*....................................................................................... තනතුර සඳහා අයදුම්පත්‍රය*

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :——————————————.
2. මුලකුරු සමග නම:——————————————.
3. ස්ථිර ලිපිනය :——————————————.
4. ග්‍රාම නිලධාරී වසම හා අංකය :——————————————.
5. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :——————————————.
6. පදිංචි දිස්ත්‍රික්කය :——————————————.
7. උපන් දිනය :
අවුරුද්ද:.............................. මාසය:........................... දිනය:............................

8. ඉල්ලුම්පත්‍ර භාරගන්නා දිනට වයස :
   අවුරුදු:................................... මාස:.............................. දින:..............................

9. ස්ත්‍රී/පුරුෂ භාවය:——————————————.
10. ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින් ද, ලියාපදිංචියෙන් ද, යන වග :——————————————.
11. විවාහක/අවිවාහක බව :——————————————.
12. ජාතික හැඳුනුම්පත් අංකය :——————————————.
13. අධ්‍යාපන සුදුසුකම් (අ.පො.ස. සාමාන්‍ය පෙළ) :

වර්ෂය :- ........................... විභාග අංකය :-...........................

| *අනු අංකය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |
| 6. | | |
| 7. | | |
| 8. | | |

14. වෘත්තීය හා වෙනත් සුදුසුකම් :——————————————.
15. සේවා පළපුරුද්ද
    (i) දැනට සේවය කරන ආයතනයේ නම හා ලිපිනය:——————————————.
    (ii) දැනට දරන තනතුර හා ශ්‍රේණිය :——————————————.
    (iii) එම තනතුරට / ශ්‍රේණියට පත් වූ දිනය :——————————————.
    (iv) මීට පෙර සේවය කරන ලද ස්ථානය හා දරන ලද තනතුර:——————————————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීමේ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව මම දනිමි.

——————————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————————.

*දැනටමත් සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන ........................................................................ මයා./මිය./මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ ........................................................... වශයෙන් සේවය කරයි. ඔහු/ඇය විසින් ඉහතින් දක්වා ඇති තොරතුරු නිවැරදි බවත්, ඔහු/ඇය තෝරාගනු ලැබුවහොත් සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත්, ඔහු/ඇය කුමන ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට භාජනය වී නොමැති බවත් මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි/නොකරමි.

——————————————.
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ
හෝ බලයලත් නිලධාරියාගේ අත්සන.

නම :——————————————.
පදවි නාමය :——————————————.
දෙපාර්තමේන්තුව/ආයතනය (නිල මුද්‍රාව තබන්න) :——————————————.
දිනය :——————————————.

## අකුරැස්ස ප්‍රාදේශීය සභාව

අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *මාසික වැටුප් පරිමාණය* | *අවම අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද* | *පොදු සුදුසුකම්* |
|---|---|---|---|---|
| වැඩ/ක්ෂේත්‍ර කම්කරු | 02 | රා.ප.ච. 3/2016 අනුව PL1 - 2016 වැටුප් කාණ්ඩයෙහි 2017 වර්ෂයට අදාළ ආරම්භක පියවර | 8 වන ශ්‍රේණිය (09 වසර) සමත්ව තිබීම. | ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් විය යුතුය. විශිෂ්ට චරිතයකින් යුක්තවිය යුතුය. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර 03 ක් දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.<br><br>පදිංචි වසමේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද සහතිකය මත අදළ ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර, නිකුත් කරන ලද ලියවිල්ලකින් පදිංචිය සනාථ කළ යුතුය.<br><br>තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/*ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.<br><br>සෑම අපේක්ෂකයකුම දකුණු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය. |

*වෙනත් :*

1. අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ දැනට ස්ථිර/අනියම්/ආදේශක/තාවකාලික/කොන්ත්‍රාත් පදනම මත සේවය කරන සේවකයින් සඳහා සහ සභා බල ප්‍රදේශයේ පදිංචිකරුවන්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.
2. ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතුය. (දැනට ස්ථිර සේවයේ නියුක්ත අයට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.)
3. අයදුම්කරු දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියක වරදකරුවෙකු කරනු ලැබුවෙකු හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතුය.
4. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

*බඳවා ගැනීමේ ක්‍රමය :*

1. සම්මුඛ පරීක්ෂණයකින් පසුව තෝරා ගනු ලැබේ;
2. නියමිත සුදුසුකම් සපුරා ඇති අය පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

*සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

1. මෙම තනතුර ස්ථිරය;
2. මෙම තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය, රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් වේ;
3. පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වන අතර, වසර තුන (03) අවසානයේ වැඩ, පැමිණීම හා හැසිරීම යහපත් තත්වයේ සිටින සේවකයින්ට පමණක් ස්ථිර පත්වීම් ප්‍රදානය කරනු ලැබේ;

4. මෙම බඳවා ගැනීම ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද දෙපාර්තමේන්තු නියෝග වලට ද, රජයේ හෝ දකුණු පළාත් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝග වලට ද අනුකූලව ක්‍රියා කිරීමට සියලුම සේවකයින් බැඳී සිටිය යුතුය.

*ඉල්ලුම් කරන ආකාරය :*

අයදුම්කරු මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කරන ලද අයදුම්පත් 2017.11.27 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "ලේකම්, අකුරැස්ස ප්‍රාදේශීය සභාව, අකුරැස්ස" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර, නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල පිටපත් ඇමිණිය යුතු අතර, මුල් පිටපත සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

1. උප්පැන්න සහතිකය ;
2. අධ්‍යාපන සහතිකය ;
3. පදිංචිය සහතික කිරීම පිණිස මෑතකදී ලබා ගත් ග්‍රාම නිලධාරි සහතිකය (ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කර තිබිය යුතුය.) ;
4. මෑතකදී ලබා ගත් චරිත සහතිකර 02 ක් ;
5. පළපුරුද්ද පිළිබඳ සහතික ;
6. අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් සේවා සහතිකයක්.

එම්. ඒ. ගාමිණී ජයරත්න,
ලේකම්,
අකුරැස්ස ප්‍රාදේශීය සභාව.

2017 ක් වූ ඔක්තෝබර් මස 11 වැනි දින,
අකුරැස්ස ප්‍රාදේශීය සභාව, අකුරැස්ස.

වැඩ ක්ෂේත්‍ර කම්කරු තනතුර සඳහා අයදුම්පත

1. අයදුම්කරුගේ නම (මුලකුරු සමග නම) :- ....................................................
2. මුලකුරු වලින් හැඳින්වෙන නම් :- ....................................................
3. ස්ථිර පදිංචි ලිපිනය :- ....................................................
4. දුරකතන අංකය :- ....................................................
5. දිස්ත්‍රික්කය :- ....................................................
6. උපන් දිනය :- වර්ෂය :.......... මාසය :............ දිනය :.......
7. ජාතික හැඳුනුම්පත් අංකය :-....................................................
8. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :- අවුරුදු :.......... මාස :.............. දින :.......
9. ස්ත්‍රී/ පුරුෂ භාවය :- ....................................................
10. විවාහක/ අවිවාහක බව :- ....................................................
11. ජාතිය :- ....................................................
12. ශ්‍රී ලංකා පුරවැසියෙක් ද යන වග (එසේ නම් පරම්පරාවෙන් ද/ලියාපදිංචි වීමෙන් ද?) :....................................................
13. අධ්‍යාපන සුදුසුකම් :

| *විෂය* | *සාමාර්ථය* | *විෂය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 1. | | 5. | |
| 2. | | 6. | |
| 3. | | 7. | |
| 4. | | 8. | |

14. පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම් :- ....................................................
15. සාපරාධී වරදක් සම්බන්ධයෙන් අධිකරණයක වරදකරුවෙකු වී ඇද්ද :- ....................................................

16. ඔබ දැනටමත් අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම්,
- දැනට දරන තනතුර :- ......................................................
- එම තනතුරට පත් වූ දිනය :- ..................................................
- එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත ද) :- ................................................

මම අයදුම්පතේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත්, නිවැරදි වූත්, ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත්, මා නුසුදුස්සෙකු වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත්, කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් දන්වමි.

දිනය :...............................

.........................................,
අයදුම්කරුගේ අත්සන.

දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය.

මෙම ඉල්ලුම්කරු වන ........................................................................... මහතා/මහත්මිය/මෙනවිය දැනට මෙම කාර්යාලයේ .............. .................................................................. වශයෙන් සේවය කරයි. අයදුම්පත නිර්දේශ කර/නිර්දේශ නොකර ඉදිරිපත් කරමි.

දිනය :..........................................

....................................................,
ආයතන ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව)

11-207.

---

**සීතාවකපුර නගර සභාව - අවිස්සාවේල්ල**

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු

බස්නාහිර පළාතේ, පළාත් රාජ්‍ය සේවයේ සීතාවකපුර නගර සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට අදාළ අවම සුදුසුකම් සපුරාලන බස්නාහිර පළාත තුළ පදිංචි ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. නිවේදනයේ අවසානයේ ඇති ආදර්ශ ඉල්ලුම්පත්‍රය ප්‍රකාරව සකස් කරගත් ඉල්ලුම්පත්‍ර (12"x8" ප්‍රමාණයේ) "ලේකම්, සීතාවකපුර නගර සභාව, අවිස්සාවේල්ල" යන ලිපිනයට 2017.11.23 වැනි දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු හෝ අතින් ගෙනවිත් භාර දිය යුතුය. ඉල්ලුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදළ තනතුර සඳහන් කර එවිය යුතුය. අසම්පූර්ණ ඉල්ලුම්පත් මෙන්ම නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *මාසික වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01. | පුස්තකාල සහායක | 01 | රු. 24250-10x250-10x270-10x300-12x330- රු. 36410/= PL-1-2016 (රා.ප.ච. අංක 03/2016 හි උපලේඛන II හි විධිවිධාන අනුව වැටුප් ගෙවනු ලැබේ.) | අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් 06 ක් සමත් වී තිබීම. (මින් විෂයන් පහ (05) ක් එකවර සමත්විය යුතුය.) |
| 02. | කාර්යාල කාර්ය සහායක | 01 | රු. 24250-10x250-10x270-10x300-12x330- රු. 36410/= PL-1-2016 (රා.ප.ච. අංක 03/2016 හි උපලේඛන II හි විධිවිධාන අනුව වැටුප් ගෙවනු ලැබේ.) | අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් 06 ක් සමත් වී තිබීම. (මින් විෂයන් පහ (05) ක් එකවර සමත්විය යුතුය.) |
| 03 | වැඩ/ ක්ෂේත්‍ර කම්කරු | 01 | රු. 24250-10x250-10x270-10x300-12x330- රු. 36410/= PL-1-2016 (රා.ප.ච. අංක 03/2016 හි උපලේඛන II හි විධිවිධාන අනුව වැටුප් ගෙවනු ලැබේ.) | 8 වැනි ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබිය යුතුය. |

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *මාසික වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 04 | සෞඛ්‍ය කම්කරු | 01 | රු. 24,250-10x250-10x270-10x300-12x330-රු. 36,410/= PL-1-2016 (රා.ප.ච. අංක 03/2016 හි උපලේඛන II හි විධිවිධාන අනුව වැටුප් ගෙවනු ලැබේ.) | 8 වැනි ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබිය යුතුය. |

03. *වයස් සීමාව* :

(I) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

04. *බඳවා ගැනීමේ ක්‍රමය :-*

පහත I, II, III, හි සඳහන් සියලුම බඳවා ගැනීම් රා. ප. චක්‍රලේඛ අංක 24/95 අනුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සිදු කරනු ලැබේ.

(I) *පුස්තකාල සහායක තනතුර* :

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| බඳවා ගැනීමේ දී අවශ්‍ය මූලික අධ්‍යාපන සුදුසුකම් වලට අමතරව ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් | 20 | 50% |
| කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| පෞරුෂත්වය | 05 | |

(II) *කාර්යාල කාර්ය සහායක තනතුර* :

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| බඳවා ගැනීමේ දී අවශ්‍ය මූලික අධ්‍යාපන සුදුසුකම් වලට අමතරව ලබා දී ඇති අධ්‍යාපන සුදුසුකම් | 20 | 50% |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| පෞරුෂත්වය | 05 | |

(III) *වැඩ/ක්ෂේත්‍ර තනතුර සහ සෞඛ්‍ය කම්කරු තනතුර :*

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| පළාත් පාලන ආයතනයක අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත සේවය කර ඇති සේවා කාලය (වසරකට ලකුණු 05 බැගින්) | 15 | 50% |
| තනතුරට අදළව ලබා ඇති පළපුරුද්ද පිළිබඳ වෙනත් සහතික | 05 | |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| පෞරුෂත්වය | 05 | |

05. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

(I) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

(II) වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(III) තෝරාගනු ලබන්නන් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වේ. එම කාලය තුළ දී වැඩ පැමිණීම හා හැසිරීම සතුටුදායක වේනම් පරිවාස කාලය අවසානයේ දී සේවය ස්ථිර කරනු ලබයි.

(IV) ආයතන සංග්‍රහයේ කොන්දේසිවලට ද, බස්නාහිර පළාත් සභා මුදල් රෙගුලාසිවලට ද, ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝගවලටද, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින්වර පනවනු ලබන වෙනත් නියෝගවලට ද, පළාත් පාලන කොමසාරිස් සහ පළාත් පාලන ආයතන ප්‍රධානියාගේ නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට සියලුම සේවකයින් බැඳී සිටිය යුතුය.

06. *පොදු සුදුසුකම්* :

(I) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

(II) තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

(III) ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වූ වසර 03 ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

(IV) යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.

(V) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවන 2017.11.23 දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

07. *කොන්දේසි :*

(I) අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම සීතාවකපුර නගර සභාවේ ලේකම් සතුය.

08. අයදුම්කරුවන් පහත දැක්වෙන ලිපි ලේඛනවල සහතික කළ පිටපත් ස්වකීය ඉල්ලුම්පත්‍රයට අමුණා එවිය යුතුය.

(I) උප්පැන්න සහතිකය

(II) ජාතික හැඳුනුම්පතේ පිටපත/ගමන් බලපත්‍රයේ පිටපත

(III) මෑතක දී (මාස 06 ක් තුළ) ලබා ගත් චරිත සහතික 02 ක්

(IV) පදිංචිය සනාථ කිරීම සඳහා මෑතක දී (මාස 06 ක් තුළ දී) ප්‍රාදේශීය ලේකම්වරයාගේ අත්සන සහිත ග්‍රාම සේවා සහතිකය

(V) අධ්‍යාපන සහතික සහ වෘත්තීය සහතික

(VI) පළපුරුද්ද පිළිබඳ සහතික

බී. ධර්මනී විජේරත්න,
ලේකම්,
සීතාවකපුර නගර සභාව,
අවිස්සාවේල්ල.

2017 ඔක්තෝබර් මස 19 වැනි දින,
සීතාවකපුර නගර සභාවේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

*සීතාවකපුර නගර සභාව - අවිස්සාවේල්ල*

*බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ............................................................................. තනතුර සඳහා බඳවා ගැනීම*

1. මුලකුරු සමග නම :________________________________.

මුලකුරුවලින් හැඳින්වෙන නම් :________________________________

2. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :____________________________.

3. ස්ථිර ලිපිනය :________________________________.

4. ජාතික හැඳුනුම්පත් අංකය :________________________________.

5. ස්ත්‍රී පුරුෂ භාවය :______________________________.

6. විවාහක / අවිවාහක බව :______________________________.

7. උපන් දිනය :______________________.

2017.11.23 දිනට වයස :

අවුරුදු :____________ මාස :_______________ දින :_____________

8. ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින් ද ? ලියාපදිංචි වීමෙන් ද ? :_____________

9. අධ්‍යාපන සුදුසුකම් (සමත් වූ විභාගය පිළිබඳ විස්තර) :

(I) සමත් වූ වසර/ශ්‍රේණිය :_____________.

(II) අ.පො.ස (සා.පෙළ) විභාගය :

විභාග වර්ෂය හා මාසය :___________.

විභාග අංකය :_______________.

සමත් වූ විෂයයන් :

| විෂයය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

විභාග වර්ෂය හා මාසය :___________.

විභාග අංකය :_______________.

සමත් වූ විෂයයන් :

| විෂයය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

10. වෘත්තීමය සුදුසුකම් (සහතික මගින් සනාථ කළ යුතුයි.) :_______________.

11. ඔබ ඉල්ලුම් කරන තනතුරේ සේවා පළපුරුද්ද (සහතිකයක් මගින් සනාථ කළ යුතුයි.) :____________.

12. සේවා පළපුරුද්ද :_____________.

(I) දැනට සේවය කරන ආයතනය :_____________.

(II) දැනට දරන තනතුර :_____________.

(III) එම තනතුරට පත් වූ දිනය :_____________.

(IV) මීට පෙර සේවය කරන ලද ස්ථාන තිබේ නම් එම ස්ථාන හා දරන ලද තනතුරු :_____________.

13. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද ?:_____________.

14. මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දන්වා ඇති බවට ඔප්පු වුවහොත් පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

දිනය :_____________

____________________

අයදුම්කරුගේ අත්සන.

11-277

# පළාත් පාලන නිවේදන

## නොච්චියාගම ප්‍රාදේශීය සභාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (අ) ඡේදය සමඟ කියවිය යුතු, 261 වන අධිකාරය වූ 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර උතුරු මැද පළාතේ, පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 මාර්තු මස 30 වැනි දිනැති අංක 1960/35 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ IV (අ) වන කොටසේ අති විශේෂ *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද්ද වූ ද, උතුරු මැද පළාතේ පළාත් සභාව අනුමත කරන ලද බව 2017 ජුනි මස 09 වැනි දිනැති අංක 2022/32 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ IV (අ) වන කොටස අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද නිවේදනයෙන් ප්‍රකාශයට පත්කරන ලද්ද වූ ද, උතුරු මැද පළාතේ ප්‍රදේශීය සභා සම්මත අතුරු ව්‍යස්ථා, 2017 අගෝස්තු මස 01 වැනි දින සිට පිළිගෙන ක්‍රියාත්මක කිරීමටත්, ඒ දිනය වන විටත් ක්‍රියාත්මකව පැවති 1988 අගෝස්තු මස 23 වැනි දිනැති අංක 520/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ IV (අ) වන කොටස අති විශේෂ *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ප්‍රාදේශීය සභා සම්මත අතුරු ව්‍යවස්ථාවල, ඉහත කී උතුරු මැද පළාතේ ප්‍රාදේශීය සභා සම්මත අතුරු ව්‍යවස්ථාවලට සමාන වූ සම්මත අතුරු ව්‍යවස්ථා, එදින දක්වා කරන ලද කාර්යයටන්ට බලපෑමක් නොවන සේ එදින සිට ක්‍රියාත්මක වීම නතර විය යුතු බවත්, ඉහත කී පළාත් පාලන (ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) වන වගන්තිය යටතේ සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උප වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර නොච්චියාගම ප්‍රාදේශීය සභාවේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම පැවරී ඇති එකී ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා වශයෙන් මම මෙයින් නිවේදනය කරමි.

බී.එච්. සිරියලතා,
ලේකම් හා බලතල, කාර්ය,
කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිළධාරී,
නොච්චියාගම ප්‍රාදේශීය සභාව,

2017 අගෝස්තු මස 15 වැනි දින,
නොච්චියාගම ප්‍රාදේශීය සභාව,
නොච්චියාගම.

11-120

---

## යටිනුවර ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් යටිනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වලින් කොටසක් වශයෙන් ප්‍රකාශයට පත්කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ, මංමාවත් අදළ ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශ්වයන් හෝ යම් විරුද්ධත්වයක් පළකරනු ලබන්නේ නම්, මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට එක් මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරන ලෙසට දැනුම් දෙනු ලැබේ.

මෙම කාලසීමාව තුළ මෙම නිවේදනය පිළිබඳව යම් විරුද්ධතාවක් ඉදිරිපත් නොවුනහොත් උපලේඛනයේ සඳහන් මංමාවත්, යටිනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව පොදු ජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ඩබ්ලිව්. ඒ. එල්. තුෂාරි ජයරත්න,
ලේකම්,
යටිනුවර ප්‍රාදේශීය සභාව.

යටිනුවර ප්‍රාදේශීය සභාව
ඇඹිල්මීගම,
පිළිමතලාව.

| අනු. අංකය | මාර්ගයේ නම | ග්‍රාම නිලධාරි වසම | පටන්ගන්නා ස්ථානය | අවසන් වන ස්ථානය | වම් පැත්ත | දකුණ පැත්ත | දිග | පළල | පිඹුරු පත් අංකය |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | හප්පිටිය හිටිනෑගෙදර වත්ත පාර | කොටලිගොඩ දකුණ | දිප්පිටිගොඩ මාර්ගය | හිටිනෑ ගෙදර වත්ත | ඩබ්.ජී. අබේරත්න ඩබ්.ජී. අබේරත්න ඩබ්.ජී. අබේසිංහ ඩබ්.ජී. තිලකරත්න කේ.ජී. සුනිල් ජයරත්න | ඩබ්.ජී. අබේරත්න ඩබ්.ජී. අබේරත්න ඩබ්.ජී. අබේසිංහ ඩබ්.ජී. තිලකරත්න කේ.ජී. සුනිල් ජයරත්න | මීටර් 381.00 | මීටර් 2.43 | 8396 |
| 02 | දඹහිටියාව මාර්ගය | ඒදඬුවාව (බටහිර) | එස් පී යූ ආනන්ද මයාගේ ඉඩම | එස් ඩී රත්නායක මයාගේ ඉඩම කෙළවර | එස් ඩී යූ ආනන්ද පී මාකන්දවල පී එච් ශීලා සෙනවිරත්න එස් ඩී රත්නායක | ඩී එම් ඒ දිසානායක එච් යූ සේනාරත්න පී ගුණතිලක ඒ පී ඒ චන්ද්‍රවංශ ආර් විජේසුන්දර | මීටර් 90.00 | මීටර් 03.00 | 3759 |

11-217

---

## හපුතලේ නගර සභාව

### වරිපනම් බදු පැනවීම - 2018 වර්ෂය

හපුතලේ නගර සභාවේ ලේකම් වන මා විසින්, 2007 වර්ෂයේ කළ තක්සේරුව පිළිගෙන බලාත්මක කිරීමෙන් පසු, 2017.10.06 වැනි දින පහත දැක්වෙන යෝජනාවන් සඳහා අනුමැතිය ලබාදෙන බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

255 වැනි අධිකාරය වන නගර සභා ආඥාපනතේ 160 හා 166 වගන්ති ප්‍රකාරව, හපුතලේ නගර සභාව විසින් කරනු ලැබිය හැකි විශේෂ කොන්දේසි යටතේ, නිදහස් කිරීම් වලට යටත්ව හපුතලේ නගර සභා බල ප්‍රදේශයේ පිහිටි,

01. සියලුම නිවාස සහ මුඩු ඉඩම් වලින් වාර්ෂික තක්සේරු වටිනාකමින් සියයට පහක (5%) වරිපනම් බද්දක් ද,

02. නිවාස සහ මුඩු ඉඩම් නොවන අනෙකුත් සියලු දේපළ වලින් වාර්ෂික තක්සේරු වටිනාකමින් සියයට දහයක (10%) වරිපනම් බද්දක් ද,

03. නගර සභා සීමාවේ පිහිටි ඉඩම් හා රාජ්‍ය සහ සංස්ථා සතු දේපළ වලින් වාර්ෂික තක්සේරු වටිනාකමින් සියයට දහ හතරක (14%) වරිපනම් බද්දක් ද, 2018 වර්ෂය සඳහා අය කරනු ලැබේ.

04. නගර සභා ආඥාපනතේ 160(5) වගන්තිය ප්‍රකාරව 2018.01.31 දින ප.ව. 3.00 ට ප්‍රථම, වර්ෂයට අදාළ මුළු වරිපනම් බදු මුදල ගෙවීමෙන් සියයට දහයක (10%) වට්ටමක් ලබා දෙනු ලබන බව මෙයින් දන්වමි.

(දම්මිකා බණ්ඩාර)
නාගරික ලේකම් (වැ.බ.),
නගර සභාව,
හපුතලේ.

11-29

## කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ
24 (1) ආ වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර දකුණු පළාතේ පළාත් සභාවේ මාතර දිස්ත්‍රික්කයේ කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව විසින් මෙකී පහත උපලේඛණයේ දක්වා ඇති මංමාවත් කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ පිළිබඳව පොදු ජනතාව විසින් හෝ මංමාවත්වලට අදළ ඉඩම් වල අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශවයන් විසින් හෝ යම් විරුද්ධත්වයක් පළ කරනු ලබන්නේ නම්, මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පල වූ දින සිට එක් මසක් ඇතුලත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරන ලෙසට දන්වන අතර, ඉදිරියේදී මෙම මාර්ගවලට අයත් ඉඩම් වලින් අදල බිම් ප්‍රමාණය අත්පත් කර ගැනීමට කටයුතු යොදන බවද මෙයින් දනුම් දෙනු ලැබේ.

මෙම කාල සීමාව තුළ යම් විරුද්ධත්වයක් නොවුවහොත් උපලේඛනයේ සඳහන් මංමාවත් කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බැව් පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ලේකම්,
කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව

කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව මාර්ග ලියාපදිංචි කිරීම.

| *පාරේ නම* | *ග්‍රාම නිලධාරී වසම* | *දෙපස ඇති ඉඩම්* | | *ආරම්භය* | *අවසානය* | *දුර* | *පළල* |
|---|---|---|---|---|---|---|---|
| | | *වම* | *දකුණ* | | | *මීටර්* | *(අඩි)* |
| ලියනගෙ වත්ත අභ්‍යන්තර මාර්ගය | 330 B මඟමුරේ | ධනසිරි යන අයට අයත් ලියනගෙවත්ත 4B කැබැල්ල K. චන්ද්‍රසිරිට අයත් අංක 5 දරන කැබැල්ල K.සෝමරත්න යන අයට අයත් අංක 02 දරන කැබැල්ල සරත් විජේසිංහ යන අයට අයත් අංක 03 කැබැල්ල | H.M. සිරිපාල යන අයට අයත් අංක 07 දරන ලියනගෙවත්ත ඉඩම M.H. ගංගා ප්‍රසාද් ගේ 04 A දරන කැබැල්ල විජේසිංහ යන අයට අයත් කැබැල්ල H.M. දිල්රුක්ෂි නිලංග යන අයට අයත් ඉඩම | දමිත මාර්ග යේ සල්ගස අසලින් වම් පසට | සරත් විජේසිංහ යන අයට අයත් ඉඩම | 60 | 12 |
| මල් මාවත | සීලැල්ගම 318 B | කුඹුරු ඉඩම පුහුල්හේන ඉඩම | හෙරිටේජ් පාර්ක් ඉඩමේ බිම් කොටස් 68 පමණ ලිංවලහේන ඉඩමේ බිම් කොටස් 18 පමණ | කඹුරුපිටිය බිබුලවෙල ප්‍රධාන මාර්ගය | ලිංවලහේන දෙනිය | 1,500 | 20 |

11 - 30

## වත්තල මාබෝල නගර සභාව

ගෝසාතක ආඥාපනත (272 වැනි අධිකාරිය)

මෙහි පහත දක්වෙන උපලේඛනයේ නම සඳහන් වන පුද්ගලයින් විසින් ඔවුන්ගේ නම්වලට ඉදිරියෙන් සඳහන් කර ඇති ස්ථානයෙහි 2018.01.01 වැනි දින සිට 2018.12.31 වන දින දක්වා ගව ඝාතකාගාරයක් පවත්වාගෙන යෑම සඳහා බලපත්‍රයක් ලබා ගැනීමට ඉල්ලුම්කර ඇති බැවින් ඒ සම්බන්ධයෙන් වත්තල නගර සභා බල ප්‍රදේශය තුළ පදිංචි යම් අයෙකු විරුද්ධ වන්නේ නම්, තමා විරුද්ධත්වය දැක්වීමට හේතු විස්තර සහිතව පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මගින්, දැන්වීම් *ගැසට් පත්‍රයේ* පළවූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ලියාපදිංචි තැපෑලෙන් ලැබෙන්නට සැලැස්විය යුතු බවට ගෝසාතක ආඥපනතේ (272 වැනි අධිකාරය) අංක 7(2) වැනි වගන්තිය පරිදි මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩී. පී. එච්. සමරවික්‍රම,
නගර සභාවේ ලේකම් හා වත්තල
මාබෝල නගර සභාවේ බලතල,
කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී

2017 ඔක්තෝබර් මස 20 වැනි දින,
වත්තල මාබෝල නගර සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *අනු. අංකය* | *ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය* | *ව්‍යාපාර* | *ව්‍යාපාරය පවත්වන ස්ථානයේ ලිපිනය* |
|---|---|---|---|
| 01 | සේගුඩාවිඩ් නජුමුඩීන්, නො. 752/3, මීගමු පාර, මාබෝල, වත්තල | ගව/එළු | අංක. 41/12, දෙල්ගහවත්ත, දූවවත්ත, මාබෝල, වත්තල. |

11-315

---

## කුරුවිට ප්‍රාදේශීය සභාව

2018 වර්ෂය සඳහා එළහරක් මස් හා එළු හා කුකුල් මස් වෙළෙඳාම කරගෙන යාම සඳහා බලපත්‍ර නිකුත් කිරීම

මෙහි පහත සඳහන් උපලේඛනයේ සඳහන් අය විසින් පහත සඳහන් ස්ථානයන්හි එළහරක් මස්, එළු මස් හා කුකුල් මස් වෙළෙඳාම කරගෙන යාම සඳහා බලපත්‍ර ලබාගැනීමට ඉදිරිපත් වී සිටින බව ගෝසාතක ආඥාපනතේ (272 වැනි අධිකාරය) 7(2) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳව කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පදිංචි යම් අයෙකු විරුද්ධ නම් ඔහු හෝ ඇය විරුද්ධ වන්නේ කුමන කරුණක් නිසා ද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට දින 14ක් (දහහතරක්) ඇතුළත මා වෙත ඉදිරිපත් කළ යුතු බව මෙයින් දන්වමි.

මෙම කාල සීමාව තුළ මෙම නිවේදනය පිළිබඳ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුනහොත් මෙහි උපලේඛනයෙහි සඳහන් අංක 01 සිට 07 දක්වා ඉල්ලුම්කරුවන් වෙත අදාළ ව්‍යාපාර ස්ථානවල වෙළඳාම කරගෙන යාම සඳහා 2018.12.31 දක්වා බලපත්‍ර ලබාදීම කරන බව පොදු මහජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ලේකම්,
ප්‍රාදේශීය සභාව,
කුරුවිට.

2017 ඔක්තෝබර් මස 10 වැනි දින,
කුරුවිට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය,

| | *ඉල්ලුම්කරුගේ නම* | *වෙළඳාම කරන ස්ථානය* | *වෙළඳාමේ ස්වභාවය* |
|---|---|---|---|
| 1. | එම්. එච්. රවුෆ් මයා, තලාවිටියවත්ත, උඩහගම, ඇහැලියගොඩ. | කිරිඇල්ල පොදු වෙළඳසැල, ඉඩංගොඩ, කිරිඇල්ල. | එළහරක් මස් |
| 2. | එම්. කේ. එම්. එස්. නලීර් මයා, අංක 319 පනාවල පාර, ඇහැලියගොඩ. | අංක 14/1, බදුවත්ත හන්දිය, ඇහැලියගොඩ. | එළු හා කුකුළු මස් |

| | *ඉල්ලුම්කරුගේ නම* | *වෙළඳාම කරන ස්ථානය* | *වෙළඳාමේ ස්වභාවය* |
|---|---|---|---|
| 3. | එම්. කේ. එම්. එස්. නලීර් මයා,<br>අංක 319,<br>පනාවල පාර,<br>ඇහැලියගොඩ. | අංක 14/1,<br>බදුවත්ත හන්දිය,<br>ඇහැලියගොඩ. | එළහරක් මස් |
| 4. | ඒ. ඒ. එම්. නසාර් මයා,<br>මංකඩහේන,<br>අංක 494,<br>මලව, කුරුවිට. | වාණිජ සංකීර්ණය A<br>ගොඩනැගිල්ල,<br>කුරුවිට. | එළහරක් මස් |
| 5. | ඒ. ඒ. එම්. නසාර් මයා,<br>මංකඩහේන,<br>අංක 494, මලව,<br>කුරුවිට. | වාණිජ සංකීර්ණය A<br>ගොඩනැගිල්ල, කුරුවිට. | එළු හා කුකුළු මස් |
| 6. | එස්. එච්. අසංක එරන්ද කැන්දහේන,<br>ඉඩංගොඩ, කිරිඇල්ල. | කිරිඇල්ල පොදු වෙළඳසැල | මාළු/එළු හා කුකුළු මස් |
| 7. | කුරුවිට ධීවර සංස්ථාව | වාණිජ සංකීර්ණය A ගොඩනැගිල්ල | මාළු |

11-245/1

---

**කුරුවිට ප්‍රාදේශීය සභාව**

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳව ආඥාපනත (272 අධිකාරිය)

මෙහි පහත උපලේඛනයේ සඳහන් අය විසින් උපලේඛනයේ සඳහන් ස්ථානයන්හි 2018 වර්ෂයට ගෝඝාතකාගාරයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍ර ඉල්ලමින් අයදුම්පත් මා වෙත ඉදිරිපත් කර ඇති බවත් එම බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳ කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි හා ජීවත්වන අයවළුන් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇය එසේ විරුද්ධ වන්නේ කුමන හේතුවක් පදනම් කරගෙන ද යන්න පිළිබඳ විස්තර ලිඛිතව පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසේ පළවූද සිට දින 14ක් ඇතුළත මා වෙත දන්වා එවිය යුතු බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳව ආඥාපනත (272 වැනි අධිකාරිය 7(2) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ලේකම්,
ප්‍රාදේශීය සභාව,
කුරුවිට.

2017 ඔක්තෝබර් මස 10 වැනි දින,
කුරුවිට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| | *ඉල්ලුම්කරුවන්ගේ නම සහ ලිපිනය* | *ගෝඝාතකාගාරය පවත්වාගෙන යන ස්ථානය* |
|---|---|---|
| 01. | එම්. එච්. එම්. රවුෆ් මයා,<br>තලාවිටියවත්ත, උඩහගම,<br>ඇහැළියගොඩ. | තලාවිටියවත්ත, ඇහැළියගොඩ. |
| 02. | ඒ. ඒ. එම්. නසාර් මයා,<br>අංක් 494,<br>මලව, කුරුවිට. | මංකඩහේන, මලව, කුරුවිට. |

11-245/2

## හම්බන්තොට මහා නගර සභාව

2018 වර්ෂයේ වැඩසටහන් අයවැය ලේඛනය

හම්බන්තොට මහා නගර සභාවේ 2018 වර්ෂය සඳහා වූ වැඩසටහන් අයවැය ලේඛනය 2017 වර්ෂයේ නොවැම්බර් මස 04 දින සිට 2017 නොවැම්බර් මස 11 වන දින දක්වා (රජයේ නිවාඩු දින සහ ඉරිදු දින හැර) කාර්යාල වේලාව තුළ හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී මහජනතාවගේ පරීක්ෂාව පිණිස තබා ඇති බව 252 වන අධිකාරය වූ මහා නගර සභා ආඥාපනතේ 212 වන වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

කසුන් ඇපා සෙනෙවිරත්න,
නාගරික කොමසාරිස්,
මහා නගර සභාව,
හම්බන්තොට.

2018 ඔක්තෝබර් මස 24 වැනි දින,
හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

11-429

---

## රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 හා 24(2) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාරව සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මාර්ගය රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව සතු මාර්ගයක් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

දැනට ප්‍රාදේශීය සභාව විසින් මැන සළකුණු යොදා ඇති මෙම මාර්ගය සම්බන්ධයෙන් අදාල ඉඩම්වල අයිතිකරු ලෙස හිමිකම් පාන පාර්ශ්වයන් විසින් යම් විරුද්ධතාවයක් පළ කරනු ලබන්නේ නම් මෙම නිවේදනය නිකුත් කළ දින සිට එක් මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (2) වගන්තියේ ප්‍රකාරව ක්‍රියා කරන ලෙස දැනුම් දෙනු ලැබේ.

කේ.ජේ. හේමමාලා,
ලේකම්,
රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව.

2017 ඔක්තෝබර් මස 16 වැනි දින,
රුවන්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

| අනු. අංකය | ග්‍රාම නිළධාරි කොට්ඨාසය | මාර්ගයේ නම | මාර්ගයේ ආරම්භයේ සිට අවසානය දක්වා | පාරේ දිග | පාරේ පළල | වම්පස | දකුණුපස | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | ඉඩම් හිමියන්ගේ නම | ඉඩමේ නම |
| 01. | 99 ඩී කඩිගමුව | කිරිකැදවල හරහා කන්දඋඩ මාර්ගය | නෙල්ලිගස්තැන්න | මීටර් 283 | අඩි 10 | ඇළ | ඩී.පී. සෝමසිරි මයා | කිරිකැඳවලගාවා අස්සැද්දුම |
| | | | | | | | ඩී.බී.පී.එස්. වේරගොඩ මයා | අංකෙළිපිටිය කුඹුර |


PLAN No: 3782
Kandauda Road through Kirikendawala
Average width 3.05m(10feet)
Length 283m(928.5feet)
Extent 991.00sq.m,0.0991Ha,0A-0R-39.18P
L.C.K.Liyanage (F.S.I)
Registered Licensed Surveyor & Leveller
Court commissioner & Valuer
Bulathkohupitiya
Reg.No:19930155
Lot No: | Extent A R P | Hectares | claiment
1 | 0 0 7.86 | 019880 | D.P.Somasiri Imbulgoda Galapitamada
2 | 0 0 2.03 | 005156 | Shantha Weragoda Imbulgoda Galapitamada
Reference
LF Live Fence
BW Boundary Wall
U Undefined
St Stake
B Bank
EP Electric Post
Br Bridge
From the Main Road
To Narangastenna
From Narsangasgastenna
To the Main Road
From Narsangasgastenna
Ela
Scale 1:1000
PLAN
of
Kandauda Road through Kirikendawala
situated in the
Village of Imbulgoda
In Ruwanwella Divisional Secretariat's Division
(within Ruwanwella Pradesheeya Sabha limits)
(Dehigampal Korale)
Kegalle District
SABARAGAMUWA PROVINCE
Registered Licensed Surveyor
12-04-2017
L.C.K. Liyanage (F.S.I.)
Registered Licensed Surveyor
Court Commissioner & Valuer
Bulathkohupitiya
Reg.No. 19930155
Tel:035-5710253, 072-6245873
Note:
Boundaries pointed out by and to
K.A.D.P.T.Nanayakkara,T.O Ruwanwella
Pradesheeya Sabha and Villagers

**පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව**

සම්මත අතුරු ව්‍යවස්ථා

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා පනත

261 වැනි අධිකාරිය වන 1952 අංක 06 දරන පළාත් පාලන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09(03) උප වගන්තිය ප්‍රකාරව පහත සඳහන් තීරණය මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. ටී. සරත් වික්‍රමසිංහ,
ලේකම්,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව,
රඹුක්පිටිය.

2017 සැප්තැම්බර් මස 18 වැනි දින,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ දී ය.

**තීරණය**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියේ (අ) ඡේදය සමඟ කියවිය යුතු 261 වැනි අධිකාරිය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මතු අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වැනි වැගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මධ්‍යම පළාත් සභාවේ, පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මධ්‍යම පළාත්, පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2016.02.23 වැනි දින අංක 1955/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (අ) වැනි කොටසේ පළ කරනු ලැබූ හා මධ්‍යම පළාත් සභාව විසින් අනුමත කොට 2017.05.05 වැනි දින අංක 2017/42 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (අ) වැනි කොටසේ පළ කරනු ලැබූ නිවේදනයේ ප්‍රකාශයට පත් කරන ලද්ද වූ පහත සඳහන් කොට ඇති අතුරු ව්‍යවස්ථා :

1. පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ප්‍රාදේශීය සභා මං මාවත් වල ධාවනය කරනු ලබන වාහන වල බර හා වේගය පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව.
2. පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ප්‍රාදේශීය සභා සීමාව තුල ගොඩනැගිලි ඉදි කිරීම් සඳහා වූ සැලසුම් පරීක්ෂා කිරීම හා ගාස්තු අයකර ගැනීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව.
3. පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ සංචාරක වෙළඳාම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව.
4. පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ පොළ පිළිබඳ අතුරු ව්‍යවස්ථාව.
5. පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ මාළු විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව.
6. පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ සේවා සඳහා ගාස්තු අයකර ගැනීමේ ව්‍යවස්ථාව.

මෙම තීරණය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දිනයේ සිට ක්‍රියාත්මක කිරීමටත්, ඊට පෙර දින මධ්‍යම රාත්‍රී 12 සිට මීට පෙර ඉහතින් සඳහන් කරන්නට යෙදුන අතුරු ව්‍යවස්ථාව සම්බන්ධයෙන් පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල බලාත්මක වූ සියලුම අතුරු ව්‍යවස්ථා අවලංගු කිරීමටත් හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09(03) උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2017.09.18 වැනි දින සභාවේ තීරණ අංක 392:03 යටතේ මෙයින් තීරණය කරමි.

**පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ප්‍රාදේශීය සභා මංමාවත්වල ධාවනය කරනු ලබන වාහනවල බර හා වේගය පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

01 මෙම අතුරු ව්‍යවස්ථාව සෑදීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 (vii) (ඇ) වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට බලය ලැබී ඇත.

02. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රාදේශීය සභා මාර්ගයන්හි බර හා වේග සීමා නියම කිරීම හා එමගින් පාරකට හෝ මංමාවතකට ඇතිවිය හැකි හානි වැළැක්වීම හා අධික බර සහිත වාහන ගමනාගමනය පාලනය කිරීම සඳහා විධිවිධාන සැලසීම පිණිස මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලැබේ.

03. ප්‍රාදේශීය සභා මංමාවත්වල ධාවනය කරනු ලබන වාහනවල බර, වේගය පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

04. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රාදේශීය සභා මාර්ගයන්හි ප්‍රාදේශීය සභා විසින් කලින් කලට තීරණය කරනු ලබන මාර්ග යකට හෝ මාර්ගයේ කොටසක ධාවනය කළයුතු වාහනයකට උපරිම බර, වේගය සභාව විසින් කලින් කලට යෝජනා සම්මතයක් මගින් තීරණය කර ප්‍රකාශයට පත්කිරීම නීත්‍යානුකූල වන්නේය.

05. ඉහත 4 වැනි වගන්තිය යටතේ සභාව විසින් තීරණය කරනු ලබන ප්‍රාදේශීය සභා මාර්ගයක හෝ මාර්ගයක කොටසක ධාවනය කළයුතු වාහනයක් උපරිම බර, උපරිම වේගය සභාපතිවරයා විසින් අදාළ මාර්ගයෙහි හෝ මාර්ගයේ කොටසේ සීමාවන්හි හෝ එම මාර්ගයට හෝ මාර්ගයේ කොටසට සම්බන්ධ වන වෙනත් මාර්ගයන් සම්බන්ධ වන ස්ථානයන්හි ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීමක් මෙහි පහත උපලේඛනයේ සඳහන් කරනු ලබන ආකෘතියට අනුකූලව සකස් කර ප්‍රදර්ශනය කරනු ලැබිය යුත්තේය.

06. මෙහි ඉහත 5 වැනි වගන්තිය යටතේ ප්‍රදර්ශනය කරනු ලබන සෑම දැන්වීමක්ම මංමාවත් ආඥා පනතේ හා ගමනාගමන පනතේ විධිවිධානයන්ට අනුකූලව සකස් කර ප්‍රදර්ශනය කරනු ලැබිය යුත්තේ ය.

07. ඉහත 4 වැනි වගන්තිය යටතේ තීරණය කරනු ලබන සෑම තීරණයක් ම පහත කරුණු සැලකිල්ලට ගනිමින් තීරණය කළ යුත්තේ ය.

(අ) අදාළ මාර්ගයේ පළල,

(ආ) මාර්ග පෘෂ්ඨය ඉදිකර ඇති ද්‍රව්‍යවල ස්වභාවය හා ඝනකම,

(ඇ) මාර්ගයේ ආනත තලයේ බෑවුම් ස්වරූපය,

(ඈ) මාර්ගය ඉදිකර ඇති භූමියේ ස්වභාවය,

(ඉ) පාලම් සහ බෝක්කුවලට දැරිය හැකි බර ප්‍රමාණය,

(ඊ) ධාවනය වන වාහනවල ස්වභාවය.

08. ප්‍රාදේශීය සභා මාර්ගයක ප්‍රතිසංස්කරණ කටයුත්තක් හෝ වෙනත් යම් කටයුත්තක් හේතුකොටගෙන මාර්ගය හෝ මාර්ගයේ කොටසක් වසා තබන්නේ නම් සභාපතිවරයා විසින් එසේ වසා තැබීම පිළිබඳ දැන්වීමක් වසා තැබීමේ දිනට දින තුනකට පූර්වයේ සිට අදාළ මාර්ගයට හෝ මාර්ගයේ කොටසට සම්බන්ධ වන වෙනත් මාර්ගයන්හි ප්‍රවේශ වන ස්ථානයන්හි ප්‍රදර්ශනය කරනු ලැබිය යුත්තේ ය.

09. ප්‍රාදේශීය සභාව විසින් ප්‍රාදේශීය සභා මාර්ගයක බර හා වේගය සීමා තීරණය කර මෙම අතුරු ව්‍යවස්ථාවේ 5 වැනි වගන්තිය යටතේ දැන්වීමක් කර ඇති විටකදී සීමා කරන ලද බර හා වේගය ඉක්මවන පරිදි වාහන ධාවනය කිරීම කවර තැනැත්තෙකු විසින් හෝ නොකළ යුතු ය.

10. ප්‍රාදේශීය සභා මාර්ගයක මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බර, වේග සීමා තීරණය කර ඇති විටෙක එවැනි මාර්ගයකට හානි වන ආකාරයට කිසියම් ද්‍රව්‍යයක් ගෙනවිත් දැමීම හෝ බැහැර කිරීම හෝ එක්රැස් කරන ජලය එම මාර්ගයට මුදා හැරීමට කටයුතු කිරීම හෝ කවර තැනැත්තකු විසින් හෝ නොකළ යුතුය.

11. ප්‍රාදේශීය සභා මාර්ගයක මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බර, වේග සීමා තීරණය කර ඇති විටෙක එවැනි මාර්ගයකට පවත්වාගත යුතු වේගයට බාධාවන ආකාරයෙන් මාර්ගය දෙපස කවර තැනැත්තෙකු විසින් හෝ යම් ගසක් හෝ ගසක කොටසක් හෝ මාර්ගයට නෙරා ඒමට සැලැස්වීම නොකළ යුතු ය.

12. මෙම අතුරු ව්‍යවස්ථාවේ 4 වැනි වගන්තිය යටතේ බර, වේග සීමා කරන ලද ප්‍රාදේශීය සභා මාර්ගයක් හෝ මාර්ගයක කොටසක් නිරන්තරයෙන් ව්‍යාපාර කාර්යයන් වෙනුවෙන් උපරිම බර රැගෙන යාම සඳහා යම් තැනැත්තෙකු විසින් භාවිතයට ගනු ලබන්නේ නම් එවැනි තැනැත්තෙකු සමඟ ප්‍රාදේශීය සභාව ඇතිකර ගනු ලබන ගිවිසුමකට අනුව මාර්ගය හෝ මාර්ගයේ කොටසකට සිදු වන හානි පූර්ණයක් වශයෙන් සභාව විසින් තීරණය කරනු ලබන ප්‍රමාණයන් යටතේ මුදලක් සභාව විසින් අයකිරීම නීත්‍යානුකූල වන්නේ ය.

13. සභාපතිවරයා විසින් කිසියම් කාලසීමාවක් දක්වා අවස්ථානුගත කරුණු අනුව ප්‍රාදේශීය සභා මාර්ගයක් හෝ මාර්ගයක කොටසක් උපරිම බරක් රැගෙන යාම සීමා කිරීම සඳහා හෝ යම් මාර්ගයක හෝ මාර්ගයක කොටසක් වාහන ධාවනය සීමා කිරීම සඳහා හෝ එක් පසකට පමණක් ධාවනය කිරීම සඳහා හෝ එලෙස ධාවනයේදී පවත්වාගත යුතු උපරිම වේගය ඉහත 4 වැනි වගන්තිය යටතේ තීරණය කරන ලද වේගය තවදුරටත් සීමා කිරීම සඳහා නියමයක් කිරීම නීත්‍යානුකූල වනනේ ය.

14. මෙම අතුරු ව්‍යවස්ථාවල කවර හෝ විධිවිධානයක් කඩ කරන උල්ලංඝනය කිරීම වරදක් වන අතර, නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය හා එම කඩ කරීම හෝ උල්ලංඝනය නොකරවා තවදුරටත් කරගෙන යන විටෙක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසු හෝ උල්ලංඝනය ගැන අවධානය යොමු කරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාරදෙනු ලැබීමෙන් පසුව කඩකිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහාම නියම කළහැකි අතිරේඛ දණ්ඩනයේ උපරිමය පිළිවෙලින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය (2) උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතු ය.

15. මෙම අතුරු ව්‍යවස්ථාවේ 4 වැනි වගන්තිය යටතේ ධාවනය කරන වාහනයක උපරිම බර, වේගය තීරණය කරන ලද මාර්ග යක ධාවනය වන වාහනයක බර පරීක්ෂා කිරීම උදෙසා සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් නිසි හා යෝග්‍ය ක්‍රියාමාර්ගයන් ගැනීම නීත්‍යානුකූල වන්නේ ය.

16. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස

"සභාව" යන්නෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ සංස්ථාපනය කරන ලද පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවද,

"සභාපති" යන්නෙන් පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව සඳහා තෝරා පත්කර ගනු ලැබූ සභාපතිවරයාද,

"තැනැත්තෙකු" යන්නෙන් පුද්ගලයෙකු හෝ පුද්ගල මණ්ඩලයක් හෝ සංස්ථාගත ආයතනයක් ද,

"වාහනය" යන්නෙන් මෝටර් වාහන ආඥා පනත යටතේ දී ඇති අර්ථයම ද,

"බර" යන්නෙන් වාහනය සහ වාහනයට පිටතින් පටවන ලද ද්‍රව්‍යන්ද සහිතව ඇක්සලය මත යෙදෙන සම්පූර්ණ බර ද අදහස් වේ.

**උපලේඛනය**

උපරිම බර මෙට්‍රික්
ටොන් ...............

සභාපති
පස්බාගේ කෝරළේ
ප්‍රාදේශීය සභාව

උපරිම වේගය
පැ.කි.මී. .................

සභාපති
පස්බාගේ කෝරළේ
ප්‍රාදේශීය සභාව

11-249/1

## පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ප්‍රාදේශීය සභා සීමාව තුළ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා වූ සැලසුම් පරීක්ෂා කිරීම සහ ගාස්තු අයකිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

01. මෙම අතුරු ව්‍යවස්ථාව සෑදීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 (viii) වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට බලය ලැබී ඇත.

02. මෙම අතුරු ව්‍යවස්ථාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ නිවාස හා නගර සංවර්ධන ආඥා පනතෙහි විධිවිධාන අදළ වන බල ප්‍රදේශයන්හි ගොඩනැගිලි ඉදිකිරීම සඳහා සැලසුම් හා ගොඩනැගිලි ඉදිකිරීමට අදළ ඉඩම් කොටස් සඳහා වන සැලසුම් පරීක්ෂා කිරීම හා ඒ සම්බන්ධයෙන් ගාස්තු අය කිරීම සඳහා විධිවිධාන සැලසීම පිණිස පනවනු ලබයි.

03. මෙම අතුරු ව්‍යවස්ථාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ගොඩනැගිලි ඉදිකිරීම හා ඉඩම් කොටස් සඳහා වූ සැලසුම් පරීක්ෂා කිරීම පිළිබඳ වූ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

04. බල ප්‍රදේශය තුළ යම් ඉඩමක පොළව අභ්‍යන්තරයට හෝ පොළව මතුපිටට ඉදිකරනු ලබන සෑම ස්ථිර ඉදිකිරීමක්ම හා ඉදිකිරීමකට අදළවන සෑම ඉඩම් කොටසක්ම නිවාස හා නගර සංවර්ධන ආඥා පනතේ විධිවිධානයන්ට අනුකූලව සභාපති විසින් අනුමත කරන ලද සැලැස්මකට අනුකූල විය යුතු යි.

05. බල ප්‍රදේශය තුළ යම් ඉඩමක ගොඩනැගිලි ඉදිකිරීම සම්බන්ධයෙන් සැලසුම් හා ඉඩම් කොටසකට හෝ ඉඩම් අනුබෙදුමකට අදළ සැලැස්මක් අනුමත කරගැනීම සඳහා 1953 අංක 53 දරන සංශෝධිත පනතින් සංශෝධිත නිවාස හා නගර සංවර්ධන ආඥා පනතේ විධිවිධානයන් අනුව සකස් කරන ලද අයදුම්පත්‍රයක් යටතේ අයදුම් කළයුතු අතර, ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට සම්මත කරනු ලබන ගාස්තුවක් ගෙවා ප්‍රාදේශීය සභාව වෙතින් අදළ අයදුම්පත්‍රය ලබාගත යුතු ය.

06. 1953 අංක 53 දරන සංශෝධිත පනතින් සංශෝධිත නිවාස හා නගර සංවර්ධන ආඥා පනතට අනුකූලව ගොඩනැගිලි ඉදිකිරීම් සැලැස්මක් සඳහා වූ සෑම අයදුම්පත්‍රයක්ම එම ආඥා පනත යටතේ අනුමත කරන ලද ඉඩම් කොටස් සඳහාම විය යුතු ය.

07. ඉහත 6 වැනි වගන්තිය අනුව ඉදිරිපත් කරනු ලබන සෑම අයදුම්පත්‍රයකටම අදළ වූ සැලසුම් ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරන ලද සංයුතියකින් යුත් කමිටුවක් විසින් පරීක්ෂා කර බැලිය යුතු ය.

08. 7 වැනි වගන්තියෙහි සඳහන් කාර්යය සඳහා සභාව විසින් කලින් කලට යෝජනා සම්මුතියන් මගින් තීරණය කරනු ලබන ගාස්තුවක් අයකිරීම නීත්‍යානුකූල වන්නේ ය.

09. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ගොඩනැගිලි ඉදිකිරීම් හා ඉඩම් කොටසක් හෝ අනුබෙදුමක් සඳහා වන සැලසුම් පරීක්ෂා කිරීම, අදළ සැලැස්ම අනුමත කිරීම හා නගර සංවර්ධන ආඥා පනත හා ඒ යටතේ සාදන ලද රෙගුලාසි වලට අනුකූලව විය යුතු ය.

10. අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලබන සෑම සැලසුම් අයදුම්පත්‍රයක් සම්බන්ධයෙන්ම එය ප්‍රාදේශීය සභාව වෙත ලැබී දින 30 ක් ඇතුළත ඊට අදළ අනුමැතිය හෝ එය ප්‍රතික්ෂේප කරන්නේ නම් ඊට අදළ හේතු සහිත තීරණය අයදුම්කරු වෙත ලිඛිතව දැන්විය යුතු ය.

11. ඉහත 7 වැනි වගන්තියෙහි කමිටුවෙහි කාර්යය සඳහා ඊට අදළ සංයුතියෙහි සාමාජිකයන් වෙනුවෙන් අතිරේක පාරිශ්‍රමිකයක් සභාව විසින් තීරණය කරන ලදුව අදළ පළාතේ පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ඇතිව ගෙවීම නීත්‍යානුකූල වන්නේ ය.

12. මෙම අතුරු ව්‍යවස්ථාවේ 5 වැනි වගන්තිය යටතේ ඉදිරිපත් වන අයදුම්පත්‍රය, ඉදිකිරීම සඳහා අදළ ඉඩම් කොටස් අනුමත කරගැනීම සඳහා වන අයදුම්පත්‍රයක් වන විටදී අනුබෙදුමට අදළ වන සම්පූර්ණ ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 1 ක් හෝ ඊට වඩා වැඩි වන විටදී, හා එම ඉඩම ඉඩම් කොටස් අටක් හෝ ඊට වඩා වැඩි ප්‍රමාණයකට අනුබෙදුම් වන විටදී අනුබෙදුමට අදළ මාර්ග සඳහා වෙන්කර ඇති ප්‍රමාණය හැර ඉතිරි ප්‍රමාණයෙන් සියයට දහයක් වන ප්‍රමාණයන් අදළ ඉඩමේ පොදු පහසුකම් වශයෙන් ප්‍රාදේශීය සභාව වෙත තෑගි කර හිමිකර දිය යුතු ය.

13. මෙම අතුරු ව්‍යවස්ථාවල කවර හෝ විධිවිධානයක් කඩ කරන උල්ලංඝනය කිරීම වරදක් වන අතර, නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය හා එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොකරවා තවදුරටත් කරගෙන යන විටෙක ඒ පිළිබඳව වදකරු කිරීමෙන් පසු හෝ උල්ලංඝනය ගැන අවධානය යොමු කරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාරදෙනු ලැබීමෙන් පසුව කඩකිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහාම නියම කළහැකි අතිරේඛ දණ්ඩනයේ උපරිමය පිළිවෙලින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය (2) උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතු ය.

16. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස –

"සභාව" යන්නෙන් පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව ද,

"සභාපති" යන්නෙන් පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද,

"තැනැත්තා" යන්නෙන් යම් පුද්ගලයෙකු හෝ සංස්ථාගත පුද්ගල මණ්ඩලයක් ද අදහස් වේ.

11-249/2

---

## පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ සංචාරක වෙළඳාම සම්බන්ධ අතුරු ව්‍යවස්ථාව

01. මෙම අතුරු ව්‍යවස්ථාව සෑදීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 (x) වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට බලය ලැබී ඇත.

02. පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සංචාරක වෙළෙඳාම විධිමත් කිරීම, අධීක්‍ෂණය කිරීම/පරීක්ෂා කිරීම හා පාලනය කිරීම සඳහා මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලැබේ.

03. මෙම අතුරු ව්‍යවස්ථාව 'පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සංචාරක වෙළඳාම සම්බන්ධ අතුරු ව්‍යවස්ථාව' යනුවෙන් හැඳින් වේ.

04. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ පස්බාගේ කොරළේ ප්‍රාදේශීය සභාවේ, සභාපතිවරයා විසින් තත් කාර්යය සඳහා නිකුත් කරන ලද අවසර පත්‍රයක් යටතේ මිස කිසිඳු තැනැත්තකු විසින් පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් පාරක, මංමාවතක, පොදු උද්‍යානයක, ක්‍රීඩාංගණයක හෝ වෙනත් යම් පොදු ස්ථානයක යම් කවර හෝ භාණ්ඩයක්, ද්‍රව්‍යයක් හෝ ආහාරයක් අතින් රැගෙන ගොස් හෝ බයිසිලයක, ට්‍රයිසිකලයක, කරත්තයක හෝ වෙනත් යම් වාහනයක එහා මෙහා රැගෙන යමින් විකිණීම හෝ විකිණීම සඳහා තබා ගැනීම නොකළ යුතු ය.

05. ඉහත 4 වැනි වගන්තිය යටතේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක්ම කලින් අවලංගු නොකරනතාක් නිකුත් කරනු ලැබුවේ යම් කාල සීමාවක් සඳහා ද, එකී කාලසීමාව සඳහා පමණක් වලංගු වෙයි. බලපත්‍රයක් සඳහා වන උපරිම කාලසීමාව අදාළ ලිත් වර්ෂය ඉක්ම නොයා යුතු ය.

06. සංචාරක වෙළඳාමට අදාළ බලපත්‍රයක් සමග වන සෑම ඉල්ලීමක්ම මෙම අතුරු ව්‍යවස්ථාවෙහි "අ" උපලේඛනයට සාරානුකූලව පිළියෙල කර ලද ඉල්ලුම්පත්‍රයකට අනුකූලව විය යුතු ය. එය පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් තීරණය කර අයකරනු ලබන ගාස්තු ගෙවා ලබාගත යුතු ය.

07. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරනු ලබන අවසර පත්‍රයක් මෙම අතුරු ව්‍යවස්ථාවේ "ආ" උපලේඛනයට සාරානුකූල විය යුතු අතර, ඒ සඳහා අයකළ යුතු ගාස්තු බලපත්‍රයට අදළ කාල පරිච්ඡේදයන් සැලකිල්ලට ගනිමින් සභාව විසින් කලින් කල තීරණය කළ හැකි ය.

08. සෑම සංචාරක වෙළෙන්දෙකුම වෙළෙඳ කටයුතුවල නිරත වන විටදී සභාපතිවරයා විසින් නිකුත් කරන ලද බලපත්‍රයෙහි ප්‍රකටව පෙනෙන පරිදි පැළඳ සිටිය යුතු හෝ ප්‍රදර්ශනය වන පරිදි තැබිය යුතු කොටස පැළඳ සිටිය යුතු ය. නැතහොත් ප්‍රදර්ශනය වන පරිදි තබාගත යුතු ය.

09. සභාපතිවරයා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් තම බලපත්‍රය ඉදිරිපත් කරන ලෙස දන්වනු ලැබූ කවර අවස්ථාවක දී වුවද සෑම සංචාරක වෙළෙන්දෙකු විසින් තම බලපත්‍රය සහ ඊට අදළ ලියවිලි ඉදිරිපත් කළ යුතු ය.

10. බලපත්‍රලාභී සෑම සංචාරක වෙළෙන්දෙක් ම වෙළඳාමේ ස්වභාවය අනුව බලපත්‍රය යටතේ කාලය සීමාකර තිබේ නම් හැර පෙ.ව. 06.00 සිට ප.ව. 10.00 දක්වා කාලය තුළ සිය ව්‍යාපාරික කටයුතුවල නිරතවීමට හිමිකම් ලබයි. එසේ වුවද සභාපතිවරයා විසින් එකී කාලසීමාවෙන් බැහැරව වෙළඳාමේ නිරත වීම සඳහා අවසරය දෙනු ලදුව ඒ බව බලපත්‍රයේ සඳහන් කර තිබේ නම් එසේ සඳහන් කර ඇති කාලය තුළ වෙළඳාම් කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

11. සංචාරක වෙළඳාම සඳහා සෑම අවසරපත්‍ර ලාභියෙකුම බෝවන රෝගයකින් පෙළෙන්නේ නම් වෙළඳ කටයුතුවල යෙදීමෙන් වැළකිය යුතු ය.

12. ආහාර විකිණීමේ ව්‍යාපාරයෙහි නිරත වී සිටින සෑම සංචාරක වෙළෙන්දෙක් ම පහත සඳහන් විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතු යඃ-

(අ) විකිණීමට රැගෙන යන ආහාරවලට මැස්සන් වැසීම වැළැක්වීමට සහ දූවිල්ල, අපද්‍රව්‍ය, දුර්ගන්ධය එකතුවීම වැළැක්වීමට හැකිවන සේ තබා ගතයුතු අතර, එම ආහාර පුද්ගලයන්ට ස්පර්ශ කිරීමද ඉඩ නොදිය යුතු ය.

(ආ) ආහාර තබාගන්නා වාහනය, පාපැදිය, කරත්ත, භාජන හා තැටි ආදිය සහ ආහාර සමඟ ස්පර්ශ වන සියලු උපකරණ හා උවාරණ නිතිපතා පිරිසිදුව තබාගත යුතු ය.

(ඇ) ආහාර එතීම සඳහා පාවිච්චි කරනු ලබන කඩදාසි හෝ ද්‍රව්‍ය පිරිසිදුව හා ඒ සඳහා සුදුසු තත්වයක පැවතිය යුතු ය.

(ඈ) ආහාර ස්පර්ශ කිරීම සඳහා පිරිසිදු උපකරණ හා මෙවලම් පාවිච්චි කළ යුතු ය. ආහාර විකිණීමේ කටයුතු සඳහා බෝවන රෝගයකින් පෙළෙන තැනැත්තෙකු නොයෙදිය යුතු ය.

(ඉ) කිසියම් පුද්ගලයෙකුට හෝ පුද්ගලයින්ට අන්තරායදයක වන සේ හෝ පීඩාවක් වන සේ ගින්දර පාවිච්චි නොකළ යුතු යි.

(ඊ) අපද්‍රව්‍ය හෝ අප ජලය පොදු ස්ථානවල නොදැමිය යුතු අතර, ඒවා සෞඛ්‍යාරක්ෂිත ආකාරයට ඉවත් කිරීම සඳහා සභාපතිවරයා සෑහීමකට පත්වන ආකාරයට කටයුතු සලසා තිබිය යුතු ය.

13. සෝ ගාතක ආඥපනත යටතේ සඳහන් කර ඇති සතෙකුගේ හෝ සතුන්ගේ මස් කිසිදු සංචාරක වෙළෙන්දෙකු විසින් විකිණීම නොකළ යුතු ය.

14. කිසියම් වසංගත රෝගයක් හෝ බෝවන රෝගයක් පැතිරෙමින් පවතින හෝ පැතිරී ඇති ප්‍රදේශයක් වශයෙන් හෝ විශේෂ අවස්ථානුගත කරුණක් හේතු කොට ගෙන සභාපතිවරයා විසින් සංචාරක වෙළඳාම නොකළ යුතු ප්‍රදේශයක්, කලාපයක්, වීථියක්, මං මාවතක්, ව්‍යාපාරයක් ප්‍රකාශ කර ඇති විටක වලංගු බලපත්‍රයක් ඇත්තේ වුව ද එම ප්‍රදේශයක, කලාපයක, වීථියක, මංමාවතක සංචාරක වෙළඳාම නොකළ යුතු ය.

15. සංචාරක වෙළඳාම කාර්යයන්හි දී ජනනය වන අපද්‍රව්‍ය ඒ සඳහා පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කරනු ලැබ ඇති කසළ කළමනාකරණ ක්‍රමවේදයන්ට අනුකූලව මිස අන් කවර ආකාරයක බාහිර පරිසරයට මුදා හැරීමක් නොකළ යුතු ය.

16. අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලැබුවේ වුව ද පොදු වෙළඳපළ පරිශ්‍රයක් තුළ සංචාරක වෙළඳාම නොකළ යුතු ය.

17. කිසියම් ස්ථානයක දීර්ඝ වේලාවක් රැඳී සිට වෙළඳාම් කිරීම කිසිදු අවසර පත්‍ර ලාභියෙකු නොකළ යුතු ය.

18. මෙම අතුරු ව්‍යවස්ථාවල කවර හෝ විධිවිධානයක් කඩ කිරීම, උල්ලංඝනය කිරීම වරදක් වන අතර, නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය හා එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොකරවා තවදුරටත් කරගෙන යන විටෙක ඒ පිළිබඳව වරදකරු හා එම කඩ කිරීම හෝ උල්ලංඝනය ගැන අවධානය යොමු කරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාරදෙනු ලැබීමෙන් පසුව කඩකිරීම හෝ උල්ලංඝනය තදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහාම නියම කළහැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය (2) උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතු ය.

19. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස —

"සභාව" යන්නෙන් පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව අදහස් වේ.

"සභාපති" යන්නෙන් පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද,

"ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය" යන්නෙන් පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කරන ලද බල ප්‍රදේශය අදහස් වේ.

"ආහාර" යන්නෙන් මනුෂ්‍ය පරිභෝජනය සඳහා ගනු ලබන ආහාර හා පාන වර්ග අදහස් කරනු ලැබේ.

"සංචාරක වෙළඳාම" යන්නෙන් තමා විසින්ම හෝ සතෙකුගේ ආධාරයෙන් හෝ වාහනයකින් හෝ කරත්තයකින් හෝ බයිසිකලයකින් හෝ ට්‍රයිසිකලයක් මගින් ද්‍රව්‍ය රැගෙන යමින් කරනු ලබන වෙළඳාමක් අදහස් වේ.

## "අ" උපලේඛනය

### සංචාරක වෙළඳාම සඳහා බලපත්‍රයක් ලබාගැනීම සඳහා ඉල්ලුම්පත්‍රය

1. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම : _______
2. ඉල්ලුම්කරුගේ ස්ථිර ලිපිනය : _______
3. ඉල්ලුම්කරුගේ තාවකාලික ලිපිනය : _______
4. ඉල්ලුම්කරුගේ ජා. හැ. අංකය : _______
5. ඉල්ලුම්කරුගේ දු. අංකය : _______
6. සංචාරක ව්‍යාපාරයේ ස්වභාවය : _______
7. සංචාරක ව්‍යාපාරය සිදු කරනු ලබන ආකාරය : _______
8. ඉල්ලුම් කරනු ලබන බල ප්‍රදේශය : _______
9. ඉල්ලුම්කරු පදිංචි බල ප්‍රදේශය : _______
10. බලපත්‍රය අවශ්‍ය කරනු ලබන කාලසීමාව : _______

11.සංචාරක වෙළෙඳාම සිදුකරනු ලබන වාහනයේ ලියාපදිංචි අංකය : _______

දිනය : _______

_______
ඉල්ලුම්කරුගේ අත්සන.

උපදෙස් :

1. හැඳුනුම්පතේ පිටපතක් අමුණා තිබිය යුතු ය.

බලපත්‍රය ලබාදීම සඳහා ආදයම් පරීක්ෂකගේ නිර්දේශය

_______
ආදයම් පරීක්ෂකගේ අත්සන.

බලපත්‍රය ලබාදීම සඳහා විෂය ලිපිකරුගේ වාර්තාව:

_______
විෂයභාර කළමනාකරුගේ අත්සන.

දිනය: _______

බලපත්‍ර ලබාදීම නිර්දේශ කරමි/ නොකරමි.

_______
ලේකම්

දිනය: _______

බලපත්‍ර ලබාදීම අනුමත කරමි/ නොකරමි.

දිනය: _______

_______
සභාපති,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව.

## "ආ" උපලේඛනය

සංචාරක වෙළඳාම සඳහා දෙනු ලබන බලපත්‍රයයි.

1. බලපත්‍රලාභියාගේ සම්පූර්ණ නම : _______
2. බලපත්‍රලාභියාගේ ජා. හැ. අංකය : _______
3. වෙළෙඳාමේ ස්වභාවය : _______
4. අවසරය දෙනු ලබන ප්‍රදේශය : _______
5. අවසරය දෙනු ලබන කාලසීමාව : _______

දිනය: _______

_______
සභාපති
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව.

(මෙම කොටස ප්‍රකටව පෙනෙන පරිදි පැළඳ සිටිය යුතු ය. *නැතහොත්* ප්‍රදර්ශනය කළ යුතු ය.)

**ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සංචාරක වෙළෙඳාම සඳහා දෙනු ලබන බලපත්‍රයයි**

1. සම්පූර්ණ නම : _______
2. ස්ථිර ලිපිනය : _______
3. ජා. හැ. අංකය : _______
4. බලපත්‍රලාභියාගේ අත්සන : _______
5. අවසරය දෙනු ප්‍රදේශය ලැබූ : _______
6. අවසරය දෙනු කාලසීමාව ලැබූ : _______
7. වෙළෙඳාමේ ස්වභාවය : _______

දිනය: _______

_______
සභාපති,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව.

11-249/3

---

**පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ පොළ පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

01. මෙම අතුරු ව්‍යවස්ථාව සෑදීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 (xii) උපවගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට බලය ලැබී ඇත.

02. මෙම අතුරු ව්‍යවස්ථාව පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යනු ලබන පොළ විධිමත් කිරීම පිණිස පනවනු ලැබේ.

03. මෙම අතුරු ව්‍යවස්ථාව ‘පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා පොළ පිළිබඳ අතුරු ව්‍යවස්ථාව’ යනුවෙන් හැඳින් වේ.

04. පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන පොළ සම්බන්ධයෙන් එක් එක් පොළට අයිති සීමාවන් (මෙහි මින්මතු ‘පොළ භූමිය’ යනුවෙන් හඳුන්වනු ලබන) සභාව යෝජනා සම්මුතියෙන් මගින් තීරණය කර ප්‍රකාශයට පත්කළ යුතු ය.

05. පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යන පොළ සතියේ පැවැත්වෙන දින සහ වේලාව සභාව විසින් කලින් කල තීරණය කර ප්‍රකාශයට පත්කළ යුතු ය.

06. පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරන ලදුව පොළ පවත්වාගෙන යාම ඒ සඳහා ක්‍රියාත්මක ගිවිසුමක් යටතේ පාලනය වන අවස්ථාවකදී හැර සභාපතිවරයා හෝ ඔහුගේ බලයලත් නිලධාරියෙකු විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයක් යටතේ මිස කිසිදු තැනැත්තෙකු පොළෙහි වෙළෙඳාම් නොකළ යුතු ය.

07. ඉහත 6 වැනි වගන්තියෙහි සඳහන් අවසර පත්‍රයක් සඳහා ගාස්තු සභාව විසින් කලින් කල යෝජනා සම්මුතියන් මගින් තීරණය කළ යුතු ය.

08. පොළ භූමියෙහි ඒ ඒ භාණ්ඩ අලෙවිය සඳහා වෙන් කරන ලද සීමාවන් තුළ අදාළ භාණ්ඩ අලෙවිය සිදු කළ යුතු අතර, කිසිදු තැනැත්තෙකු පොළ භූමිය තුළ සංචාරය කරමින් භාණ්ඩ වෙළඳාම නොකළ යුතු ය.

09. පහත සඳහන් කිසිදු ක්‍රියාවක් පොළ භූමිය තුළ නොකළ යුතු ය.

(අ) මහජනයාට භාණ්ඩ මිළදී ගැනීමට ගමන් කිරීම සඳහා වෙන් කර ඇති මාර්ගයේ භාණ්ඩ අලෙවි කිරීම, ප්‍රදර්ශනය කිරීම හෝ යම් දෙයක් තබා මග අවහිර කිරීම,

(ආ) හිඟමන් යැදීම,

(ඇ) නොහික්මුණු ආකාරයට හැසිරීම හෝ අන් අයට යම් ආකාරයක කරදරයක් සිදු කිරීම,

(ඈ) පොළ භූමිය තුළ ඉවුම් පිහුම් සිදු කිරීම,

(ඉ) අවසර පත්‍රයේ සඳහන් පරිදි ලෙස වසනු ලැබීමෙන් පසුව පොළ භූමියෙහි රැඳී සිටීම,

(ඊ) පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් අය කිරීමට අනුමැතිය ලබාදී ඇති ගාස්තු හැර බදුකරු විසින් හෝ ඔහුගේ නියෝජිතයා විසින් එයට වැඩි මුදල් එකතු කිරීම;

(උ) පොළ භූමිය තුළ තිබෙන ජල කරාමවලින් රෙදි වාහන සේදීම හා ස්නානය කිරීම

(එ) පිළිකුල් සහගත හෝ ස්පර්ශක හෝ වසංගත රෝගයකින් පෙළෙන තැනැත්තෙකු පොළ භූමිය තුළ භාණ්ඩ අලෙවි කිරීම, ප්‍රදර්ශනය කිරීම හෝ භාණ්ඩ පොළට රැගෙන ඒම හෝ එවැනි රෝගියෙකුට ඇප උපස්ථාන කරමින් සිට පැමිණ පොළෙහි භාණ්ඩ විකිණීම, ප්‍රදර්ශනය කිරීම හෝ භාණ්ඩ රැගෙන ඒම සිදු කිරීම.

(ඒ) පිරිසිදු තත්ත්වයෙන් නොමැති භාණ්ඩ පොළෙහි අලෙවි කිරීම, අපිරිසිදු හා රෝග කාරක ස්ථානවලින් රැගෙන එන භාණ්ඩ අලෙවි කිරීම, විශ්වාසවන්තභාවයෙන් තොර භාණ්ඩ අලෙවි කිරීම.

(ඔ) නිවැරදි කිරුම් මිනුම් උපකරණ භාවිතා නොකිරීම.

(ඕ) සතුන් හා පක්ෂීන් හිංසාවට පත් කිරීම, සතුන් මරණයට පත් කිරීම.

(ක) පොළ භූමිය තුළ වාහන එහා මෙහා ගෙන යාම සහ නවතා තැබීම.

(ග) වස විෂ ද්‍රව්‍ය, ඉන්ධන ප්‍රමිතියට හා මහජන අලෙවියට අවසර නොමැති පුපුරණ ද්‍රව්‍ය, නරක් වූ මස් හා මාළු අලෙවි කිරීම හා ප්‍රදර්ශනය කිරීම.

(ච) සත්ත්ව මාංශ කොටස්, ඉවත දමන සත්ත්ව කොටස්, කැලි කසල හෝ අතුගා ඉවත දමන ද්‍රව්‍ය කිසිවක් කාණුවකට හෝ පොළෙහි තැනින් තැන දැමීම.

(ජ) පොළ රාත්‍රී 10.00න් පසු පැවැත්වීම.

10. පොළ භූමිය තුළ වෙළඳාම් කිරීමේ දී එක් රැස්වන කසල බැහැර කරලීම පහසු වන පරිදි ඒ සඳහා වෙන් කර ඇති ස්ථානයකට හැර තැනින් තැන කසල දැමීම, වෙනත් ආකාරයකින් පොළ භූමිය අපවිත්‍ර කිරීම කිසිදු තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

11. පොළ භූමියෙහි මෙම අතුරු ව්‍යවස්ථාවට අනුකූලව කටයුතු සිදු වන්නේ ද යන්න සභාපතිවරයා හෝ ඔහුගේ බලයලත් නිලධාරියෙකු ඕනෑම අවස්ථාවක දී පරීක්ෂා කිරීම නීත්‍යානුකූල වන අතර, එසේ ක්‍රියා කරන ලද අවස්ථාවක ඊට බාධා කිරීම හෝ එය වළක්වන පරිදි ක්‍රියා කිරීම කිසිදු තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

12. පොළ පැවැත්වෙන දින නියමිත වේලාවට පැය 12 කට පූර්වාසන්න කාලසීමාවක දී හැර වෙළඳාම සඳහා කිසිදු තැනැත්තෙකු පොළ භූමියට ඇතුල්වීම නොකළ යුතු ය.

13. පොළ භූමියෙහි ඉදිකර ඇති හෝ සවිකර ඇති කිසිදු දේපලකට හානි වන කිසිදු ක්‍රියාවක් කිසිම තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

14. මෙම අතුරු ව්‍යවස්ථාවල කවර හෝ විධිවිධානයක් කඩ කරන උල්ලංඝනය කිරීම වරදක් වන අතර, නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට කළ හැකි උපරිම දඬය හා එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොකරවා තවදුරටත් කරගෙන යන විටෙක ඒ පිළබඳව වරදකරු කිරීමෙන් පසු හෝ උල්ලංඝනය ගැන අවඝානය යොමු කරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දන්වීමක් භාරදෙනු ලැබීමෙන් පසුව කඩකිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහාම නියම කළහැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය (2) උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතු ය.

15. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ,

"සභාව" යන්නෙන් පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය සභාව ද,

"සභාපති" යන්නෙන් පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද අදහස් වන්නේ ය.

11-249/4

---

## පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය සභාවේ මාළු විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

01. මෙම අතුරු ව්‍යවස්ථාව සෑදීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 (ix) (ඒ) වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට බලය ලැබී ඇත.

02. මෙම අතුරු ව්‍යවස්ථාවේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මාළු විකිණීම විධිමත් කිරීම, පාලනය හා බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා ගාස්තු අයකිරීම සඳහා ද පනවනු ලැබේ.

03. මෙම අතුරු ව්‍යවස්ථාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මාළු විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

04. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කවර හෝ තැනැත්තෙකු විසින් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් නොමැතිව මාළු විකිණීමේ කාර්යය සඳහා යම් ස්ථානයක් පාවිච්චි නොකළ යුතු ය.

05. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කරනු ලබන සෑම තැනැත්තෙක්ම ඒ සඳහා සභාව විසින් මෙම අතුරු ව්‍යවස්ථාවට සාරානුකූලව සකස් කරන ලද ඉල්ලුම්පත්‍රයක් සභාව වෙතින් ලබාගෙන ඒ සඳහා ඉල්ලුම් කළයුතු අතර, ඒ සඳහා අයකළ යුතු ගාස්තු සභාව විසින් කලින් කල තීරණය කළ යුතු ය.

06. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රය ලබා ගැනීමට ඉල්ලුම් කර වෙළෙඳ ස්ථානය මෙහි පහත දැක්වෙන කොන්දේසිවලට අනුකූල වන්නේ නම් මිස සභාපතිවරයා විසින් කවර හෝ තැනැත්තෙකුට මාළු විකිණීමේ වෙළඳ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් නිකුත් නොකළ යුතු ය.

(අ) සභාපතිවරයා විසින් අනුමත කරන ලද සැලැස්මකට අනුකූල ඉදිකිරීමක් විය යුතු ය.

(ආ) මාළු විකිණීම සඳහා ම භාවිතා කරනු ලබන කොටස කපරාරු කළ සිමෙන්ති හෝ පිඟන් ගඩොල් අල්ලා හෝ මළ නොබැඳෙන ලෝහ තහඩු හෝ යොද තිබිය යුතු ය.

(ඇ) මාළු විකිණීම සඳහා ප්‍රදර්ශනය කරනු ලබන ස්ථානයේ බිම සහ ගබඩා කිරීමේ ස්ථානයේ බිම සිමෙන්ති බදමයෙන් මැදීම කර හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය.

(ඈ) අප ජලය ගලායාම පහසු කිරීම සඳහා අවශ්‍ය බෑවුමක් සහිතව සිමෙන්තියෙන් මැදීම කරනු ලැබූ හෝ පිඟන් ගඩොල් ඇල්ලූ කාණු තිබිය යුතු ය.

(ඉ) (ඈ) ඡේදයේ සඳහන් කාණු තුළින් ගලායන අපජලය කිසියම් පොදු ජල මාර්ගයකට ගලායාමට වැළැක්වීමට ප්‍රමාණවත් විධිවිධාන සලස්වා තිබිය යුතු අතර, එකී අප ජලය උරා ගන්නා වළකට ගලායාමට ඉඩ සලස්වා තිබිය යුතු ය.

(ඊ) අප ජලය ගලායාමට සලස්වන ලද උරාගන්නා වල වාතයට නිරාවරණය නොකළ යුතු ය.

(උ) මාළු වෙළඳ ස්ථානයෙන්, බැහැර කරනු ලබන ජෛවහායන අපද්‍රව්‍ය බහාලීමට ප්‍රමාණවත් භාජන තබා තිබිය යුතු අතර, දෛනික වෙළඳාම් කටයුතු අවසානයේ එකී අපද්‍රව්‍ය පොළොව මට්ටමෙන් අවම වශයෙන් මීටර් 0.5 ක් ගැඹුරෙන් වළ දැමීම හෝ ප්‍රාදේශීය සභාව විසින් කලින් කළ තීරණය කර ක්‍රියාත්මක කරන ආකාරයට බැහැරලීම් කළ යුතු ය.

(ඌ) ස්ථානයේ සේවය කරන තැනැත්තන්ගේ ප්‍රයෝජනය සඳහා ප්‍රමාණවත් ජල මුද්‍රිත වැසිකිළි පහසුකම් සපයා තිබිය යුතු අතර, වැසිකිළි භාවිතයෙන් අනතුරුව පාවිච්චි කිරීමට සුදුසු සනීපාරක්ෂක ක්‍රම හා ද්‍රව්‍ය සපයා තිබිය යුතු ය.

07. බලපත්‍රලත් කවර හෝ මාළු වෙළඳ ස්ථානයක දෛනික කටයුතු අවසානයේ එකී ස්ථානයේ බිම ද, බිත්තිවල පිඟන් ගඩොල් ඇල්ලූ හෝ සිමෙන්ති කපරාරු කළ කොටස් ද මාළු කැපීම සඳහා ගන්නා කොට ද, උපකරණ, මාළු විකිණීම සඳහා ප්‍රදර්ශනයට තබන ස්ථාන ද, විෂබීජ නාශක දියර යොද සෝද පිරිසිදු කිරීමට සැලැස්විය යුතු ය.

08. බලපත්‍රලත් කවර හෝ මාළු වෙළඳ ස්ථානයක සහ එහි අවට කාණු ද, මාළු ගබඩා කිරීම, සකස් කිරීම හෝ විකිණීම හා සම්බන්ධව පාවිච්චි කරන සියළු භාජන සහ උපකරණ ද මනා අලුත්වැඩියාවෙන් යුතුව සහ දුර්ගන්ධයකින් තොරව තබා ගැනීමට සැලැස්විය යුතු ය.

09. බලපත්‍රලත් ස්ථානයේ දෛනික වෙළඳාම් කටයුතු අවසන් වීමෙන් අනතුරුව විකුණා ගැනීමට නොහැකිව ශේෂ වන මාළු අධි ශීතකරණයක ගබඩා කරනු ලැබ ඇත්තේ නම් හා එසේ ගබඩා කළ අවස්ථාවේ සිට ඊළඟ දිනයේ මාළු වෙළඳ සැල විවෘත කරන අවස්ථාව දක්වා එකී අධිශීතකරණය නිසි ආකාරයෙන් ක්‍රියාත්මකව පැවති තිබුණේ නම් මිස ශේෂවන කවර හෝ මාළු ඊළඟ දිනයේ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ අධි ශීතකරණයේ හෝ බලපත්‍රලත් ස්ථානයේ තබාගැනීම හෝ නොකළ යුතු ය.

10. බලපත්‍රලත් කවර හෝ මාළු වෙළඳ ස්ථානයක බල්ලන්, බළලුන්, මීයන්, කෘමීන් හෝ වෙනත් කවර හෝ සතුන්ගෙන් තොරව තබාගත යුතු ය.

11. බලපත්‍රලත් ස්ථානයෙහි මාළු දමා තැබීමට හෝ සකස් කිරීමට හෝ විකිණීමට පාවිච්චි කරන උපකරණ හෝ භාජන හැර කිසිම භාණ්ඩයක් හෝ ඇඳුමක් හෝ නිදගන්නා පැදුරක් හෝ වෙනත් කවර හෝ දෙයක් තබාගැනීම නොකළ යුතු ය.

12. බලපත්‍රලත් ස්ථානයෙහි

(අ) කිසියම් ආසාදන,ස්පර්ශක, හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතකදී එවැනි රෝගයකින් පෙළෙමින් සිට කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළන යම් තැනැත්තෙකුට මෑතකදී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ කාල සීමාව ඉකුත්වී ඇත්තේ නම් මිස කවර හෝ මාළු වෙළඳ ස්ථානයක කවර හෝ ආකාරයක වෙළඳාමෙහි හෝ එසේ වෙළඳාමේ නියුක්ත යම් තැනැත්තෙකුගේ සහායකයෙකු වශයෙන් හෝ නියුක්ත වීම හෝ නියුක්ත කරවීම හෝ කිසියම් කාර්යයක නියුක්ත වීම ඉඩදීම හෝ නොකළ යුතු ය.

(ආ) හොඳින් සෝදා පිරිසිදු කළ ඇඳුම් හැඳ ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් මාළු වෙළඳ ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක නියුක්ත වීම හෝ නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

(ඇ) මාළු වෙළඳ ස්ථානයේ සේවයේ යොදවා ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයට භාජනය කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

13. මාළු වෙළඳ ස්ථානයෙහි සේවයේ යෙදෙන සෑම සේවකයෙකු වෙත ම ආරක්ෂිත මුව වැසුම්, අත් වැසුම් හා අවශ්‍ය කරන වෙනත් ආරක්ෂිත පැළඳුම් සපයා තිබීමත්, එකී සේවකයන් මාළු වෙළඳ ස්ථානයෙහි සේවයේ නියුක්ත වන සෑම අවස්ථාවකම එකී ආරක්ෂිත පැළඳුම් පැළඳ සිටින බවට සහ සහතිකවීමත් බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

14. බලපත්‍රලත් ස්ථානයේ සේවයේ නියුක්ත සෑම තැනැත්තෙකු විසින්ම ප්‍රයෝජනයට ගැනීම පිණිස සබන් හෝ සබන් දියර තබා තිබීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

15. සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියෙකු විසින් කිසියම් මාළු වෙළෙඳ ස්ථානයෙහි විකිණීමට තබා ඇති හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කර ඇති හෝ ඇතුළත ගබඩා කර ඇති යම් මාළු වර්ගයකින් සාම්පලයක්, එහි මිල ගෙවා ලබාගැනීම නීත්‍යානුකූල විය යුතුවාත් හැර කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී මිලදී ගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ ඊට බාධා කිරීම නොකළ යුතු ය.

16. (අ). බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන සියලුම අපද්‍රව්‍ය නැවත භාවිතයට ගන්නේ නම් මිස එකී අපද්‍රව්‍ය

(i) ජෛවභානය අපද්‍රව්‍ය ;

(ii) කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය ;

(iii) පොලිතින් හා ප්ලාස්ටික් හෝ පොලිතින් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය ;

යන වර්ග යටතේ වර්ග කිරීමට සැලැස්විය යුතු අතර ඒ එක් එක් වර්ගයේ අපද්‍රව්‍ය බහාලීමට පිළියෙල කර ඇති වෙන් වෙන් වූ භාජනවලට හෝ ටැංකිවලට දැමීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

(ආ) ඉහත (අ) ඡේදයේ සඳහන් ආකාරයට වර්ග කර භාජනවල හෝ ටැංකිවල දමා ඇති අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩපිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස සභාපතිවරයා විසින් ඒ සඳහා නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැරලීම කළ යුතු ය.

17. මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් පරීක්ෂා කිරීමට සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියෙකුට පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය යන්නට මාළු වෙළඳ ස්ථානයේ මාළු වෙළඳාම කරනු ලබන ඕනෑම අවස්ථාවක් අදහස් වේ.

18. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යනු ලබන ස්ථානය 6 වැනි වගන්තියෙහි සඳහන් කවර හෝ නියමයකට අනුකූලව පැවතීම අවසාන වුවහොත් හෝ මෙම අතුරු ව්‍යවස්ථාවල හෝ වෙනත් කිසියම් අතුරු ව්‍යවස්ථාවක නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය ඒ නියමයට අනුකූල තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටුකරන ලෙසට බලපත්‍රධාරියාට නියම කෙරෙන දැන්වීමක් සභාපතිවරයා විසින් එකී බලපත්‍රධාරියා වෙත භාරදෙනු ලැබීමට සැලැස්විය යුතු ය.

19. 18 වැනි වගන්තියෙහි සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රධාරියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියාකළ යුතු ය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක එකී දැන්වීමේහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට සභාපතිවරයාට බලය තිබිය යුතු ය. එසේ වුවද ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලැබෙන කාලය දින දහ හතරකට නොවැඩි විය යුතු ය.

20. 18 වැනි වගන්තියෙහි සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියාකිරීමට පැහැර හැර ඇති අවස්ථාවක ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය සභාපතිවරයා විසින් අවලංගු කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතු ය.

21. මෙම අතුරු ව්‍යවස්ථාවල කවර හෝ විධිවිධානයක් කඩ කරන උල්ලංඝනය කිරීම වරදක් වන අතර, නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය හා එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොකරවා තවදුරටත් කරගෙන යන විටෙක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසු හෝ උල්ලංඝනය ගැන අවධානය යොමු කරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාරදෙනු ලැබීමෙන් පසුව කඩකිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහාම නියම කළහැකි අතිරේඛ දණ්ඩනයේ උපරිමය පිළිවෙලින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය (2) උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතු ය.

22. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ

"සභාව" යන්නෙන් පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවද,

"සභාපති" යන්නෙන් පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාද,

"ප්‍රාදේශීය සභා ප්‍රදේශය" යන්නෙන් පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කරන ලද බල ප්‍රදේශය ද අදහස් වේ.

11-249/5

---

**පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ සේවා සඳහා ගාස්තු අයකිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

01. මෙම අතුරු ව්‍යවස්ථාව සෑදීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 (xiv) වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට බලය ලැබී ඇත.

02. මෙම අතුරු ව්‍යවස්ථාව ප්‍රාදේශීය සභාව විසින් සපයන සේවාවන් විධිමත් කිරීම, එකී සේවාවන් සම්බන්ධයෙන් ගාස්තු අයකිරීම සඳහා පනවනු ලැබේ.

03. මෙම අතුරු ව්‍යවස්ථාව ප්‍රාදේශීය සභා සේවාවන් සඳහා ගාස්තු අයකිරීම පිළිබඳ වූ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

04. මෙම අතුරු ව්‍යවස්ථාවට අදළ සේවාවන් යන්නට පහත සඳහන් දේ අදළ වෙයි.

(1) ඉල්ලුම්පත්‍ර නිකුත් කිරීම, ඊට පහත සඳහන් දේ ඇතුළත්ය.

I. සභාව විසින් පවත්වාගෙන යනු ලබන පෙර පාසල් සඳහා ඇතුල්වීමේ ඉල්ලුම්පත්‍ර
II. සභාව විසින් පවත්වාගෙන යන පුස්තකාල සාමාජිකත්වය සඳහා ඉල්ලුම්පත්‍ර
III. වරිපනම් ලේඛනයෙහි උධෘත ලබාගැනීම සඳහා ඉල්ලුම්පත්‍ර
IV. සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ඉල්ලුම්පත්‍ර
V. විථිරේඛා සහතිකයක් ලබාගැනීම සඳහා ඉල්ලුම්පත්‍ර
VI. නොපවරාගැනීමේ සහතිකයක් ලබාගැනීම සඳහා ඉල්ලුම්පත
VII. ඊ නැණ පියස පුහුණු පාඨමාලා ඉල්ලුම්පත්‍රය
VIII. සභාව සතු ගලි බවුසරයක්, ට්‍රැක්ටරයක්, මෝටර් ග්‍රේඩර්, බැකෝ ලෝඩර්, ජේ. සී. බී. යන්ත්‍රයක් සේවය සඳහා ලබාගැනීමට අදළ ඉල්ලුම්පත්‍ර

(2) සහතික පත්‍ර නිකුත්කිරීම, ඊට පහත සඳහන් දේ ඇතුළත් ය.

I. විරීරේබා සහතික
II. නොපවරාගැනීමේ සහතික
III. වරිපනම් ලේඛන ආශ්‍රයෙන් හිමිකම් පිළිබඳ සහතික
IV. වරිපනම් ලේඛනවල උධෘත සනාථ කරන සහතික
V. නිකුත්කරන ලද තක්සේරු නිවේදන සනාථ කරන සහතික

(3) සභාව සතු ගලි බවුසරයක්, ට්‍රැක්ටරයක්, මෝටර් ග්‍රේඩරයක්, බැකෝ ලෝඩරයක්, ජේ. සී. බී. යන්ත්‍රයක් හා ජල බවුසරයක් කුලියට ලබාදීම.

05. මෙම අතුරු ව්‍යවස්ථාවේ ඉහත 4 වැනි වගන්තිය යටතේ විස්තර කර ඇති එක් එක් සේවාවන් සම්බන්ධයෙන් වන ගාස්තු කලින් කල සභාව විසින් සභා සම්මුතියක් මගින් තීරණය කළ යුතු ය.

06. (I) ඉහත 4 වැනි වගන්තියෙහි (1) වන උපවගන්තිය යටතේ නිකුත්කරනු ලබන සෑම ඉල්ලුම්පත්‍රයක් යටතේම ඒ සමග ඉල්ලුම්පත්‍රය නිසියාකාරව සම්පූර්ණ කිරීම සඳහා උපදෙස් මාලාවක් ඇතුළත් විය යුතු ය.

(II) එසේ නිකුත්කරනු ලබන සෑම ඉල්ලුම්පත්‍රයක් සඳහා මෙම අතුරු ව්‍යවස්ථාවෙහි 5 වන වගන්තිය යටතේ තීරණය කර ඇති පරිදි වන ගාස්තු ගෙවා ඊට අදළ ලදුපත ඉදිරිපත් කළ පසු ඒ සඳහා ඉලුල්ම්පත්‍රයක් නිකුත් කළ යුතු ය.

07. (i) මෙම අතුරු ව්‍යවස්ථාවේ 4 වැනි වගන්තියෙහි (2) වන උපවගන්තිය යටතේ විස්තර කරන සේවා අපේක්ෂිත සෑම තැනැත්තෙක්ම, ඊට අදළ ඉල්ලුම්පත්‍රය යටතේ නිශ්චිතව සඳහන් කර ඇති අවශ්‍යතා සම්පූර්ණ කරමින් සභාපතිවරයා හෝ සභාපතිවරයා විසින් ඒ සඳහා නිශ්චිතව බලය දී ඇති නිලධාරියෙකු වෙත අදළ ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කළ යුතු ය.

(ii) නිසියාකාරව සම්පූර්ණ නොවූ හෝ ඉල්ලුම්පත්‍රයෙහි සඳහන් අවශ්‍යතා සම්පූර්ණ නොවුන කිසිදු ඉල්ලුම්පත්‍රයක් භාර නොගත යුතු අතර, භාරගනු ලබන ඉල්ලුම්පත්‍රයක් ඉහත 4 වැනි වගන්තියෙහි (2) වන උපවගන්තියට අදළ සේවාවන් වෙනුවෙන් වන විට දී භාරගත් දිනෙන් දින තුනක් ඇතුළත ඊට අදළ සේවාව ඉටුකිරීම සභාපතිවරයා හෝ සභාපතිවරයා විසින් ඒ සඳහා නිශ්චිතව බලය දී ඇති නිලධාරියෙකුගේ කාර්යය වන්නේ ය.

08. මෙම අතුරු ව්‍යවස්ථ්වේ 4 වැනි වගන්තියෙහි (3) වන උපවගන්තිය යටතේ විස්තර කරන සේවාවන් අපේක්ෂා කරන සෑම තැනැත්තෙක්ම මෙම අතුරු ව්‍යවස්ථාවේ 4 වැනි වගන්තියෙහි (1) වන උපවගන්තිය යටතේ ලබාගත් ඉල්ලුම්පත්‍රයක් මගින් ඒ සඳහා ඉල්ලුම් කළ යුතු ය.

09. මෙම අතුරු ව්‍යවස්ථාවේ 8 වන වගන්තිය යටතේ සේවා සඳහා ඉල්ලුම් කිරීමේ දී ඉල්ලුම් කරනු ලබන අනුපිළිවෙලින් සේවය අපේක්ෂිත දිනට අදළව ඒ ඒ සේවා ගණයන් යටතේ ලේඛනගත කරගැනීම සභාවේ සභාපති විසින් ඒ සඳහා නිශ්චිතව බලය පවරන ලැබූ අයෙකු විසින් සිදුකළ යුතු ය.

10. මෙම අතුරු ව්‍යවස්ථාවේ 4 වන වගන්තියෙහි (3) වැනි උපවගන්තිය යටතේ විස්තර කරන සේවාව සඳහා සභාව විසින් ඉහත 5 වැනි වගන්තිය යටතේ තීරණය කරන ලද ගාස්තුවලට අතිරේකව අයකළ යුතු තැන්පත් මුදලක් සභාව විසින් තීරණය කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

11. ඉහත 8 වැනි වගන්තිය යටතේ ඉදිරිපත් වන සෑම ඉල්ලුම්පත්‍රයක් සම්බන්ධයෙන්ම සේවය සැපයීම සඳහා වන හැකියාව සහ ප්‍රමුඛතා අනුපිළිවෙල යටතේ සේවය ලබාගැනීමට ඉල්ලුම්කරු එකගවන විට දී පමණක් ඒ සඳහා මෙම අතුරු ව්‍යවස්ථාවේ 5 වැනි වගන්තිය යටතේ තීරණය කරනු ලැබ ඇති ගාස්තු හා ඊට අතිරේකව මෙහි 10 වන වගන්තිය යටතේ සභාව තීරණය කරනු ලැබ ඇති නිශ්චිත තැන්පත් මුදල ගෙවා ඇත්තේ නම්, පමණක් අදළ සේවාව සැපයීම නීත්‍යානුකූල වන්නේ ය.

12. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ

"සභාව" යන්නෙන් පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව ද,

"සභාපති" යන්නෙන් බස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාද,

"බලයලත් නිලධාරියා" යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යය සඳහා පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ සභාපති විසින් නිශ්චිතව රාජකාරි පැවරුමක් යටතේ කාර්යය ඉටුකරන අයෙකු ද ඇතුළත් වෙයි.

11-249/6

## උඩුනුවර ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (01) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (01) වන වගන්තිය ප්‍රකාරව මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩුනුවර ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත්කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ, මංමාවත්වලට අයත් ඉඩම් හිමිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශවයන් හෝ යම් විරුද්ධත්වයක් පළකරනු ලබන්නේ නම්, මෙම නිවේදනය *ගැසට්* පත්‍රයේ පළ වූ දින සිට එක් මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(01) වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරන ලෙස මින් දැනුම් දෙනු ලැබේ.

02. මෙම කාලසීමාව තුළ මෙම නිවේදනය පිළිබඳව යම් විරුද්ධතාවක් නොවුනහොත් උපලේඛනයේ සඳහන් මංමාවත්, උඩුනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබ බව පොදු ජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ජී.යූ. ගුණසිංහ
ලේකම්,
උඩුනුවර ප්‍රාදේශීය සභාව,
ගෙලිඔය.

### ලියාපදිංචි කළ යුතු මාර්ග නාමලේඛනය

ලියාපදිංචි කළ යුතු මාර්ගවලට අදළ පිඹුරුපත් අමුණා ඇත.

| *අනු. අංකය* | *ග්‍රාම නිලධාරි වසම* | *මාර්ගයේ නම* | *ආරම්භය* | *අවසානය* | *වම්පස පදිංචිකරුවන්* | *දකුණුපස පදිංචිකරුවන්* | *දිග (අඩි)* | *පළල (අඩි)* |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | 81 - ගඩලාදෙණිය උතුර | කෝරලේ දෙරවත්ත පාර | පොල්වත්තතැන්න ප්‍රධාන මාර්ගයේ සිට | වෙල්යාය | 1. කේ.ජී. වික්‍රමසිංහ<br>2. කේ.ජී. රත්නායක<br>3. කේ.ජී. නවරත්න<br>4. කේ.ජී. මුතුබණ්ඩා | 1. එල්.ආර්.එස්. එන්.ලේකම්ගේ<br>2 කේ.ජී. සෝමාවතී | 260 | 8 |
| 2 | 83 - පමුණුව නැගෙනහිර | ලෝල්ලගොඩ ප්‍රධාන පාරේ තුන්වන අතුරු මාර්ගය | පමුණුව ලෝල්-ගොඩ තුන්වන අතුරු මාර්ගය | ඩබ්.පී. රණසිංහ මයාගේ නිවස | 1. ප්‍රේමා පද්මිණි<br>2. ආර්.පී.ජී. ප්‍රේමචන්ද්‍ර<br>3. පී.ජී. දයාවතී | 1. එච්.එම්. විජිත බණ්ඩාර<br>2. ඩබ්.ජී.අයි. රණසිංහ<br>3. පී.එන්.ජී.ඒ. ප්‍රියන්ත ගුණවර්ධන<br>4. පී.පී.ජී. හේමලතා | 120 | 6 |

ජී.යූ. ගුණසිංහ
ලේකම්,
උඩුනුවර ප්‍රාදේශීය සභාව,
ගෙලිඔය.

210

**W.M.M. ASOKA WIJAYAKOON** . (C.S.S.I-F.S.I)
Regd. Chartered Licensed Surveyor
Court Commissioner & Valuer
No.240/9, Pilimathala Gardens
**PILIMATHALAWA** .
081 2575861

PLAN No. 3277

**Abbreviations**
CP – Concrete Post
ST – Stake




Scale - 1:500

## PLAN

Showing a roadway
from Polwattetenna R.D.A. road
to houses of the Koralegedara family
of land called **KORALEGEDARA WATTA**
situated bodering Polwattetenna Road
at Kahambe , Gadaladeniya in Medapalatha
of Udunuwara in Gadaladeniya North Grama
niladari area , in Udunuwara Pradeshiya Sabha
and in Udunuwara Divisional secretaries division
**KANDY DISTRICT**
CENTRAL PROVINCE

| Lot No. | A | R | P | Hectares |
|---|---|---|---|---|
| 1 | 0 | 0 | 06.3 | 0.01593 |

**Date of Survey - 17th September 2017 .**

Licensed Surveyor & Leveller
20 - 09 - 2017.
W.M.M. ASOKA WIJAYAKOON

SISL Membership No. 1264

R.L.K.JAYASUNDERA,
Registered Licensed Surveyor & Leveller,
Pamunuwa Group, Pilimatalawa.

PLAN No : J3714



Scale : 1 : 500

**PLAN**

Of

Third sub Road of Lollegoda Main Road

(Being Lot 172 and parts of Lots 165, 166, 168, 171, 173, 174 & 174 in Cadastral Map No : 320312 authenticated by Supdt. of Surveys Kandy District, behalf of the Surveyor General).

Situated at Pamunuwa Village in

Pamunuwa East (84) Grama Niladhari Division of Udunuwara Divisional Secretariat Division

Within the Pradeshiya Sabha Limits of Udunuwara

KANDY DISTRICT : CENTRAL PROVINCE

| Lot No. | Extent | | Boundaries |
|---|---|---|---|
| | Hectares | (A - R - P) | |
| | 0.0133 | (0 - 0 - 05.3) | North by Lollegoda watta, Gardens, Cultivated and occupied by R. P. G. Premachandra, W. G. I. Karunananda, Inoka Ranasinghe and Drain (Parts of Lots 171, 169, 168, 166 & 165 in said Cadastral Map No : 320312 ; Block 5 out of 5 blocks).<br><br>East by Lollegoda watta, GardensCultivated and occupied by Inoka Ranasinghe. (Part of Lot 165 in said Cadastral Map No : 320312, Block 5 out of 5 blocks.<br><br>South by Lollegoda watta, Gardens, Cultivated and occupied by P.W.G Thilakawatha, H.M Vijitha Bandara, P.N.T.A.P.Gunawardhana and P.G Hemalatha (Parts of Lots 173, 174 & 175 in said Cadastral Map No : 320312, Block 5 out of Block 5)<br><br>West by Common Road (Main Road of Lollegoda). |
| Total | 0.0133 | (0 - 0 - 05.3) | |

Note : 1. Boundaries pointed out by residents of adjoining lands.

Surveyed on 05th September 2017.

05/09/2017

Registered Licensed Surveyor & Leveller.

R. L. K. JAYASUNDERA
Registered Licensed Surveyor, Leveller
And Court Commissioner and Valuer
Pamunuwa Group, Pilimatalawa.

11 210 4

# විවිධ දැන්වීම්

## බිංගිරිය ප්‍රාදේශීය සභාව

2018 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

බිංගිරිය ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන,කාර්යය කර්තව්‍ය ඉටු කරන, බිංගිරිය ප්‍රාදේශීය සභාවේ ලේකම් වික්‍රමසිංහ මුදියන්සේලාගේ ඩයන රංජන් වික්‍රමසිංහ වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 134(1) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව බිංගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2018 වර්ෂයට අදාළව වරිපනම් බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2017.08.17 දිනැති 2017/1485(1) අංක දරන තීරණය යටතේ මවිසින් තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඩබ්. එම්. ඩී. ආර්. වික්‍රමසිංහ,
ලේකම්,
බිංගිරිය ප්‍රාදේශීය සභාව.

2017 අගෝස්තු 17 වැනි දින,
බිංගිරිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ බිංගිරිය ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දියුණු කළ ප්‍රදේශ යැයි ප්‍රකාශයට පත්කර ඇත්තාවූ ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා 2017 වර්ෂය සඳහා වූ තක්සේරුව 2018 වර්ෂය සඳහා තක්සේරුව ලෙස පිළිගත යුතු බවටත් එකී තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමඟ කියවිය යුතු 134(1) උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත ඉහත කී තක්සේරුව සඳහා වාර්ෂික වටිනාකමින් සියයට 4% වාර්ෂික වරිපනම් බද්දක් නියම විය යුතු බවටත්,

තවද, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ 6 වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව යථෝක්ත වරිපනම් 2018 වර්ෂයේ මාර්තු මස 31, ජුනි මස 30, සැප්තැම්බර් මස 30, දෙසැම්බර් මස 31 යන දිනවලින් අවසන්වන කාර්තු හතර තුළදී සමාන වාරික හතරකින් බිංගිරිය ප්‍රාදේශීය සභාවට ගෙවන ලෙස ද,

තවද, වාර්ෂික වරිපනම් බද්ද එම වර්ෂයෙහි ජනවාරි මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) ක වට්ටමක් ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ කාර්තුවේ වරිපනම් බදු මුදල බිංගිරිය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එම කාර්තුවට අදාළ මුදලින් 5%ක වට්ටමක් ද බිංගිරිය ප්‍රාදේශීය සභාව ලබාදිය යුතු බවටත් තීරණය කරමි.

### *ඉහත කී උපලේඛනය*

| කාර්තුව | ගෙවිය යුතු දිනය | 5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය |
|---|---|---|
| පළමුවන කාර්තුව | 2018.03.31 දින දක්වා | 2018.01.31 |
| දෙවන කාර්තුව | 2018.06.30 දක්වා | 2018.04.30 |
| තුන්වන කාර්තුව | 2018.09.30 දින දක්වා | 2018.07.31 |
| හතරවන කාර්තුව | 2018.12.31 දින දක්වා | 2018.10.31 |

11-176/1

## බිංගිරිය ප්‍රාදේශීය සභාව

2018 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

බිංගිරිය ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන, බිංගිරිය ප්‍රාදේශීය සභාවේ ලේකම් වික්‍රමසිංහ මුදියන්සේලාගේ ඩයන රංජන් වික්‍රමසිංහ වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 134(3) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව බිංගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2018 වර්ෂයට අදළව අක්කර බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2017.08.17 දිනැති 2017/1485(11) අංක දරන තීරණය යටතේ මවිසින් තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඩබ්. එම්. ඩී. ආර්. වික්‍රමසිංහ,
ලේකම්,
බිංගිරිය ප්‍රාදේශීය සභාව.

2017 අගෝස්තු 17 වැනි දින,
බිංගිරිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2017 වර්ෂයේ දී බලාත්මක කරන ලද සත්‍යාක්ෂණය කිරීම 2018 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එකී පනතේ 134 වන වගන්තියේ (3) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර බිංගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රාදේශය තුළ පිහිටියාවූ ද ඉහත කී පනතේ 135 වන වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තාවූ ද, ස්ථිර හෝ නිතිපතා ගොවිතැන් යටතේ වූ,

*(අ)* හෙක්ටයාර් 5ක් හෝ ඊට වැඩි වූ සෑම ඉඩමක් වෙනුවෙන් එකී ඉඩමේ සෑම හෙක්ටයාර්යක්ම මත 2018 වර්ෂය සඳහා රුපියල් දහය (10.00) බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමටත්,

*(ආ)* ඉහත කී පනතේ 134 වැනි වගන්තියේ 3 වැනි උපවගන්තියේ අතුරු විධිවිධානය යටතේ පළාත් පාලන විෂයභාර ගරු අමාත්‍යතුමා විසින් බිංගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය විශේෂ ප්‍රදේශයක් වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1989.03.10 දිනැති *ගැසට් පත්‍රයේ* IV(ආ) වන කොටසේ ප්‍රකාශයට පත් කර ඇති හෙයින් හෙක්ටයාර් එකකට වැඩි එහෙත් හෙක්ටයාර් පහකට අඩු සෑම ඉඩමක්ම මත 2018 වර්ෂය සඳහා රුපියල් පනහක් බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමට, සහ

*(ඇ)* ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (6) වන උපවගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු මස 31, ජූනි මස 30, සැප්තැම්බර් මස 30 හා දෙසැම්බර් මස 31 යන දින වලට පෙර සමාන වාරික හතරකින් බිංගිරිය සභාවට ගෙවිය යුතු බවටත් තීරණය කරමි.

11-176/2

---

## බිංගිරිය ප්‍රාදේශීය සභාව

2018 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම

බිංගිරිය ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන, බිංගිරිය ප්‍රාදේශීය සභාවේ ලේකම් වික්‍රමසිංහ මුදියන්සේලාගේ ඩයන රංජන් වික්‍රමසිංහ වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 150(1) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව බිංගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2018 වර්ෂයට අදළව කර්මාන්ත බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2017.08.17 දිනැති 2017/1485(111) අංක දරන තීරණය යටතේ මවිසින් තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඩබ්. එම්. ඩී. ආර්. වික්‍රමසිංහ,
ලේකම්,
බිංගිරිය ප්‍රාදේශීය සභාව.

2017 අගෝස්තු 17 වැනි දින,
බිංගිරිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**තීරණය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 150 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර බිංගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයෙහි II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2018 වර්ෂය සඳහා නියම විය යුතු බවටත් එකී බද්ද 2018 වර්ෂයේ මාර්තු 31 වැනි දිනට ප්‍රථම කර්මාන්තය කරගෙන යනු ලබන තැනැත්තා විසින් ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් මම තීරණය කරමි.

*ඉහත කී උපලේඛනය*

| *I තීරුව* | | *II තීරුව* පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම | | |
|---|---|---|---|---|
| *අනු. අංකය* | *කර්මාන්තයේ ස්වභාවය* | *රු. 750 නොඉක්මවන අවස්ථාවක* | *රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක* | *රු. 1,500 ඉක්මවන අවස්ථාවක* |
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 1. | හඳුන්කූරු නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 2. | විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 3. | කුෂන් වැඩපල | 500 0 | 750 0 | 1,000 0 |
| 4. | කුළුබඩු නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 5. | බෑග් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 6. | බිම්මල් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 7. | බීරළු වැඩපල | 500 0 | 750 0 | 1,000 0 |
| 8. | මැටි ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 9. | වලං නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | පාපිසි නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | විදුලි බල්බ නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | කජු මද සැකසීම | 500 0 | 750 0 | 1,000 0 |

11-176/3

---

## බිංගිරිය ප්‍රාදේශීය සභාව

### කිසියම් ව්‍යාපාරයක් පවත්වාගෙන යාමට අදළ අතුරු ව්‍යවස්ථාව යටතේ 2018 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීම

බිංගිරිය ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්ය, කර්තව්‍ය ඉටු කරන, බිංගිරිය ප්‍රාදේශීය සභාවේ ලේකම් වික්‍රමසිංහ මුදියන්සේලාගේ ඩයන රංජන් වික්‍රමසිංහ වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 147 වැනි වගන්තිය හා 149 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව බිංගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2018 වර්ෂයට අදළව බලපත්‍ර ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2017.08.17 දිනැති 2017/1485(IV) අංක දරන තීරණය යටතේ මවිසින් තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඩබ්. එම්. ඩී. ආර්. වික්‍රමසිංහ,
ලේකම්,
බිංගිරිය ප්‍රාදේශීය සභාව.

2017 අගෝස්තු 17 වැනි දින,
බිංගිරිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**තීරණය**

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ (477 වැනි අධිකාරිය) 4 ඡේදයේ සඳහන් ප්‍රකාරව 2017.09.15 වැනි දින තීරණ අංක 391:05 යටතේ පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ තබාගෙන සිටින සෑම බල්ලෙකු වෙනුවෙන් රු. 10.00 බැගින් ද, බැල්ලියක් සඳහා රු. 7.50 බැගින් ද, ලියාපදිංචි කිරීමේ ගාස්තුවක් 2018 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, එකී ගාස්තුව 2018 වර්ෂයට ගෙවිය යුතු බවත්, ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එච්. ටී. සරත් වික්‍රමසිංහ,
ලේකම්,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව,
රඹුක්පිටිය.

2017 සැප්තැම්බර් මස 15 වැනි දින,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

11 - 248/5

---

**පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව**

2018 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බද්දක් අය කිරීම

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්ය, කර්තව්‍ය ඉටු කරන, පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ලේකම් එච්. ටී. සරත් වික්‍රමසිංහ වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9:3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 153 වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව 2017.09.15 වැනි දින තීරණ අංක 391:06 යටතේ පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා සීමාව තුළ ඇති සංවර්ධනය නොකළ ඉඩම් සඳහා එම ඉඩමේ ප්‍රාග්ධන බිම් අගයෙන් සියයට දෙකක් (2%) වන බද්දක් 2018 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බවට මම තීරණය කරමි.

එච්. ටී. සරත් වික්‍රමසිංහ,
ලේකම්,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව,
රඹුක්පිටිය.

2017 සැප්තැම්බර් මස 15 වැනි දින,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

11 - 248/6

## පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව

### පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ සංවර්ධන උපදේශක සභාවක් පිහිටුවීම සඳහා අතුරු ව්‍යවස්ථාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122 (1) වගන්තියෙන් සාදන ලද 2013.09.30 වැනි දින මහා සභාවේ අනුමත කරන ලද සංවර්ධන උපදේශක කාරක සභාවක් පිහිටුවීම සඳහා අතුරු ව්‍යවස්ථාව පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ලේකම් එච්. ටී. සරත් වික්‍රමසිංහ වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9:3 වගන්තිය සමඟ කියවිය යුතු එකී සභා පනතින් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල අනුව 2017.09.15 වැනි දින තීරණ අංක 391:10 යටතේ පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ සංවර්ධන උපදේශක කාරක සභාවක් පිහිටුවීම සඳහා අතුරු ව්‍යවස්ථාවේ නිවේදනය මෙයින් පළ කරමි. එම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ කරන දින සිට එකී අතුරු ව්‍යවස්ථාව පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට බලපාන බව මෙයින් පෙන්වා දෙමි.

එච්. ටී. සරත් වික්‍රමසිංහ,
ලේකම්,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව,
රඹුක්පිටිය.

2017 සැප්තැම්බර් මස 15 වැනි දින,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව,
රඹුක්පිටිය.

01. මෙම කොටසේ අතුරු ව්‍යවස්ථාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සංවර්ධන සහ මහජන සුභ සාධන සේවා විධිමත් කිරීම සඳහා ප්‍රාදේශීය සභාවට සහාය දක්වන සංවර්ධන උපදේශක කාරක සභා අතුරු ව්‍යවස්ථාව යැයි හඳුන්වනු ලැබේ.

02. මහා සභා තීරණයක් මත පත්කරනු ලබන මෙම උපදේශක කමිටුවේ සාමාජිකයින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචිකරුවන් විය යුතු අතර සිවිල් අයිතිවාසිකම්වල අනර්ථයක් සිදු නොකරන ලද පුද්ගලයන් විය යුතුය.

03. මෙම අතුරු ව්‍යවස්ථාව මඟින් පත්කරනු ලැබූ සාමාජිකයන්ගේ ධූර කාලය වර්ෂයක් දක්වා බල පැවැත්වේ.

04. සංවර්ධන උපදේශක කාරක සභාවේ සාමාජිකයින් පත් කිරීමේ දී ඔවුන්ගේ කුමන හෝ කාර්යයක් සම්බන්ධයෙන් වුවද විශේෂ හැකියාවක් ඇත්නම් වඩාත් සුදුසු ය.

05. සුවිශේෂ හැකියාවන් ඇති පුද්ගලයන් සොයා ගැනීමට අපහසු අවස්ථාවල විවිධ කාර්යයන් සඳහා නිපුණතාවයක් දක්වන්නේ නම් මේ සඳහා පත් කළ හැකිය.

06. එසේ නොවන අවස්ථාවක දී සමාජ සත්කාර සේවයේ නියැලී සිටින පුද්ගලයන් ඒ සඳහා පත් කළ හැකිය.

07. මෙම සාමාජිකත්වය ස්වේච්ඡාවෙන් සිදු කරනු ලබන ගෞරවනීය උපදේශන සේවාවකි.

<u>සංවර්ධන උපදේශක කාරක සභාවේ කාර්ය භාරයන් :</u>

- සිව් අවුරුදු සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම
- වාර්ෂික අයවැය ඇස්තමේන්තුව කෙටුම්පත් කිරීම
- ඉටු කළ යුතු සංවර්ධන කාර්යයන් ප්‍රමුඛතා ගත කිරීම
- හදිසි ආපදා සහන සැලසීම හා ආපදා වලක්වා ගැනීම
- ආදායම් උත්පාදන මාර්ග හා විශේෂ ව්‍යාපෘති හඳුනා ගැනීම.

08. වර්ෂයක් සඳහා ක්‍රියාත්මක වන සංවර්ධන උපදේශක කාරක සභාවේ නිල කාලය වසරකි.

09. කිසියම් සාමාජිකයෙකු උපදේශක කාරක සභාවෙන් ඉවත් වන්නේ නම් දැනුම් දීමක් ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමාට මාසයකට කලින් දැනුම් දිය යුතුය.

10. උපදේශක කාරක සභා රැස්වීම්වලදී ගණපූර්ණය පවත්වාගෙන යාම පිළිබඳව කමිටු සභාපතිවරයා විසින් සෑහීමකට පත්විය යුතුය.

අර්ථ කථනය:-

**උපදේශක කාරක සභාව :**

සංවර්ධන කාර්යයන් පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කිරීමේ බලතල ව්‍යාප්ත කිරීම සඳහා ප්‍රදේශයේ සුවිශේෂ හැකියාවක් සහිත තැනැත්තෙකුගෙන් සමන්විත කමිටුව.

**ධූරවල කාලය :-**

කමිටු සාමාජිකයන්ගේ රාජකාරීමය කාලය මෙයින් අදහස් වේ.

**සුවිශේෂ හැකියාවන්:-**

සමාජගත කාර්යයන්වලදී ඒවා හොඳින් කිරීමේ හැකියාව ඇති පුද්ගලයින් මින් අදහස් වේ.

**නිපුණතාව:-**

යම්කිසි කාර්යයන් මනාව කිරීමේ හැකියාව.

**සිවිල් අයිතිවාසිකම් සඳහා අන්තර්ගතයන්:-**

ජීවත් වීමේදී වටපිටාව සමඟ සුහදශීලීව ජීවත්වන කිසිම සමාජ විරෝධී ක්‍රියාවකට සම්බන්ධ නොවූවන් මින් අදහස් වේ.

11 - 248/7

---

## පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව

### 2018 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 9 (3) උපවගන්තියේ සැලසී ඇති විධිවිධාන පරිදි පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා ලෙස මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2017.09.15 වැනි දින තීරණ අංක 391:04 යටතේ පහත සඳහන් යෝජනාව ක්‍රියාත්මක කිරීමට මා විසින් තීරණය කරන ලද බැව් මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2018 වර්ෂය සඳහා පනවන ලද ඒ අක්කර බද්ද මාර්තු මස 31, ජූනි මස 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දින වලින් අවසන් සෑම කාර්තුවක් තුල දී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු බවත් වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

2018 වර්ෂය සඳහා සම්පූර්ණ අක්කර බද්ද එම වර්ෂයේ ජනවාරි මස 31 දිනට ප්‍රථම ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ අක්කර බදු වටිනාකමින් සියයට දහයක (10%) ක වට්ටමක් ද, එක් එක් කාර්තුවකට අදාළ අක්කර බද්ද එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) ක වට්ටමක් ද ගෙවනු ලබන අතර,

එකී බදු මුදල් එක් එක් කාර්තුව අවසානයේ නොගෙවනු ලබන අවස්ථාවක දී සියයට පහළොවක (15%) අධි ගාස්තුවක් ද අය කරනු බවට මෙයින් නිවේදනය කරමි.

එච්. ටී. සරත් වික්‍රමසිංහ,
ලේකම්,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව,
රඹුක්පිටිය.

2017 සැප්තැම්බර් මස 15 වැනි දින,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 134 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වුව ද, ඉහත කී පනතේ 135 වන වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තා වුව ද, ස්ථිර හෝ නිති පතා ගොවිතැන් යටතේ වුව ද,

(අ) හෙක්ටයාර 5ක් හෝ ඊට වැඩි සෑම ඉඩමක් වෙනුවෙන් ම එකී ඉඩමේ සෑම හෙක්ටයාර් එකක් මතම 2018 වර්ෂය සඳහා රු. 10.00 බැගින් වන වාර්ෂික බද්දක් පනවා අය කිරීමට; සහ

(ආ) ඉහත කී පනතේ 134 වන වගන්තියේ (3) වන උප වගන්තියේ වැඩි දුරටත් සඳහන් විධිවිධාන යටතේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ IV (ආ) කොටසේ අංක හා 1989.02.03 වැනි දිනැති *ගැසට් පත්‍රය* මඟින් අක්කර බද්ද නියම කිරීම හා අය කිරීමේ කාර්යය සඳහා විශේෂ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ හෙක්ටයාර 5 කට අඩු නමුත් හෙක්ටයාර 1 කට නොඅඩු ඉඩමක් සඳහා 2018 වර්ෂයට රු. 50.00 බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමට සහ,

(ඇ) ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (6) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර යථෝක්ත වාර්ෂික අක්කර බද්ද 2018 මාර්තු මස 31, ජුනි මස 30, සැප්තැම්බර් මස 30 සහ දෙසැම්බර් මස 31 යන දිනවලින් අවසන් වන කාර්තු හතර තුළ දී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි විධිවිධාන කිරීමට පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

11 - 248/8

---

**පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව**

2018 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 09 (3) උප වගන්තියෙන් සැලසී ඇති විධිවිධාන පරිදි පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා ලෙස මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2017.09.15 වන දින තීරණ අංක 391:03 යටතේ පහත සඳහන් යෝජනාව ක්‍රියාත්මක කිරීමට මා විසින් තීරණය කරන ලද බැව් මහජනතාව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2018 වර්ෂය සඳහා පනවන ලද ඒ වරිපනම් මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් මස 31 යන දින වලින් අවසන් වන කාර්තු හතර තුළ දී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු බවත් වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

2018 වර්ෂය සඳහා සම්පූර්ණ වරිපනම් බද්ද එම වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට ප්‍රථම ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් බදු වටිනාකමින් සියයට දහයක (10%) ක වට්ටමක් ද, එක් එක් කාර්තුවකට අදාල වරිපනම් බද්ද එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) ක වට්ටමක් ද ගෙවනු ලැබේ.

එකී බදු මුදල් එක් එක් කාර්තුව අවසානයේ නොගෙවනු ලබන අවස්ථාවක දී සියයට පහළොවක (15%) අධි ගාස්තුවක් ද අය කරනු බවට මෙයින් නිවේදනය කරමි.

එච්. ටී. සරත් වික්‍රමසිංහ,<br>
ලේකම්,<br>
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව,<br>
රඹුක්පිටිය.

2017 සැප්තැම්බර් 15 වැනි දින,<br>
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත දියුණු කල ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කර ඇති ප්‍රදේශවල පිහිටි සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙවල්වල හා නිශ්චය දේපළ වල 2018 වර්ෂයේ වටිනාකම සඳහා 2011 වර්ෂයේ දී සිදු කරන ලද තක්සේරුව 2017 වර්ෂයට පිළිගෙන ඇති හෙයින් එම තක්සේරුවම 2018 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

(ආ) එකී තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව මඟින් දියුණු ගම් ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති එකී දේපළ මත ඉහත කී වාර්ෂික වටිනාකමින් බව්වාගම ප්‍රදේශය වාර්ෂික වටිනාකමින් සියයට පහක (5%) ක වාර්ෂික වරිපනම් බද්දක් ද, කඩියල්ලෙන නගරයට අයත් කොටසෙන් සියයට අටක (8%) ක වරිපනම් බද්දක් ද,

(ඇ) ඒ වරිපනම් එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (6) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර යථෝක්ත වාර්ෂික වරිපනම් බද්ද 2018 මාර්තු මස 31, ජුනි මස 30, සැප්තැම්බර් මස 30 සහ දෙසැම්බර් මස 31 යන දිනවලින් අවසන් වන කාර්තු හතර තුළ දී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි විධාන කිරීමට සහ

එකී බදු මුදල් එක් එක් කාර්තුව අවසානයේ නොගෙවනු ලබන අවස්ථාවක දී සියයට පහළොවක (15%) අධි ගාස්තුවක් ද අය කළ යුතු බවට පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

11 - 248/9

## කුලියාපිටිය ප්‍රාදේශීය සභාව

### 2018 වර්ෂය සඳහා වරිපනම් පැනවීම

කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන, කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ ලේකම් ජයසිංහ ආරච්චිලාගේ සුජීවනී ජයසිංහ වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 134 (1) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2018 වර්ෂයට අදාලව වරිපනම් බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2017.09.06 වැනි දින 6606 අංක දරන තීරණය යටතේ මම තීරණය කරමි. එනම්,

2018 වර්ෂය සඳහා පනවන ලද ඒ වරිපනම්, මාර්තු මස 31, ජුනි මස 30, සැප්තැම්බර් මස 30 හා දෙසැම්බර් මස 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළදී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවට මම තීරණය කරමි.

ජේ. ඒ. සුජීවනී ජයසිංහ,
ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
කුලියාපිටිය ප්‍රාදේශීය සභාව.

### වරිපනම් යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත දියුණු ගම් ප්‍රදේශයක් ලෙස නම් කර ඇති සීමාවේ පිහිටි සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල හා ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා 2012 වර්ෂයේ සිදු කල තක්සේරුව මත අනුගාමී වර්ෂයේ ක්‍රියාත්මක කල තක්සේරුව/සත්‍යෝක්ෂණය 2018 වර්ෂය සඳහා වූ තක්සේරුව/සත්‍යෝක්ෂණය ලෙස සම්මත කල යුතු බවටත් එකී තක්සේරුව මත 1987 අංක 15 ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමඟ කියවිය යුතු 134 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර ඉහත කී වාර්ෂික වටිනාකමෙන් සියයට දෙකයි දශම පහක (2.5%) ක වරිපනමක් 2018 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, සහ ඒ වරිපනම්, එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (6) වන උප වගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු මස 31, ජුනි මස 30, සැප්තැම්බර් මස 30 හා දෙසැම්බර් මස 31 යන දිනවලින් අවසන් වන කාර්තු හතර තුළදී සමාන වාරික හතරකින් කුලියාපිටිය ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවට මම තීරණය කරමි.

2018 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් 2018 වර්ෂයේ ජනවාරි මස 31 වන දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් ප්‍රමාණයෙන් සියයට දහය (10%) ක වට්ටමක් ද, එක් එක් කාර්තුවකට අදාළ වරිපනම් ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහ (5%) ක වට්ටමක් ද ගෙවනු ලබන බව ද මම තීරණය කරමි.

11-206/1

---

## කුලියාපිටිය ප්‍රාදේශීය සභාව

### 2018 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන, කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ ලේකම් ජේ. ඒ. සුජීවනී ජයසිංහ වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 146(1) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2018 වර්ෂයට අදාලව අක්කර බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2017.09.06 වැනි දින 6607 අංක දරන තීරණය යටතේ මම තීරණය කරමි. එනම්,

2018 වර්ෂය සඳහා පනවන ලද අක්කර බද්ද, මාර්තු මස 31, ජුනි මස 30, සැප්තැම්බර් මස 30 හා දෙසැම්බර් මස 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළදී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවට මම තීරණය කරමි.

2018 වර්ෂය සඳහා වන සම්පූර්ණ අක්කර බද්ද 2018 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ අක්කර බදු ප්‍රමාණයෙන් සියයට දහය (10%) ක වට්ටමක්ද, එක් එක් කාර්තුවකට අදළ අක්කර බද්ද ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) ක වට්ටමක්ද ගෙවනු ලැබේ.

ජේ. ඒ. සුජීවනී ජයසිංහ,
ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
කුලියාපිටිය ප්‍රාදේශීය සභාව.

**අක්කර බදු යෝජනාව**

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2017 වර්ෂයේදී බලාත්මක කරන ලද සෙත්‍යාක්ෂණය කිරීම 2018 වර්ෂය සඳහා පිළිගැනීමටත්, එකී පනතේ 134 වන වගන්තියේ (3) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ ද ඉහත කී පනතේ 135 වන වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තාවූ ද ස්ථිර හා නිතිපතා ගොවිතැනක් යටතේ වූ,

(අ) හෙක්ටයාර පහක් හෝ ඊට වැඩි වූ සෑම ඉඩමක් වෙනුවෙන්ම, එකී ඉඩමේ සෑම හෙක්ටයාරයක්ම මත 2018 වර්ෂය සඳහා රුපියල් දහය (රු.10.00) බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමටත්,

(ආ) ඉහත කී පනතේ 134 වන වගන්තියේ (3) වන උපවගන්තියේ අතුරු විධානය යටතේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය විශේෂ ප්‍රදේශයක් වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ iv (ආ) වන කොටසේ 1989 මාර්තු 10 දිනැති *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කර ඇති හෙයින්, හෙක්ටයාර එකකට වැඩි එහෙත් හෙක්ටයාර පහකට අඩු වූ සෑම ඉඩමක් මත, 2018 වර්ෂය සඳහා රුපියල් පනහ (රු.50.00) බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමට, සහ

(ඇ) ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (6) වන උප වගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු මස 31, ජූනි මස 30, සැප්තැම්බර් මස 30 හා දෙසැම්බර් මස 31 යන දිනවලට පෙර සමාන වාරික හතරකින් කුලියාපිටිය ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත් මම තීරණය කරමි.

11-206/2

---

**කුලියාපිටිය ප්‍රාදේශීය සභාව**

2018 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම

කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ ලේකම් ජේ. ඒ. සුජීවනී ජයසිංහ වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 150(1) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2018 වර්ෂයට අදාළව කර්මාන්ත බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2017.09.06 වැනි දින 6608 අංක දරන තීරණය යටතේ මම තීරණය කරමි.

ජේ. ඒ. සුජීවනී ජයසිංහ,
ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
කුලියාපිටිය ප්‍රාදේශීය සභාව.

**කර්මාන්ත බද්ද**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තියේ (1) වන උප වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 150 වන වගන්තියේ (1) උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කුලියාපිටිය ප්‍රාදේශීය සභා බලතල ප්‍රකාර කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයේ I වන තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2018 වර්ෂය සඳහා නියම විය යුතු බවත් එකී කර්මාන්ත බද්ද 2018 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර කුලියාපිටිය ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් මම තීරණය කරමි.

*උපලේඛනය*

| *I වන තීරුව* | | *II වන තීරුව* | | |
|---|---|---|---|---|
| | | *ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්* | | |
| *අනු අංකය* | *කර්මාන්තයේ ස්වභාවය* | *රු. 750 නොඉක්මවන අවස්ථාවක උපරිම බදු මුදල රු. ශත* | *රු.750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක උපරිම බදු මුදල රු. ශත* | *රු. 1500 ඉක්මවන අවස්ථාවක උපරිම බදු මුදල රු. ශත* |
| 1. | රට උළු, ගඩොල්, කළුගල්, බ්ලොක් ගල් | 500 0 | 750 0 | 1,000 0 |
| 2. | වීදුරු උපයෝගී කර ගන්නා භාණ්ඩ නිපදවන ස්ථානයක් සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 3. | බ්‍රේක් ලයිනර් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 4. | සපත්තු නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |

| I වන තීරුව | | II වන තීරුව ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල් | | |
|---|---|---|---|---|
| අනු අංකය | කර්මාන්තයේ ස්වභාවය | 750 නොඉක්මවන අවස්ථාවක උපරිම බදු මුදල රු. ශත | 750 ඉක්මවන එහෙත් රු.1,500 නොඉක්මවන අවස්ථාවක උපරිම බදු මුදල රු. ශත | 1500 ඉක්මවන අවස්ථාවක උපරිම බදු මුදල රු. ශත |
| 5. | මැටි භාණ්ඩ නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 6. | ඇදුම් මහන ස්ථානයක් සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 7. | හඳුන්කූරු නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 8. | කොහු ලණු ඇඹරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 9. | රෙදි පාපිසි නිෂ්පාදනය හා අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | පපඩම් නිෂ්පාදනය හා අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | පොල් ලී පැලීම හා විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | සුරුට්ටු හා බීඩි නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | යකඩ කම්මලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | මල් පෝච්චි නිෂ්පාදනය හා අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | අභ්‍යාස පොත් නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | පැස්ටල් නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | කඩද ාසි නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | මැණික් කපන ඔප දමන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | මෙට්ටා නිපදවන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 20. | ගල් ස්මාරක සාදන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | සයිලන්සර් සෑදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 22. | පින්තූර රාමු කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 23. | කජු මද සැකසීම හා අලෙවි කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 24. | පැලට් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 25. | කුෂන් වැඩපලක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 26. | බිම් මල් නිෂ්පාදනය හා අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 27. | කොන්ක්‍රීට් ගල් කොන්ක්‍රීට් භාණ්ඩ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 28. | විදුලිය නිපදවන ස්ථානයක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 29. | පරිඝණක මෘදුකාංග නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 30. | ගෙතුම් හා ඇගළුම් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 31. | නාම පුවරු සකස් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |

11-206/3

---

## කුලියාපිටිය ප්‍රාදේශීය සභාව

2018 වර්ෂය සඳහා ව්‍යාපාර බදු පැනවීම

කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන, කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ ලේකම් ජේ. ඒ. සුජීවනී ජයසිංහ වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමඟ කියවිය යුතු පනතේ 152(1) උප වගන්තියෙහි විධි විධාන ප්‍රකාරව කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2018 වර්ෂයට අදාලව ව්‍යාපාර බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2017.09.06 දින 6609 අංක දරන තීරණය යටතේ මම තීරණය කරමි.

ජේ. ඒ. සුජීවනී ජයසිංහ,
ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
කුලියාපිටිය ප්‍රාදේශීය සභාව.

### ව්‍යාපාර බද්ද

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබාගැනීම හෝ එකී පනතේ 150 වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ හා වෘත්තියක් නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් කුලියාපිටිය ප්‍රාදේශීය සභා බලප්‍රදේශය ඇතුළත 2018 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම, එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ I තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II වන තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2018 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, බද්දට යටත් යම් තැනැත්තෙකු එකී ව්‍යාපාර බද්ද 2018 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර කුලියාපිටිය ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් මම තීරණය කරමි.

### උපලේඛනය

| | I වන තීරුව<br>බද්ද අදාළ වන වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය | II වන තීරුව<br>ගෙවිය යුතු බද්ද<br>රු. ශ. |
|---|---|---|
| 1. | රු.6,000 නොඉක්මවන අවස්ථාවක | නැත |
| 2. | රු. 6,000 ඉක්මවන නමුත් 12,000 නොඉක්මන විට | 90 0 |
| 3. | රු. 12,000 ඉක්මවන නමුත් 18,750 නොඉක්මවන විට | 180 0 |
| 4. | රු. 18,750 ඉක්මවන නමුත් 75,000 නොඉක්මවන විට | 360 0 |
| 5. | රු. 75,000 ඉක්මවන නමුත් 150,000 නොඉක්මවන විට | 1,200 0 |
| 6. | රු.150,000 ඉක්මවන විට | 3,000 0 |

11-206/4

---

### කුලියාපිටිය ප්‍රාදේශීය සභාව

### කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාමට අදාළ අතුරු ව්‍යවස්ථා යටතේ 2018 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීම

කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ ලේකම් ජේ. ඒ. සුජීවනී ජයසිංහ වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 147 වැනි වගන්තිය හා 149 වගන්තිය යටතේ මා වෙතට පැවරී ඇති බලතල ප්‍රකාරව කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2018 වර්ෂයට අදාළව බලපත්‍ර ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2017.09.06 දින 6611 අංක දරන තීරණය යටතේ මම තීරණය කරමි.

ජේ. ඒ. සුජීවනී ජයසිංහ,
ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
කුලියාපිටිය ප්‍රාදේශීය සභාව.

### බලපත්‍ර ගාස්තු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමග කියවිය යුතු 149 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙම පහත උපලේඛනයෙහි I වන තීරුවේ සඳහන් යම් කාර්යයක් සඳහා කුලියාපිටිය ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් ස්ථානයක් හෝ පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2018 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II තීරුවේ අනුරූපිත සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් 2018 වර්ෂය සඳහා නියම විය යුතු බවට ද,

තව ද, එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරන සංචාරක මණ්ඩල පනතේ කාර්යය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති, පිළිගෙන ඇති හෝටලයක් ආපන ශාලාවක් නවාතැන්පලක් වන විටදී ඊට අදළ බලපත්‍ර ලබා දීමේදී එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ 2017 වර්ෂයේ ලැබීම් වලින් 1% ක් බලපත්‍ර ගාස්තුව ලෙස 2018 වර්ෂය සඳහා නියම විය යුතු බවටත්, මෙම බලපත්‍ර ගාස්තු 2018 වර්ෂයේ අප්‍රේල් මස 30 වන දිනට පෙර කුලියාපිටිය ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් මම තීරණය කරමි.

**උපලේඛනය**

*I වන තීරුව* — *II වන තීරුව ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්*

| *අනු. අංකය* | *කර්මාන්තයේ ස්වභාවය* | *රු. 750 නොඉක්මවන අවස්ථාවක උපරිම බදු මුදල* | *රු.750 ඉක්මවන එහෙත් 1,500 නොඉක්මවන අවස්ථාවක උපරිම බදු මුදල* | *රු. 1,500 ඉක්මවන අවස්ථාවක උපරිම බදු මුදල* |
|---|---|---|---|---|
| | | *රු. ශත* | *රු. ශ.* | *රු. ශ.* |
| *අන්තරාදයක ව්‍යාපාර :* | | | | |
| 01. | කළුගල් කඩන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 02. | කඩල බයිට් වර්ග නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 03. | අයිස් පැකට් කිරීම හා අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 04. | අයිස් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 05. | තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 06. | යන්ත්‍රානුසාරයෙන් පොල්තෙල් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 07. | තෙල් මෝලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 08. | කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිපදවීම (කොහු මෝල්) | 500 0 | 750 0 | 1,000 0 |
| 09. | කොහු හෝ වෙනත් කෙඳිවලින් භාණ්ඩ නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | ලුණු ඇඹරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | ලී මෝලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | යන්ත්‍රානුසාරයෙන් ක්‍රියාත්මක වන ලී මෝලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | ස්වර්ණාභරණ නිෂ්පාදනය හා අළුත්වැඩියාව | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | කම්මලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | හිස් ගෝනි හෝ බෝතල් ගබඩා කිරීම හා විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | පාපැදි අළුත්වැඩියාව | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | රතිඤ්ඤා ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | විදුලි බලයෙන් ක්‍රියාත්මක වන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | අතින් ක්‍රියාත්මක වන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 20. | යන්ත්‍රානුසාරයෙන් උළු නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | භූමිතෙල් කරත්තයක් සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 22. | භූමිතෙල් බැරල් 05-10 දක්වා | 500 0 | 750 0 | 1,000 0 |
| 23. | භූමිතෙල් බැරල් 10 ට වැඩි | 500 0 | 750 0 | 1,000 0 |
| 24. | ආමේචර් එතීම (මෝටර් එතීම) | 500 0 | 750 0 | 1,000 0 |
| 25. | ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 26. | බැටරි ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 27. | රූපවාහිනී යන්ත්‍ර අළුත්වැඩියාව | 500 0 | 750 0 | 1,000 0 |
| 28. | විදුලි උපකරණ අළුත්වැඩියාව | 500 0 | 750 0 | 1,000 0 |
| 29. | ගෑස් පිරවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 30. | ගෑස් සිලින්ඩර් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 31. | ඉංග්‍රීසි බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම(පෞද්ගලික) | 500 0 | 750 0 | 1,000 0 |
| 32. | දේශීය බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම (පෞද්ගලික) | 500 0 | 750 0 | 1,000 0 |
| 33. | ඉංග්‍රීසි බෙහෙත් ද්‍රව්‍ය ගබඩා කිරීම හා විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 34. | දේශීය බෙහෙත් ද්‍රව්‍ය ගබඩා කිරීම හා විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |

| *I වන තීරුව* | | *II වන තීරුව ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්* | | |
|---|---|---|---|---|
| *අනු. අංකය* | *කර්මාන්තයේ ස්වභාවය* | *රු. 750 නොඉක්මවන අවස්ථාවක උපරිම බදු මුදල* | *රු.750 ඉක්මවන එහෙත් 1,500 නොඉක්මවන අවස්ථාවක උපරිම බදු මුදල* | *රු. 1,500 ඉක්මවන අවස්ථාවක උපරිම බදු මුදල* |
| | | *රු. ශත* | *රු. ශ.* | *රු. ශ.* |
| 35. | දත් බඳින ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 36. | බලවේග පේෂකර්මාන්තයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 37. | ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවිය හා ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 38. | වැලි ගොඩදැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 39. | පොත් සාප්පු, ලිපිද්‍රව්‍ය, ගබඩා කිරීම හා අළෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 40. | මිශ්‍ර පොහොර අලෙවි කිරීම (කෘත්‍රිම) | 500 0 | 750 0 | 1,000 0 |
| 41. | කෘෂි රසායනික ද්‍රව්‍ය හෝ කෘෂි උපකරණ විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 42. | පොල් කටු අඟුරු නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 43. | කටුවලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 44. | සිගරැට්, දුම්කොළ තොග වශයෙන් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 45. | සබන් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 46. | පරණ ලෝහ භාණ්ඩ ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 47. | වඩුමඩුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 48. | පොල් ලී නිෂ්පාදනය හා විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 49. | සිසිල් බීම නිපදවීම හා ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 50. | රසකැවිලි නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 51. | කොහු ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 52. | කොහු කෙඳි පිරීම හා වේලීම | 500 0 | 750 0 | 1,000 0 |
| 53. | කොහු භාණ්ඩ නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 54. | කෙඳි සායම් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 55. | තීන්ත හෝ වාර්නිෂ් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 56. | මිරිස් ධාන්‍ය හා කෝපි වැනි කුළු බඩු ඇඹරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 57. | ටයර් හි ටියුබ් වෝල්කනයිසිං කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 58. | යන්ත්‍රානුසාරයෙන් ටයර් අළුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 59. | කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප හෝ එවැනි භාණ්ඩ නිපදවීම හා ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 60. | පයිබර් ග්ලාස් භාණ්ඩ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 61. | සිමෙන්ති බ්ලොක් ගල් වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 62. | ගඩොල් නිපදවීම හා පිළිස්සීම | 500 0 | 750 0 | 1,000 0 |
| 63. | බේකරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 64. | පපඩම් නිපදවීම හා අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 65. | කජු ගබඩා කිරීම හෝ මද නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 66. | කිරි අලෙවිසලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 67. | කොප්පරා නිපදවීම හා විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 68. | කපාපු පොල් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 69. | හුණු ගල් පිලිස්සීම | 500 0 | 750 0 | 1,000 0 |
| 70. | බොරළු කපන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

| I වන තීරුව | | II වන තීරුව ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල් | | |
|---|---|---|---|---|
| අනු. අංකය | කර්මාන්තයේ ස්වභාවය | රු. 750 නොඉක්මවන අවස්ථාවක උපරිම බදු මුදල | රු.750 ඉක්මවන එහෙත් 1,500 නොඉක්මවන අවස්ථාවක උපරිම බදු මුදල | රු. 1,500 ඉක්මවන අවස්ථාවක උපරිම බදු මුදල |
| | | රු. ශත | රු. ශ. | රු. ශ. |
| 71. | මැටි වලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 72. | ආහාර පාන සැපයීම | 500 0 | 750 0 | 1,000 0 |
| 73. | භෝජනාගාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 74. | පොල් ගෙඩි රැස්කිරීම හා විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 75. | සිසිල් බීම සලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 76. | සිංහල බෙහෙත් ද්‍රව්‍ය අළෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 77. | ඇඳුම් නිෂ්පාදනය | | | |
| 78. | බතික් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 79. | ඇගළුම් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 80. | මිණී පෙට්ටි නිෂ්පාදනය හා විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 81. | ලී කැටයම් කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

*අප්‍රසන්න ව්‍යාපාර :*

| | | | | |
|---|---|---|---|---|
| 1. | සම් පදම් කිරීම හෝ සම් ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 2. | සම් භාණ්ඩ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 3. | කිරි පට්ටියක් පවත්වාගෙන යාම (දෙනුන් 05-25) | 500 0 | 750 0 | 1,000 0 |
| 4. | කිරි පට්ටියක් පවත්වාගෙන යාම (දෙනුන් 25-50) දක්වා | 500 0 | 750 0 | 1,000 0 |
| 5. | කිරි පට්ටියක් පවත්වාගෙන යාම (දෙනුන් 50ට වැඩි) | 500 0 | 750 0 | 1,000 0 |
| 6. | කුකුල් පට්ටියක් පවත්වාගෙන යාම (කුකුළන්/කිකිළියන් 100 දක්වා) | 500 0 | 750 0 | 1,000 0 |
| 7. | කුකුල් පට්ටියක් පවත්වාගෙන යාම (කුකළන්/කිකිළියන් 100ට වැඩි) | 500 0 | 750 0 | 1,000 0 |
| 8. | කුකුල් පට්ටියක් පවත්වාගෙන යාම (කුකුළන්/කිකිළියන් 200ට වැඩි) | 500 0 | 750 0 | 1,000 0 |
| 9. | එළු පට්ටියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | ගව පට්ටියක් පවත්වාගෙන යාම (දෙනුන් 05-25) | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | ගව පට්ටියක් පවත්වාගෙන යාම (දෙනුන් 25-50) | | | |
| 12. | ගව පට්ටියක් පවත්වාගෙන යාම (දෙනුන් 50 ට වැඩි) | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | ග්‍රොසරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | කරවල ගබඩා කරන ස්ථානයක් සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | කරවල කඩයක් සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | කුකුළු කෑම ගබඩා කිරීම හා විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | සත්ව ආහාර ගබඩාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | රා එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | විනාකිරි නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 20. | පළතුරු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | එළවළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

| *I වන තීරුව* | | *II වන තීරුව ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්* | | |
|---|---|---|---|---|
| *අනු. අංකය* | *කර්මාන්තයේ ස්වභාවය* | *රු. 750 නොඉක්මවන අවස්ථාවක උපරිම බදු මුදල රු. ශත* | *රු.750 ඉක්මවන එහෙත් 1500 නොඉක්මවන අවස්ථාවක උපරිම බදු මුදල රු. ශත* | *රු.1500 ඉක්මවන අවස්ථාවක උපරිම බදු මුදල රු. ශත* |
| 22. | අලුත් මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 23. | ගෝ ඝාතකාගාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 24. | ශීතකළ මස්/මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 25. | බිත්තර ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 26. | පුද්ගලික මාළු වෙළෙඳ සැලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 27. | සංචාරක මාළු අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 28. | කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 29. | ලැගුම් නිවාස පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 30. | හෝටලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 31. | බත් කඩයක්, ආපනශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 32. | අයිස් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

*අප්‍රසන්න හා අන්තරායදයක වෙළඳාම් :*

| | | | | |
|---|---|---|---|---|
| 1. | ලොන්ඩරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 2. | රතිඤ්ඤා නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 3. | බැටරි චාජ් කරන ස්ථානයක් සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 4. | වෑල්ඩින් කිරීම හෝ ග්‍රීල් වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 5. | මෝටර් රථ අළුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 6. | මෝටර් වාහන සේවා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 7. | බෙලෙක් වැඩ කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 8. | මෝටර් වාහන බොඩි ගැසීමේ ගරාජයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 9. | ස්නැක් බාර් එකක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | ටේලර් සාප්පුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | සිමෙන්ති ගබඩා කිරීම හා විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | නරක් විය හැකි ආහාර ද්‍රව්‍ය, කුළු බඩු තොග වශයෙන් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | යතුරු පැදි අලුත්වැඩියාව | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | යකඩ භාණ්ඩ නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |

## කුලියාපිටිය ප්‍රාදේශීය සභාව

### 2018 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ ලේකම් ජේ. ඒ. සුජීවනී ජයසිංහ වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2018 වර්ෂයට අදාළව වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2017.09.06 දින 6614 අංක දරන තීරණය යටතේ මම තීරණය කරමි.

ජේ. ඒ. සුජීවනී ජයසිංහ,<br>
ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,<br>
කුලියාපිටිය ප්‍රාදේශීය සභාව.

#### වාහන හා සතුන් පිළිබඳ බද්ද

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වැනි වගන්තිය සහ හතර වන උපලේඛනයේ විධිවිධානවලින් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2018 වර්ෂයේදී පහත උපලේඛනයේ I වන තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකු මතම, එහි II වන තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත බද්දක් 2018 වර්ෂය සඳහා පනවා අය කිරීමට මම තීරණය කරමි.

*උපලේඛනය*

| *I වන තීරුව* | | *II වන තීරුව* |
|---|---|---|
| i. | මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක්, හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා | රු. 25 0 |
| ii. | සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා | |
| | (අ)වෙළෙඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම් | රු. 18 0 |
| | (ආ)වෙළෙඳ නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම් | රු. 4 0 |
| iii. | සෑම කරත්තයක් සඳහා | රු. 20 0 |
| iv. | සෑම අත් කරත්තයක් සඳහා | රු. 10 0 |
| v. | සෑම රික්ෂෝවක් සඳහා | රු. 7 50 |
| vi. | සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා | රු. 15 0 |
| vii. | සෑම ඇතෙකු සඳහා | 50 0 |

2. විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, වීල්බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්යය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළෙඳ කාර්ය සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

11-206/6

---

## කුලියාපිටිය ප්‍රාදේශීය සභාව

### 2018 වර්ෂය සඳහා සංචාරක වෙළෙඳාම පිළිබඳ ගාස්තු පැනවීම

කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන, කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ ලේකම් ජේ. ඒ. සුජීවනී ජයසිංහ වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2018 වර්ෂයට අදාළව සංචාරක වෙළෙඳාම පිළිබඳ ගාස්තු පැනවීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2017.09.06 දින 6615 අංක දරන තීරණය යටතේ මම තීරණය කරමි.

ජේ. ඒ. සුජීවනී ජයසිංහ,<br>
ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,<br>
කුලියාපිටිය ප්‍රාදේශීය සභාව.

**2018 වර්ෂයට සංචාරක වෙළඳාම පිළිබඳ ගාස්තු පැනවීම**

වයඹ පළාතේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් සාදන ලදුව 2010.07.16 වැනි දින අංක 1663 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකරන ලද 2011.01.18 වැනි දින වයඹ පළාත් සභා රැස්වීමේදී ස්ථිර කරන ලද බව 2011.04.28 වැනි දිනැති අංක 1703/18 දරන අති විශේෂ *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කර ඇති සංචාරක වෙළඳාම් සම්බන්ධ අතුරු ව්‍යවස්ථාව කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කළ යුතු බව එකී අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව පහත උපලේඛනයේ සඳහන් ගාස්තු 2018 වර්ෂය සඳහා පනවා අය කළ යුතු යැයි මම තීරණය කරමි.

| *අනු අංකය* | *ව්‍යාපාරයේ ස්වභාවය* | ගාස්තුව *ස්ථානයේ වාර්ෂික වටිනාකම* *රුපියල් 750.00 නොයික්මවන අවස්ථාවක රු. ශත* | *රුපියල් 750.00 ඉක්මවන එහෙත් රුපියල් 1,500.00 නොඉක්මවන අවස්ථාවක රු. ශත* | *රුපියල් 1500.00 ඉක්මවන අවස්ථාවක රු. ශත* |
|---|---|---|---|---|
| 1. | තැඹිලි කුරුම්බා වෙළඳාම | 500 0 | 750 0 | 1,000 0 |
| 2. | කඩල, වඩේ, මුරුක්කු බයිට් පැකට් විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 3. | රෙදි අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 4. | පාවහන් වෙළඳාම | 500 0 | 750 0 | 1,000 0 |
| 5. | සාප්පු බඩු අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 6. | මල්පැළ, එළවළු පැල හා පළතුරු පැළ අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 7. | පොත්, පත්තර වෙළඳාම | 500 0 | 750 0 | 1,000 0 |
| 8. | ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම | 500 0 | 750 0 | 1,000 0 |
| 9. | ධාන්‍ය වර්ග පැකට් කර විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | එළවළු හා පළතුරු වෙළඳාම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | කෘත්‍රිම මල් අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | ජංගම බැංකු සේවා | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | පහන්තිර, හඳුන්කූරු ඇතුළු පූජා භාණ්ඩ අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | ඔරලෝසු වෙළඳාම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | කරත්ත වල පාන්, බනිස් අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |

11-206/7

---

## කුලියාපිටිය ප්‍රාදේශීය සභාව

### 2018 වර්ෂයට ප්‍රචාරක දැන්වීම් බලපත්‍ර ගාස්තු පැනවීම

කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන, කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ ලේකම් ජේ. ඒ. සුජීවනී ජයසිංහ වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තියෙහි විධි විධාන ප්‍රකාරව කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2018 වර්ෂයට ප්‍රචාරක දැන්වීම් බලපත්‍ර ගාස්තු පැනවීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2017.09.06 දින 6616 අංක දරන තීරණය යටතේ මම තීරණය කරමි.

ජේ. ඒ. සුජීවනී ජයසිංහ,
ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
කුලියාපිටිය ප්‍රාදේශීය සභාව.

**2018 වර්ෂයට ප්‍රචාරක දැන්වීම් බලපත්‍ර ගාස්තු පැනවීම**

පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදු 1988 අගෝස්තු 23 දින අංක 520/7 දරන අති විශේෂ *ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශිත අතුරු ව්‍යවස්ථා මාලාවේ ප්‍රචාරක දැන්වීම් හා දෘෂ්‍ය පරිසරය පිළිබඳව අතුරු ව්‍යවස්ථාව පිළිගෙන ක්‍රියාත්මක කරන බව කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ 2000.05.04 දින මහ සභා රැස්වීමේ ඒකමතිකව සභා සම්මත කර 2000.07.14 දිනැති *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කර ඇති හෙයින් එම අතුරු ව්‍යවස්ථා ප්‍රකාරව කුලියාපිටිය බල ප්‍රදේශයේ ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා පහත උපලේඛනයේ ගාස්තුව අය කිරීමට මම තීරණය කරමි.

*උපලේඛන අංක 01*

| | | |
|---|---|---|
| | | *රු. ශත* |
| *ප්‍රචාරක දැන්වීම් සඳහා බලපත්‍ර ගාස්තු - 2018 වර්ෂය සඳහා :* | | |
| 1. | එක් මසකට වැඩි මාස 03 කට අඩු කාල සීමාවක් සඳහා බැනර්, කටවුට් ප්‍රදර්ශනය කරනු ලබන ඕනෑම ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග අඩියකට | 20 0 |
| 2. | ස්ථිර දැන්වීම් පුවරු වර්ෂයක කාලයක් සඳහා වර්ග අඩියකට | 100 0 |
| 3. | තාවකාලික දැන්වීම් පුවරු මසක කාලයක් සඳහා වර්ග අඩියකට | 50 0 |

11-206/8

---

**කුලියාපිටිය ප්‍රාදේශීය සභාව**

2018 වර්ෂයට තාවකාලික වෙළඳ කුටි, වෙළඳසැල් සඳහා ගාස්තු පැනවීම

කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන, කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ ලේකම් ජේ. ඒ. සුජීවනී ජයසිංහ වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තියෙහි විධි විධාන ප්‍රකාරව කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2018 වර්ෂයට ප්‍රචාරක දැන්වීම් බලපත්‍ර ගාස්තු පැනවීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2017.09.06 දින 6617 අංක දරන තීරණය යටතේ මම තීරණය කරමි.

ජේ. ඒ. සුජීවනී ජයසිංහ,
ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
කුලියාපිටිය ප්‍රාදේශීය සභාව.

**2018 වර්ෂයට තාවකාලික වෙළඳ කුටි, වෙළඳසැල් සඳහා බදු පැනවීම**

2018 වර්ෂයට අදාලව කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ 01 වන උපලේඛනයේ සඳහන් වෙළඳකුටි සඳහා ගාස්තු පනවා අය කල යුතු බවත්, 02 වන උපලේඛනයේ සඳහන් වෙළඳසැල් සඳහා ගාස්තු පනවා අය කල යුතු බවත් මම තීරණය කරමි.

*උපලේඛන 01*

*කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රචාරක කුටි සඳහා*
*බලපත්‍ර ගාස්තු*

| | |
|---|---|
| එක් දිනකට | රු. 1,000 0 |
| සතියකට | රු. 1,500 0 |
| මසකට | රු. 3,000 0 |

උපලේඛනය 02

*තාවකාලික වෙළඳ සැල් බදු*

උත්සව අවස්ථා සඳහා තාවකාලික වෙළඳ සැල් වලින් කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පහත උපලේඛනයේ සඳහන් පරිදි ගාස්තු අය කිරීමට මම තීරණය කරමි.

උපලේඛනය - 02

| | | |
|---|---|---|
| 1. | වර්ග අඩි 1 සිට 5 දක්වා දිනකට | රු. 25 0 |
| 2. | වර්ග අඩි 6 සිට 10 දක්වා දිනකට | රු. 50 0 |
| 3. | වර්ග අඩි 11 සිට 15 දක්වා දිනකට | රු. 75 0 |
| 4. | වර්ග අඩි 16 සිට 25 දක්වා දිනකට | රු. 100 0 |
| 5. | වර්ග අඩි 26 සිට 50 දක්වා දිනකට | රු. 125 0 |
| 6. | වර්ග අඩි 51 සිට 100 දක්වා දිනකට | රු. 150 0 |
| 7. | වර්ග අඩි 101 සිට 150 දක්වා දිනකට | රු. 175 0 |
| 8. | වර්ග අඩි 151 සිට 200 දක්වා දිනකට | රු. 200 0 |
| 9. | වර්ග අඩි 201 සිට 300 දක්වා දිනකට | රු. 300 0 |
| 10. | වර්ග අඩි 301 සිට 400 දක්වා දිනකට | රු. 400 0 |
| 11. | වර්ග අඩි 401 සිට 500 දක්වා දිනකට | රු. 500 0 |
| 12. | ඊට වැඩිවන සෑම අවස්ථාවකදී ම දිනකට | රු. 700 0 |
| 13. | අයිස්ක්‍රීම් බයිසිකලයක් සඳහා දිනකට | රු. 100 0 |
| 14. | අයිස්ක්‍රීම් වෑන් රථයක් සඳහා දිනකට | රු. 500 0 |
| 15. | ජංගම වෙළඳාම කඩ, රස කැවිලි සඳහා දිනකට | රු. 100 0 |
| 16. | පෞද්ගලික රථගාල් සඳහා දිනකට | රු. 750 0 |
| 17. | පාපැදි හා යතුරුපැදි ආරක්ෂා කරන ස්ථාන දිනකට රු. 500 0 | |

11-206/9

---

**කුලියාපිටිය ප්‍රාදේශීය සභාව**

2018 වර්ෂයට සපයනු ලබන සේවාවන් හා දේපල කුලියට දීම වෙනුවෙන් ගාස්තු අය කිරීම

කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය, කර්තව්‍ය ඉටු කරන, කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ ලේකම්,, ජේ. ඒ. සුජීවනී ජයසිංහ වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තියෙහි විධි විධාන ප්‍රකාරව කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2018 වර්ෂයට සපයනු ලබන සේවාවන් හා දේපල කුලියට දීම වෙනුවෙන් ගාස්තු පැනවීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2017.09.06 දින 6618 අංක දරන තීරණය යටතේ මම තීරණය කරමි.

ජේ. ඒ. සුජීවනී ජයසිංහ,
ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
කුලියාපිටිය ප්‍රාදේශීය සභාව.

2018 වර්ෂයට සපයනු ලබන සේවාවන් හා දේපල කුලියට දීම වෙනුවෙන් ගාස්තු අය කිරීම

2018 වර්ෂය සඳහා කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල වත්කම් සඳහා 01 වන උපලේඛනයේ සඳහන් ගාස්තු ද, සේවා සඳහා 02 වන උපලේඛනයේ සඳහන් ගාස්තු ද පනවා අය කල යුතු බවට මම තීරණය කරමි.

**උපලේඛනය 01**

| *අනු. අංකය* | *දේපල* | *ගෙවිය යුතු ගාස්තු රු. ශ.* |
|---|---|---|
| 1 | මුදල් අය කරන සංදර්ශන/සේල් පැවැත්වීම සඳහා සභාව සතු ක්‍රීඩා භූමි බදු දීම දිනකට | රු. 3,000 0 |
| | ආපසු ගෙවන ඇප තැන්පත් මුදල | 5,000 0 |
| 2. | මුදල් අය නොකර වෙනත් කටයුතු සඳහා ක්‍රීඩා භූමි බදු දීම දිනකට | 1,000 0 |
| | ආපසු ගෙවන ඇප තැන්පත් මුදල | 2,000 0 |
| 3. | සභාව සතු දේපල වෙළඳ කුටියක් පවත්වාගෙන යාමට දිනකට | රු. 500 0 |
| 4. | ප්‍රජා ශාලාව උත්සව සඳහා දිනකට විදුලි පහසුකම් සහිතව දීම | 8,000 0 |
| | ආපසු ගෙවන ඇප තැන්පත් මුදල | 3,000 0 |
| 5. | ප්‍රජා ශාලාව සඳහා මුදල් අය නොකරන රැස්වීම්, සම්මන්ත්‍රණ, වැඩමුළු ආදියට දිනකට | 5,000 0 |
| | ආපසු ගෙවන ඇප තැන්පත්මුදල | 2,000 0 |

**උපලේඛනය 02**

| *අනු අංකය* | *සේවා වර්ගය* | | *ගෙවිය යුතු ගාස්තුව රු. ශ.* |
|---|---|---|---|
| 01. | වීථි රේඛා සහතිකයක් නිකුත් කිරීමේ ගාස්තුව | | 600 0 |
| 02. | ගොඩනැගිලි අයදුම්පත් ගාස්තු | | 200 0 |
| 03. | බැකෝ යන්ත්‍රය සඳහා පැය 1 කට | | 2,861 0 |
| 04. | ගල් රෝල දිනකට | | 6,325 0 |
| 05. | වතුර බවුසරය 1 ක් සඳහා | | 1,350 (50 x 1 කි මී.) |
| 06. | ට්‍රැක්ටරය දිනකට | | 4,500 0 |
| 07. | ගලි බව්සරය ලෝඩ් 1 ක් සඳහා | | 1,400 (75 x 1 කි.මී.) + 2,600 |
| 08. | ටෙන්ඩර් පෝරම ගාස්තු | ඉඩම් බදු දීම සඳහා | 300 |
| | | අනෙකුත් වත්කම් සඳහා | -1,000 0 |
| 09. | ඉඩම් අනු බෙදුම් පෝරම ගාස්තු | | 250 0 |
| 10. | වෙනත් ඕනෑම සහතිකයක් නිකුත් කිරීම සඳහා ගෙවීම | | 500 0 |
| 11. | ගොඩනැගිලි ඉදිකිරීම සඳහා පෙරසැරි ගාස්තු නේවාසිකව වර්ග අඩියකට | කොටසක් තනා ඇතිනම් | - 2 0 |
| | | නව නිවසක් නම් | - 1 0 |
| 12. | ගොඩනැගිලි ඉදිකිරීම සඳහා පෙරසැරි ගාස්තු නේවාසික නොවන වර්ග අඩියකට | | රු. 2 0 |
| 13. | ඉඩම් අනු බෙදුම් අනුමත කිරීමේ ගාස්තු | සංවර්ධන සැලසුමට | -500 0 |
| | | කට්ටි සැලසුමට | -500 0 |
| 14. | අනුකූලතා සහතිකයක් නිකුත් කිරීම | | 500 0 |
| 15. | දේපල අයිතිය වෙනස් කිරීම් අයදුම්පත් | | 100 0 |
| 16. | වරිපනම් ලේඛනයට නම ඇතුළත් කිරීම | | 100 0 |
| 17. | පිඹුරුපත් අනුමත කිරීම | | 500 0 |
| 18. | ගොඩනැගිලි ඉල්ලුම්පත්‍රවල කාලය දීර්ඝ කිරීම වසරකට | | 200 0 |
| 19. | පරිසර බලපත්‍ර ගෙවීම | | 1,250 0 |
| 20. | සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ගාස්තු | | 500 0 |
| 21. | කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමේ ගාස්තු | | 1,500 0 |
| 22. | අනතුරුදායක ගස් පරීක්ෂාව | | 500 0 |
| 23. | දියර පොහොර ලීටර් 01 ක් | | 5 0 |

11-206/10

---

**කුලියාපිටිය ප්‍රාදේශීය සභාව**

2018 වර්ෂය සඳහා වාහන නවතා තැබීමේ ගාස්තු අය කිරීම

කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ ලේකම් ජේ. ඒ. සුජීවනී ජයසිංහ වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2018 වර්ෂයට වාහන නවතා තැබීම වෙනුවෙන් ගාස්තු අයකිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2017.09.06 දින 6619 අංක දරන තීරණ යටතේ මම තීරණය කරමි.

ජේ. ඒ. සුජීවනී ජයසිංහ,
ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
කුලියාපිටිය ප්‍රාදේශීය සභාව.

**2018 වර්ෂය සඳහා වාහන නවතා තැබීමේ ගාස්තු අයකිරීම**

කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල 2018 වර්ෂය සඳහා වාහන නවතා තැබීමේ ගාස්තු අය කිරීම 01 වන උපලේඛනයේ සඳහන් ගාස්තු පනවා අය කළ යුතු බවට මම තීරණය කරමි.

උපලේඛන 01

| *අනු. අංකය* | | *එක් වරක් පමණක් ගෙවන ලියාපදිංචි ගාස්තුව* | *නවතා තැබීමේ වාර්ෂික ගාස්තුව* |
|---|---|---|---|
| | | රු. ශත | රු. ශත |
| 01. | කුලී ත්‍රීරෝද රථ සඳහා | 100 0 | 500 0 |
| 02. | මඟී ප්‍රවාහන බස්රථ නොවන කුලී වෑන් රථ සඳහා | 100 0 | 700 0 |

11-206/11

---

**කුලියාපිටිය ප්‍රාදේශීය සභාව**

2018 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන, කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ ලේකම් ජේ. ඒ. සුජීවනී ජයසිංහ වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තියෙහි විධි විධාන ප්‍රකාරව කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2018 වර්ෂයට සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2017.09.06 දින 6620 අංක දරන තීරණය යටතේ මම තීරණය කරමි.

ජේ. ඒ. සුජීවනී ජයසිංහ,
ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
කුලියාපිටිය ප්‍රාදේශීය සභාව.

**2018 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම**

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වන වගන්තියේ (1) වන උපවගන්තිය අනුව ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර, කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි කිසියම් ඉඩමක් ගොඩනැගිලි ඉදිකිරීමට හෝ ස්ථාවර *නැතහොත්* නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු විටක හෝ යුක්ති සහගත වියදමකින් ඒ ඉඩම එකී යම් කාර්යයක් සඳහා සංවර්ධනය කළ හැකි විටක එවැනි යම් ඉඩමක,

1. ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම්; හෝ

2. ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති විටක, හෝ

එකී ඉඩම සංවර්ධන නොකළ ඉඩමක් වශයෙන් සැලකීමටත් සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම මත 2018 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ ප්‍රාග්ධන අගයෙන් සියයට දශම දෙක (0.2%) ක වාර්ෂික බද්දක් පැනවීමටත්, එකී සංවර්ධනය නොකළ ඉඩම මත බද්ද 2018 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර කුලියාපිටිය ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු යැයි විධාන කිරීමටත් මම තීරණය කරමි.

11-206/12

## පිටබැද්දර ප්‍රාදේශීය සභාව

2018 වර්ෂය සඳහා වෙළඳ බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 149 වන වගන්තිය සමග කියවිය යුතු එනී පනතේ 147 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (ආ) ඡේදයේ පැවරී ඇති බලතල ප්‍රකාර ප්‍රාදේශීය සභා පනතේ හෝ ඒ යටතේ සාදන ලද 1988.08.23 දින 520/7 සහා විශේෂ *ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශිත සම්මත අතුරු ව්‍යවස්ථාව 2007.12.28 වැනි දින අංක 1530 *ගැසට් පත්‍රයේ* නිවේදනයක් මගින් පිටබැද්දර ප්‍රාදේශීය සභාව පිළිගෙන ඇති අතර ඒ අනුව බලපත්‍රයක් ලබාගත යුතු පහත තීරුවේ පළවන පරිශ්‍රයක්, ස්ථානයක් සම්බන්ධයෙන් දෙවන තීරුවේ සඳහන් අනුප්‍රමාණයෙන් යුත් බලපත්‍ර ගාස්තුවක් 2018 වර්ෂයට පනවා අය කිරීමටත්, 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනත අනුව සංචාරක මණ්ඩලයේ අනුමත හෝටලයක්, ආපන ශාලාවක්, නවාතැන් පොළක් සඳහා බලපත්‍ර ලබා දීමේදී අදාළ වර්ෂයට පෙර වර්ෂයේ ලැබීම් වලින් 1%ක බලපත්‍ර ගාස්තුවක් 2018 වර්ෂයට පනවා අය කිරීමටත් පහත සඳහන් සියළුම බලපත්‍ර 2018.03.31 දිනට පෙර අදාළ ස්ථානය විසින් ලබා ගත යුතු බවත් පිටබැද්දර ප්‍රාදේශීය සභාවේ ලේකම් නෙළුව ලියනගේ ප්‍රේමසිරි වන මා විසින් 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 09 (03) වගන්තිය ප්‍රකාරව 2017 ඔක්තෝබර් මස 10 දින තීරණ අංක 392 යටතේ තීරණය කරන බව මෙයින් දන්වා සිටිමි.

නෙළුව ලියනගේ ප්‍රේමසිරි,
ලේකම්,
පිටබැද්දර ප්‍රාදේශීය සභාව.

2017 ඔක්තෝබර් මස 10 වන දින,
පිටබැද්දර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### උපලේඛන අංක 01

*1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය යටතේ වෙළඳ බලපත්‍ර ගාස්තු*

| | *වෙළඳාමේ ස්වභාවය* | *වාර්ෂික වටිනාකම රු.750.00 ඉක්මවන විට රු. ශත* | *වාර්ෂික වටිනාකම රු.750.00 සිට රු.1500.00 දක්වා රු. ශත* | *වාර්ෂික වටිනාකම රු.1500.00ට වැඩි රු. ශත* |
|---|---|---|---|---|
| 01. | බේකරියක් පැවැත්වීම | 500.00 | 750.00 | 1000.00 |
| 02. | බත් කඩයක් හෝ භෝජනාගාරයක් පැවැත්වීම | 500.00 | 750.00 | 1000.00 |
| 03. | තේ, කෝපි කඩයක් පැවැත්වීම | 500.00 | 750.00 | 1000.00 |
| 04. | ලැගුම්හලක් පැවැත්වීම | 500.00 | 750.00 | 1000.00 |
| 05. | බාබර් සාප්පුවක් පැවැත්වීම | 500.00 | 750.00 | 1000.00 |
| 06. | මස් වෙළඳසැල් | 500.00 | 750.00 | 1000.00 |
| 07. | මාළු වෙළඳාම | 500.00 | 750.00 | 1000.00 |
| 08. | ලොන්ඩරි | 500.00 | 750.00 | 1000.00 |
| 09. | සංචාරක වෙළඳාම (එදිනෙදා පරිභෝජනය සඳහා ගනු ලබන ආහාර වර්ග වාහන මගින් ගෙනගොස් මහා මාර්ගයේ වෙළඳාම් කිරීම) | 300.00 | 450.00 | 600.00 |
| 10. | සිසිල් බීම කර්මාන්ත ශාලා | 500.00 | 750.00 | 1000.00 |
| 11. | කිරි වෙළඳාම | 500.00 | 750.00 | 1000.00 |
| 12. | හෝටල් | 500.00 | 750.00 | 1000.00 |

**උපලේඛන අංක 02**

***අප්‍රසන්න හා අන්තරාදායක වෙළෙඳාම්***

| | *වෙළඳාමේ ස්වභාවය* | *වාර්ෂික වටිනාකම රු.750.00 ඉක්මවන විට රු. ශත* | *වාර්ෂික වටිනාකම රු.750.00 සිට රු.1,500.00 දක්වා රු. ශත* | *වාර්ෂික වටිනාකම රු.1,500.00ට වැඩි රු. ශත* |
|---|---|---|---|---|
| 01. | ගවගාලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 02. | කබොක්, බොරළු හෝ කළුගල් හැරීම සඳහා ස්ථානයක් (ගල්වලක් පවත්වාගෙන යාම) | 500.00 | 750.00 | 1,000.00 |
| 03. | කම්මලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 04. | කලුගල් පිපිරවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 05. | යන්ත්‍රානුසාරයෙන් කලුගල් කැඩීම (ක්‍රෂර්) ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 06. | කුකුළු කොටුවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 07. | අම්ලකර වායුය භාවිතා කර (ඔක්සිජන්) යකඩ කම්හලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 08. | කෘෂි රසායන ද්‍රව්‍ය විකිණීමේ හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 09. | පරණ ලෝහ ගබඩා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 10. | ඇසිඩ් වර්ග නිපදවීමේ හෝ ගබඩා කර තැබීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 11. | ගෝඝාතකාගාරයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 12. | විසිරි පින්තාරු (ස්ප්‍රේ පේන්ටින්) ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 13. | ගිණිකෙලි භාණ්ඩ, රතිඤ්ඤා විකිණීමේ හෝ ගබඩා කර තැබීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 14. | ගෑස් විකිණීම හෝ ගබඩා කර තැබීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 15. | වාහන සේවා (සර්විස්) කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 16. | පෑස්සුම් (වෙල්ඩින්) (අයන් වර්ක්ස්) ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |

11-219/1

---

**පිටබැද්දර ප්‍රාදේශීය සභාව**

2018 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වන වගන්තියේ පළවන උපවගන්තියේ ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර පිටබැද්දර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උපලේඛන 01 තීරුවේ දක්වා ඇති පරිදි කර්මාන්ත සම්බන්ධයෙන් වාර්ෂික වටිනාකම මත පදනම් වූ කර්මාන්ත බද්දක් ඒ ඒ ව්‍යාපාර ඉදිරියේ දක්වා ඇති අනුප්‍රමාණයන්ගෙන් 2018 වර්ෂය සඳහා පනවා අය කළයුතු බවත් එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු 2018 වර්ෂයේ අප්‍රේල් මස 30 වන දිනට පෙර පිටබැද්දර ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවත් පිටබැද්දර ප්‍රාදේශීය සභාවේ ලේකම් නෙළුව ලියනගේ ප්‍රේමසිරි වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09 (03) වගන්තිය ප්‍රකාරව 2017 ඔක්තෝබර් මස 10 දින තීරණ අංක 392 යටතේ තීරණය කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

නෙළුව ලියනගේ ප්‍රේමසිරි,
ලේකම්,
පිටබැද්දර ප්‍රාදේශීය සභාව.

2017 ඔක්තෝබර් මස 10 වැනි දින,

පිටබැද්දර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛන අංක 01**

| | වෙළඳාමේ ස්වභාවය | වාර්ෂික වටිනාකම රු.750.00 ඉක්මවන විට රු. ශත | වාර්ෂික වටිනාකම රු.750.00 සිට රු.1,500.00 දක්වා රු. ශත | වාර්ෂික වටිනාකම රු.1,500.00ට වැඩි රු. ශත |
|---|---|---|---|---|
| 01. | ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 02. | ඇගලුම් කම්හලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 03. | තේ කුඩු කුළු බඩු පැකට් විකිණීම | 300.00 | 350.00 | 500.00 |
| 04. | පාපැදි අලුත්වැඩියා කිරීම | 300.00 | 400.00 | 500.00 |
| 05. | වී මෝලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 06. | යතුරු පැදි ත්‍රිවීල් අලුත්වැඩියා කිරීම | 500.00 | 750.00 | 1,000.00 |
| 07. | සිමෙන්ති ගඩොල් නිෂ්පාදනය කිරීම | 500.00 | 750.00 | 1,000.00 |
| 08. | ටයර් ටියුබ් අලුත්වැඩියා කිරීම | 500.00 | 750.00 | 1,000.00 |
| 09. | විදුලි උපකරණ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 10. | පොල්තෙල් මෝලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 11. | ගුවන් විදුලි යන්ත්‍ර හා රූපවාහිනී අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 12. | ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 13. | ඩිජිටල් තාක්ෂණයෙන් මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 14. | වඩු මඩුවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 15. | කුෂන් වැඩපලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 16. | ඔර්ලෝසු අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 17. | බීරළු කැටයම් වැඩපලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 18. | හුණු පිළිස්සීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300.00 | 600.00 | 750.00 |
| 19. | කොප්පරා නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300.00 | 400.00 | 600.00 |
| 21. | රබර් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 22. | වායු සමීකරණ හා ශීතකරණ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 23. | ඉදල් පාපිසි කොහු ආශ්‍රිත නිෂ්පාදන නිපදවීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300.00 | 450.00 | 600.00 |
| 24. | මෝටර් රථ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 25. | රන් රිදී ලෝහ ආලේපනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 26. | මැණික් කැපීම හා ඔප දැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 27. | ප්ලාස්ටික් ෆයිබර් ග්ලාස් නිපදවන කර්මාන්තයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 28. | ලී මෝලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |

11-219/2

---

## පිටබැද්දර ප්‍රාදේශීය සභාව

2018 වර්ෂය සඳහා ව්‍යාපාර බදු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී පනතේ 150 වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ හා කිසියම් ව්‍යාපාරයක් පිටබැද්දර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2018 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛන අංක 01 තීරුවේ

නිරූපිත යම් විෂයාංකයක සීමාවක් ඇතුළත පවත්නා අවසථාවක එකී දෙවන තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2018 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, බද්දට යටත් යම් තැනැත්තෙකු 2018 වර්ෂයේ අප්‍රේල් 30 වන දිනට ප්‍රථම ගෙවිය යුතු බවටත් පිටබැද්දර ප්‍රාදේශීය සභාවේ ලේකම් නෙළුව ලියනගේ ප්‍රේමසිරි වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09 (03) වගන්තිය ප්‍රකාරව 2017 ඔක්තෝබර් මස 10 දින තීරණ අංක 392 යටතේ තීරණය කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

නෙළුව ලියනගේ ප්‍රේමසිරි,
ලේකම්,
පිටබැද්දර ප්‍රාදේශීය සභාව.

2017 ඔක්තෝබර් මස 10 වන දින,
පිටබැද්දර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**1 වන උපලේඛනය**

| *I තීරුව* | *II තීරුව* |
|---|---|
| *බද්ද අදාළ වන වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය* | *ගෙවිය යුතු බද්ද රු. ශත.* |
| 01. රු.6,000.00 නොඉක්මවූ අවස්ථාව | කිසිවක් නොමැත |
| 02. රු.6,000.00 ඉක්මවන එහෙත් රු.12,000.00 නොඉක්මවන අවස්ථාව | 90.00 |
| 03. රු.12,000.00 ඉක්මවන එහෙත් රු.18,750.00 නොඉක්මවන අවස්ථාව | 180.00 |
| 04. රු.18,750.00 ඉක්මවන එහෙත් රු.75,000.00 නොඉක්මවන අවස්ථාව | 360.00 |
| 05. රු.75,000.00 ඉක්මවන එහෙත් රු.150,000.00 නොඉක්මවන අවස්ථාව | 1,200.00 |
| 02. රු.150,000.00 ඉක්මවන විට | 3,000.00 |

**2 වන උපලේඛනය**

01. රෙදි පිළි නිමි ඇඳුම් අලෙවිසැලක් පවත්වාගෙන යාම.
02. සාප්පු බඩු අලෙවිසැලක් පවත්වාගෙන යාම.
03. පාවහන් අලෙවිසැලක් පවත්වාගෙන යාම.
04. සන්නිවේදන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.
05. ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම.
06. වර්ණ රසායනාගාරයක් පවත්වාගෙන යාම.
07. අපනයනය සඳහා තේ සැකසුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.
08. අමු තේ දළු එකතු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.
09. ගොඩනැගිලි ද්‍රව්‍ය විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.
10. කාය වර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.
11. තීන්ත අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.
12. යකඩ බඩු (හාර්ඩ්වෙයාර්) විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.
13. පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාම.
14. පෙර පාසල් දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.
15. පරිගණක මෘදුකාංග සංවර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.
16. පරිගණක පුහුණු පාඨමාලා පැවැත්වීමේ පාසලක් පවත්වාගෙන යාම.
17. රියැදුරු පුහුණුව සපයන ආයතනයක් පවත්වාගෙන යාම.
18. පැල තවානක් පවත්වාගෙන යාම.
19. ආයුර්වේද බෙහෙත් වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
20. ඉංග්‍රීසි බෙහෙත් වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
21. දුරකථන සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම.
22. බටහිර වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.
23. වෛද්‍ය රසායනාගාරයක් පවත්වාගෙන යාම.
24. සත්ව සායනයක් පවත්වාගෙන යාම.
25. විගණක හෝ ගණකාධිකාරි සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම.
26. බැංකුවක් පවත්වාගෙන යාම.

27. රක්ෂණ සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම.
28. ලීසිං සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම.
29. මිනින්දෝරු සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම.
30. ගෘහ නිර්මාණ සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම.
31. වාස්තු විද්‍යා සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම.
32. ඉංජිනේරු සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම.
33. විශේෂඥ වෛද්‍ය සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම.
34. පෞද්ගලික රෝහලක් පවත්වාගෙන යාම.
35. ඇඟලුම් කම්හලක් පවත්වාගෙන යාම.
36. ස්වර්ණාභරණ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
37. පරිගණක උපාංග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
38. ලී බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
39. ප්‍රචාරක කටයුතු කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම.
40. උත්සව භාණ්ඩ කුලියට දීමේ ආයතනයක් පවත්වාගෙන යාම.
41. ඇස් කණ්ණාඩි සාප්පුවක් පවත්වාගෙන යාම.
42. ලොතරැයි නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම.
43. පිඟන් මැටි ආශ්‍රිත නිෂ්පාදන අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
44. රේස් බුකියක් පවත්වාගෙන යාම.
45. නියෝජිත තැපැල් කාර්යාලයක් පවත්වාගෙන යාම.
46. පින්තූර රාමු කිරීමේ හා වීදුරු කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
47. රබර්, කුරුඳු මිලට ගන්නා ස්ථානයක් පවත්වාගෙන යාම.
48. දුරකථන සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම.
49. ජංගම දුරකථන අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
50. රැකියා නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම.
51. උකස් බඩු ගන්නා ආයතනයක් පවත්වාගෙන යාම.
52. වීඩියෝ පට, සංයුක්ත තැටි විකිණීම හෝ කුලියට දීමේ ආයතනයක් පවත්වාගෙන යාම.
53. ලිපි ද්‍රව්‍ය හෝ පොත් සාප්පුවක් පවත්වාගෙන යාම.
54. ලී වෙළඳසැලක් පවත්වාගෙන යාම.
55. සිල්ලර වෙළඳසැලක් පවත්වාගෙන යාම.
56. සංගීත භාණ්ඩ හෝ ක්‍රීඩා භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
57. ගබඩාවක් ලෙස කුලියට දෙන ස්ථානයක් පවත්වාගෙන යාම.
58. තොග වශයෙන් භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
59. විදුලි උපකරණ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
60. ප්‍රසිද්ධ සමාගම්වල භාණ්ඩ බෙදා හැරීමේ නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම.
61. ප්‍රසිද්ධ සමාගම්වල භාණ්ඩ ප්‍රදර්ශනය කිරීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
62. වාහන අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
63. වාහන අමතර කොටස් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
64. යතුරු පැදි/ ත්‍රීරෝද රථ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
65. විදුලි උපකරණ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
66. වාහන අමතර කොටස් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
67. යතුරු පැදි/ ත්‍රිරෝද රථ අමතර කොටස් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
68. ඉන්ධන පිරවුම්හලක් පවත්වාගෙන යාම.
69. අරක්කු බියර් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
70. සිනමා ශාලාවක් පවත්වාගෙන යාම.
71. රූපලාවන්‍යාගාරයක් පවත්වාගෙන යාම.
72. මැණික් මිලදී ගන්නා ස්ථාන හා මැණික් කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
73. විදේශ රැකියා නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම.
74. සුපිරි වෙළඳසැලක් පවත්වාගෙන යාම.
75. දුරකථන පෙරගෙවුම් කාඩ් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
76. තේ කම්හලක් පවත්වාගෙන යාම.
77. අන්තර්ජාල සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම.
78. සුරතල් මසුන් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
79. කුළු බඩු, හාල්, සීනි, කිරිපිටි, සිල්ලර හා තොග වශයෙන් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.

80. යෝගට් නිෂ්පාදනය හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
81. පොහොර වෙළඳසැලක් පවත්වාගෙන යාම.
82. අවමංගල්‍ය සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම.
83. රස කැවිලි නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
84. දන්ත ශල්‍යාගාරයක් පවත්වාගෙන යාම.
85. බැටරි චාජ් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
86. මුද්‍රණාලයක් පවත්වාගෙන යාම.
87. නිෂ්පාදනය කරන ලද පොලිතින් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
88. සම්ප්‍රේෂණ කුළුණු සඳහා
89. බුලත්විට වෙළඳාම
90. ටයර් ටියුබ් වෙළඳාම
91. සුළු අපනයන භෝග වෙළඳාම
92. පාසල් උපකරණ වෙළඳාම
93. කොන්ක්‍රීට් වැඩපලක් පවත්වාගෙන යාම
94. ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම

11-219/3

---

## පිටබැද්දර ප්‍රාදේශීය සභාව

### ප්‍රචාරක දැන්වීම් හා දෘශ්‍ය පරිසරය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122-126 වන වගන්තිවලින් පැවරී ඇති බලතල අනුව 1988.08.23 වැනි දින අංක 520/7 දරන පළාත් පාලන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ ගරු ඇමතිතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලද 2007.12.28 වැනි දින 1530 *ගැසට් පත්‍රයේ* නිවේදනයක් මගින් පිටබැද්දර ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති අතුරු ව්‍යවස්ථාවල 39 වැනි ඡේදය යටතේ පිටබැද්දර ප්‍රාදේශීය සභා සීමාව තුළ ප්‍රචාරක දැන්වීම් (බැනර් ඇතුළුව) ඉදිකිරීම හා ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තු 2018 වර්ෂයේ ජනවාරි පළමුවන දින සිට පනවා අය කරන බවට පිටබැද්දර ප්‍රාදේශීය සභාවේ ලේකම් නෙළුව ලියනගේ ප්‍රේමසිරි වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09 (03) වගන්තිය ප්‍රකාරව 2017 ඔක්තෝබර් මස 10 දින තීරණ අංක 392 යටතේ තීරණය කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

නෙළුව ලියනගේ ප්‍රේමසිරි,
ලේකම්,
පිටබැද්දර ප්‍රාදේශීය සභාව.

2017 ඔක්තෝබර් මස 10 වැනි දින,
පිටබැද්දර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

| *ප්‍රචාරක දැන්වීම්* | *දැන්වීම් පුවරු* | *බැනර් හා කටවුට් සඳහා* | |
|---|---|---|---|
| | *වර්ෂයක් සඳහා (වර්ග අඩියකට)* | *මාසයක් සඳහා (වර්ග අඩියකට)* | *මාසයකට වැඩි (වර්ග අඩියකට)* |
| 01. පෞද්ගලික පරිශ්‍රයේ ඉදි කරනු ලබන හෝ ප්‍රදර්ශනය කරන දැන්වීම් | රු.75.00 | රු.25.00 | රු.40.00 |
| 02. මහා මර්ගයට පෙනෙන පරිදි අවකාශීය ඉඩකඩ භාවිත කරමින් මහා මාර්ගයට යාබද ඉදිකරනු ලබන හෝ ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීම් | රු.75.00 | රු.25.00 | රු.40.00 |
| 03. පාලන පාලන ආයතන පරිශ්‍රයන් ප්‍රයෝජනයට ගනිමින් ඉදිකරනු ලබන දැන්වීම් | රු.90.00 | රු.25.00 | රු.40.00 |

11-219/4

## පිටබැද්දර ප්‍රාදේශීය සභාව

### 2018 වර්ෂය සඳහා කසළ ශෝධන ගාස්තු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වන වගන්තියේ සහ 126 (IX) ආ වගන්තිය ප්‍රකාරව, ලැබී ඇති බලතල මත පිටබැද්දර ප්‍රාදේශීය සභාව විසින් 2007.12.28 දින සම්මත කරගත් 1530 පොදු අතුරු ව්‍යවස්ථා 9 යටතේ පිටබැද්දර ප්‍රාදේශීය සභා සීමාව තුළ කසළ ශෝධන සේවාව මගින් සේවය සලසනු ලබන යම් ස්ථානයක පදිංචිකරුවෙකු/ව්‍යාපාරිකයෙකු වෙනුවෙන් පහත පරිදි කසළ ශෝධන ගාස්තුවක් පිටබැද්දර ප්‍රාදේශීය සභාව වෙත මාස් පතා 2018 වර්ෂය සඳහා අය කිරීමට පිටබැද්දර ප්‍රාදේශීය සභාවේ ලේකම් වන නෙළුව ලියනගේ ප්‍රේමසිරි වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09 (03) වගන්තිය ප්‍රකාර, 2017 ඔක්තෝබර් මස 10 වැනි දින තීරණ අංක 392 යටතේ තීරණය කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

| | | රු. ශත |
|---|---|---|
| හෝටලයක්/ ආපන ශාලාවක් | - | 200 |
| පළතුරු/ එළවළු කඩයක් සඳහා | - | 200 |
| වෙනත් ව්‍යාපාර සඳහා | - | 200 |
| ගෘහස්ථ | - | 100 |

නෙළුව ලියනගේ ප්‍රේමසිරි,
ලේකම්,
පිටබැද්දර ප්‍රාදේශීය සභාව.

2017 ඔක්තෝබර් මස 10 වැනි දින,
පිටබැද්දර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

11-219/5

---

## පිටබැද්දර ප්‍රාදේශීය සභාව

### අක්කර බද්ද 2018

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ (3 වන උප වගන්තියෙන්) ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පිටබැද්දර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ ඉහත කී පනතේ 135 වන වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොගන්නා වූද ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූ,

(අ) හෙක්ටයාර් පහක් හෝ ඊට වැඩි වූ සෑම ඉඩමක් වෙනුවෙන්ම එකී ඉඩමේ සෑම හෙක්ටයාරයක්ම මත 2018 වර්ෂය සඳහා රුපියල් දහය (රු.10.00)ක් බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමටත්,

(ආ) ඉහත කී පනතේ 134 වන වගන්තියේ (3) වන උප වගන්තියේ අතුරු විධානය යටතේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් පිටබැද්දර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය විශේෂ ප්‍රදේශයක් වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ iv (ආ) වන කොටසේ 1989.03.10 වැනි දිනැති *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත්කර ඇති හෙයින් හෙක්ටයාර් එකකට වැඩි එහෙත් හෙක්ටයාර් පහකට අඩු වූ සෑම ඉඩමක් මතම 2018 වර්ෂය සඳහා රුපියල් පනහක් (50.00) බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමටත්, සහ

(ඇ) ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30, හා දෙසැම්බර් 31 වන දිනවලට පෙර සමාන වාරික හතරකින් පිටබැද්දර ප්‍රාදේශීය සභාව වෙත ගෙවනු ලැබිය යුතුයැයි විධිවිධාන කිරීමට පිටබැද්දර ප්‍රාදේශීය සභාවේ ලේකම් නෙළුව ලියනගේ ප්‍රේමසිරි වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09 (03) වගන්තිය ප්‍රකාර, 2017 ඔක්තෝබර් මස 10 දින තීරණ අංක 392 යටතේ තීරණය කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

නෙළුව ලියනගේ ප්‍රේමසිරි,
ලේකම්,
පිටබැද්දර ප්‍රාදේශීය සභාව.

2017 ඔක්තෝබර් මස 10 වැනි දින,
පිටබැද්දර ප්‍රාදේශීය සභා කාර්යාල යේ දී ය.

11-219/6

## පිටබැද්දර ප්‍රාදේශීය සභාව

### 2018 වර්ෂය සඳහා විනෝද බදු පනවා අයකිරීම

පිටබැද්දර ප්‍රාදේශීය සභාව සඳහා 2018 වර්ෂය සඳහා විනෝද බදු පැනවීමට අදාළව (267 වන අධිකාරය වන) විනෝද බදු ආඥාපනතේ කාර්ය සඳහා වන කිසියම් විනෝද කටයුත්තක් පිටබැද්දර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සිදු කරනු ලබන සෑම තැනැත්තෙකු විසින්ම, එම විනෝද කටයුත්ත,

*(අ)* සිනමා දර්ශනයක් වන විට ඒ සඳහා ඇතුළත් කරගන්නා තැනැත්තන්ගෙන් අයකර ගන්නා මුදල් ප්‍රමාණයෙන් සියයට දහයක (10%) ප්‍රමාණයට සමාන මුදලක් ද සහ,

*(ආ)* පිටබැද්දර ප්‍රාදේශීය සභා පරිපාලන සීමාව ඇතුළත වෙනත් විනෝද කාර්යයක් වන විට ඒ සඳහා ඇතුළත් කරගන්නා තැනැත්තන්ගෙන් අයකර ගන්නා මුදල් ප්‍රමාණයෙන් සියයට දහයක (10%) ප්‍රමාණයට සමාන මුදලක් ද,

ඉහත විනෝද බදු ආඥාපනතේ 2 වන වගන්තියෙන් පළාත් පාලන ආයතනවලට ලැබී ඇති බලතල ප්‍රකාර, විනෝද බද්දක් වශයෙන් පනවා අයකර ගත යුතු බවත්, එකී විනෝද කාර්යය පවත්වන දිනට පෙර එකී විනෝද බද්ද පිටබැද්දර ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් නෙළුව ලියනගේ ප්‍රේමසිරි වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09 (03) වගන්තිය ප්‍රකාරව, 2017 ඔක්තෝබර් මස 10 දින තීරණ අංක 392 යටතේ තීරණය කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

නෙළුව ලියනගේ ප්‍රේමසිරි,
ලේකම්,
පිටබැද්දර ප්‍රාදේශීය සභාව.

2017 ඔක්තෝබර් මස 10 වැනි දින,
පිටබැද්දර ප්‍රාදේශීය සභා කාර්යාල යේ දී.

11-219/7

---

## පිටබැද්දර ප්‍රාදේශීය සභාව

### 2018 වර්ෂය සඳහා වෙනත් ගාස්තු අය කිරීම

පිටබැද්දර ප්‍රාදේශීය සභාව විසින් වෙනත් ගාස්තු වශයෙන් සභාව වෙත අයකළ යුතු පහත පළකරන අතර එකී සේවාවන් වෙනුවෙන් ඉදිරියෙන් දක්වා ඇති මුදල් අය කිරීමට සුදුසු යැයි පිටබැද්දර ප්‍රාදේශීය සභාවේ ලේකම් නෙළුව ලියනගේ ප්‍රේමසිරි වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09 (3) වගන්තිය ප්‍රකාරව, 2017 ඔක්තෝබර් මස 10 දින තීරණ අංක 392 යටතේ තීරණය කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

නෙළුව ලියනගේ ප්‍රේමසිරි,
ලේකම්,
පිටබැද්දර ප්‍රාදේශීය සභාව.

2017 ඔක්තෝබර් මස 10 වැනි දින,
පිටබැද්දර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

| | | රු. ශත |
|---|---|---|
| 01. | ගොඩනැගිලි අයදුම්පත්‍ර ගාස්තු | 500 |
| 02. | දේපළ වලට හා ජීවිත වලට අනතුරුදායක ගස් සම්බන්ධයෙන් දැනුම් දීම් අයදුම්පතක් සඳහා ගාස්තු | |
| | (i) කොස් ගසක් සඳහා | 1000 |
| | (ii) වෙනත් ගසක් සඳහා | 300 |
| 03. | ගොඩනැගිලි අයදුම්පතක් සඳහා අනුකූලතා සහතිකයක් නිකුත් කිරීම | |
| | (i) ව්‍යාපාරික ස්ථානයට | 1000 |
| | (ii) නේවාසික ස්ථානයකට | 750 |

| | රු. ශත |
|---|---|
| 04. ගොඩනැගිලි අයදුම්පතක කාලය දීර්ඝ කිරීම වර්ෂයක කාලයක් සඳහා | 1000 0 |
| 05. ගොඩනැගිලි සැලසුම් පිටපතක් නිකුත් කිරීම සඳහා | 100 0 |
| 06. වීථි රේඛා/ නොපවරා ගැනීමේ සහතිකයක් නිකුත් කිරීම | |
| (i) වීථි රේඛා/ නොපවරා ගැනීමේ සහතික නිකුත් කිරීමේ අයදුම්පත්‍ර ගාස්තු | 50 0 |
| (ii) වීථි රේඛා/ නොපවරා ගැනීමේ සහතිකයක් නිකුත් කිරීමේ ගාස්තු | 450 0 |
| (iii) සේවා ගාස්තු | 50 0 |
| (iv) වීථි රේඛා/ නොපවරා ගැනීමේ සහතික නිකුත් කිරීමේදී ඔප්පුවල වටිනාකමින් 1% බදු මුදලක් ලබා ගත හැකිය. | |
| 07. ජල සම්බන්ධතා අයදුම්පතක් සඳහා | 50 0 |
| 08. ඉඩම් අනුබෙදුම් අයදුම්පතක් සඳහා වර්ග ප්‍රමාණය අනුව නාගරික සංවර්ධන අධිකාරියේ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත මුදලින් 60%ක් අයකර ගත හැකිය. | |
| 09. බැනර් හෝ දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීම සඳහා අයදුම්පත්‍ර ගාස්තු | 50 0 |
| 10. සභා පාරවල් පළුදු කිරීමේ ගාස්තු | |
| (i) බොරළු සහිත පාරක් පළුදු කිරීම (වර්ග මීටර් එකක් සඳහා) | 1,000 0 |
| (ii) කොන්ක්‍රීට් සහිත පාරක් පළුදු කිරීම (ඝන මීටර් එකක් සඳහා) | 14,506 0 |
| (iii) කුට්ටිගල් අතුරා ඇති මාර්ගයක් පළුදු කිරීම (ව. මී එකක් සඳහා) | 2,478 0 |
| (iv) තාර දැමූ පාරක් සඳහා (ව. මී එකක් සඳහා) | 10,000 0 |
| 11. සභාව සතු ඉඩම් සැණකෙළියක් හෝ සංගීත සංදර්ශනයක් එක් දිනක් සඳහා බදු දීමට | 1,000 0 |
| 12. වෙනත් කාර්යයක් සඳහා එක් දිනකට බදු මුදල | 500 0 |
| 13. සභාව සතු ඉඩමක වාහන නවත්වා තැබීම වෙනුවෙන් ගාස්තු | |
| (i) ලොරියක් සඳහා එක් දිනකට | 100 0 |
| (ii) මගී වාහන හෝ කාරයක් සඳහා එක් දිනකට ගාස්තු | 50 0 |
| (iii) ත්‍රීරෝද රථ සඳහා එක් දිනකට ගාස්තු | 30 0 |
| (iv) යතුරු පැදියක් සඳහා එක් දිනකට ගාස්තු | 10 0 |
| 14. ගොඩනැගිලි අයදුම්පත්‍ර පෙරසැරි ගාස්තු වර්ග ප්‍රමාණය අනුව නාගරික සංවර්ධන අධිකාරියේ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත මුදලින් 60%ක් අයකර ගත හැකිය. | |
| 15. ඉඩම් අනුබෙදුම් සඳහා බලපත්‍රයක් ලබා ගැනීමේ අයදුම්පත්‍ර ගාස්තු | 200 0 |
| 16. ගොඩනැගිලි හා ඒ ආශ්‍රිත අනෙකුත් නියමිත ඉදිකිරීම් සඳහා අයදුම්පත්‍ර ගාස්තු | 500 0 |
| 17. ජාතික ගොඩනැගිලි පර්යේෂණායතනයේ භූමි යෝග්‍යතා සහතිකය ලබා ගැනීමේ අයදුම්පත්‍ර ගාස්තු | 25 0 |

18. දුරකථන කුළුණු ඇන්ටනා කුළුණු ඉදි කිරීම (උස අනුව)

| | | *නේවාසික (රු.)* | *ව්‍යාපාරික (රු.)* |
|---|---|---|---|
| 01 | ව. මී. 01 - 45 දක්වා | 300 0 | 600 0 |
| 02 | ව. මී. 45 - 90 දක්වා | 900 0 | 1,200 0 |
| 03 | ව. මී. 90 - 180 දක්වා | 1,500 0 | 1,800 0 |

| | නේවාසික (රු.) | ව්‍යාපාරික (රු.) |
|---|---|---|
| 04. ව. මී. 181 - 270 දක්වා | 2,100 0 | 2,400 0 |
| 05. ව. මී. 271 - 450 දක්වා | 2,700 0 | 3,600 0 |
| 06. ව. මී. 451 - 675 දක්වා | 3,300 0 | 4,800 0 |
| 07. ව. මී. 676 - 900 දක්වා | 3,900 0 | 6,000 0 |
| 08. ව. මී. 901 - 1,225 දක්වා | 4,500 0 | 7,200 0 |
| 09. ව. මී. 1,225ට වැඩි | 4,500 0 | 7,200 0 |

| | |
|---|---|
| 19. බැකෝ රථයක් කුලියට දීමේ දී එක් පැයක් සඳහා | රු.2,100.00 |
| 20. ටොන් 04 වෛබ්රේටි තලන යන්ත්‍රය කුලියට දීම එක් දිනක් සඳහා | රු.6,000.00 |
| 21. ටොන් 08 මාර්ග තලන යන්ත්‍රය කුලියට දීම එක් දිනක් සඳහා | රු.10,000.00 |
| 22. ලීටර් 2,000 පී. වී. සී. ජල ටැංකිය කුලියට දීම එක් දිනක් සඳහා | රු.350.00 |
| 23. සහතික පත්‍ර සහ සොයා බැලීමේ ගාස්තු | 100.00 |
| 24. ජල බවුසරය කුලියට දීම - | |
| (i) ජල බවුසරය එක් වරකට (ජලය ලීටර් 4,000ක් සමග) | රු.750.00 |
| (ii) බවුසරය ධාවනය සඳහා පළමු කි. මී. 1 සඳහා | රු.300.00 |
| (iii) වැඩිවන සෑම කි. මී. 1 සඳහා | රු.100.00 |
| (iv) ප්‍රවාහනයට ගතවන කාලය එක් පැයක් සඳහා | රු.200.00 |
| 25. අලෙවි ප්‍රවර්ධන කටයුත්තක් සඳහා බල ප්‍රදේශයේ නිශ්චිත ස්ථානයක් ලබා දීම (දිනකට) | 1,000.00 |

11-219/8

---

**පිටබැද්දර ප්‍රාදේශීය සභාව**

2018 වර්ෂය සඳහා ඉඩම් විකිණීම මත බදු අය කිරීම

පිටබැද්දර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට ඇතුළත් වූ යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයෙකු හෝ අනු නියෝජිතයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක ඒ ඉඩම් විකිණීමෙන් ලත් මුදලින් 1% සමාන බද්දක් විකිණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ ඔහුගේ සේවකයා හෝ අනු නියෝජිතයා විසින් පිටබැද්දර ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 (1) වැනි වගන්තිය යටතේ 2018 වර්ෂය සඳහා අය කිරීමට පිටබැද්දර ප්‍රාදේශීය සභාවේ ලේකම් නෙළුව ලියනගේ ප්‍රේමසිරි වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09 (3) වගන්තිය ප්‍රකාරව 2017 ඔක්තෝබර් මස 10 දින තීරණ අංක 392 යටතේ තීරණය කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

නෙළුව ලියනගේ ප්‍රේමසිරි,
ලේකම්,
පිටබැද්දර ප්‍රාදේශීය සභාව.

2017 ඔක්තෝබර් මස 10 වැනි දින,
පිටබැද්දර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

11-219/9

## පිටබැද්දර ප්‍රාදේශීය සභාව

2018 වර්ෂය සඳහා ජල ගාස්තු පැනවීම

1987 අංක 06 දරන පළාත් පාලන (සම්මත අතුරු ව්‍යවස්ථාව) පනත යටතේ 1952 අංක 06 දරන පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා විසින් සාදන ලද 1988.08.23 වැනි දින අංක 520/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ පළ කරන ලද්දා වූ පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල අංක 34 ජල සම්පාදන අතුරු ව්‍යවස්ථා අනුව මෙම සභාව මගින් පාලනය වන ජල යෝජනා ක්‍රමය සඳහා වූ ජල ගාස්තු 2018 වර්ෂය සඳහා පනවා අය කිරීමට පිටබැද්දර ප්‍රාදේශීය සභාවේ ලේකම් නෙළුව ලියනගේ ප්‍රේමසිරි වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09 (3) වගන්තිය ප්‍රකාරව 2017 ඔක්තෝබර් මස 10 දින තීරණ අංක 392 යටතේ තීරණය කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

නෙළුව ලියනගේ ප්‍රේමසිරි,
ලේකම්,
පිටබැද්දර ප්‍රාදේශීය සභාව.

2017 ඔක්තෝබර් මස 10 වැනි දින,
පිටබැද්දර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

01.

| *විස්තරය* | *නේවාසික* | *ව්‍යාපාරික* |
|---|---|---|
| 01. ස්ථාවර ගාස්තු | රු.50.00 | රු.100.00 |
| 02. පළමු ඒකක 10 සඳහා ගාස්තු | රු.85.00 | රු.20.00 (සෑම ඒකකයටම) |
| 03. ඒකක 11 සිට 20 දක්වා | රු.5.00 | |
| 04. ඒකක 21 සිට 30 දක්වා | රු.7.50 බැගින් | |
| 05. ඒකක 31 සිට වැඩිවන සෑම ඒකකයක් සඳහා | රු.15.00 බැගින් | |

02.

| *කරාම ගාස්තු* | *නේවාසික* | *ව්‍යාපාරික* |
|---|---|---|
| 01. කරාම 01 සඳහා | රු.250.00 | රු.400.00 |
| 02. කරාම 02 සඳහා | රු.350.00 | රු.600.00 |
| 03. කරාම 03 සඳහා | රු.450.00 | රු.800.00 |
| 04. කරාම 04 සඳහා | රු.550.00 | රු.1,000.00 |
| 05. කරාම 05 සඳහා | රු.650.00 | රු.1,200.00 |
| 06. කරාම 06 සඳහා | රු.750.00 | රු.1,400.00 |

මෙම ක්‍රමය අනුව වැඩිවන ඒකකවලට නියම කරන ජල ගාස්තු ගෙවිය යුතු ය.

03. නැවත සවිකිරීමේ ගාස්තු -

| | |
|---|---|
| 01. ගෘහ | රු.300.00 |
| 02. ව්‍යාපාරික | රු.500.00 |

11-219/10

## පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව

### 1980 අංක 47 දරන පාරිසරික පනත යටතේ බලපත්‍ර ගාස්තු පැනවීම - 2018 වර්ෂය

පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටුකරන පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ ලේකම්, එච්. ඒ. ජී. නිශ්ශංක වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය අනුව එම පනතෙන් ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 1988 අංක 56 දරනා ජාතික පාරිසරික පනතින් සංශෝධිත වූ 1980 අංක 47 දරන පාරිසරික පනතේ 26 වැනි වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාර පඩුවස්නුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කරනු ලබන යම් ව්‍යාපාරයක් සඳහා පරිසර බලපත්‍රයක් ලබා ගතයුතු යම් තැනැත්තෙකු විසින් පහත උපලේඛනයේ සඳහන් පරිදි බලපත්‍ර ගාස්තුවක් හා පරීක්ෂණ ගාස්තුවක් 2018 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවටත්, එකී ගාස්තුව බලපත්‍රය ලබා ගැනීමට පෙර පඩුවස්නුවර ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවට 2017.09.20 වැනි දින තීරණ අංක 2017/1653 යටතේ මම තීරණය කරමි.

එච්. ඒ. ජී. නිශ්ශංක.
ලේකම්,
පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව,
හෙට්ටිපොල.

2017 සැප්තැම්බර් මස 20 වැනි දින,
පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව.

#### උපලේඛනය

| | | *රු. ශත.* |
|---|---|---|
| 1. | නියමිත පරිදි සකස් කරන ලද ප්‍රශ්නාවලිය සඳහා අයදුම්පත්‍ර ගාස්තුව | 100 0 |
| 2. | බලපත්‍ර අළුත් කිරීම සඳහා අයදුම්පත්‍ර ගාස්තුව | 100 0 |
| 3. | බලපත්‍ර ගාස්තුව | 1,250 0 |
| 4. | පරිසර බලපත්‍ර පරීක්ෂණ ගාස්තු<br>මූලික ආයෝජනය | |
| I. | රු. 1,00,000 දක්වා | 250 0 |
| II. | රු. 1,00,000 සිට 2,00,000 දක්වා | 500 0 |
| III. | රු. 2,00,001 සිට 5,00,000 දක්වා | 1,250 0 |
| IV. | රු. 5,00,001 සිට 10,00,000 දක්වා | 2,500 0 |
| V. | රු. 10,00,001 සිට ඉහළට | 5,000 0 |

11 - 72/1

---

## පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව

### නිකුත් කරනු ලබන සහතික හෝ සපයනු ලබන සේවා සඳහා ගාස්තු අයකිරීම

පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්යය, කර්තව්‍ය ඉටුකරන පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ ලේකම්, එච්. ඒ. ජී. නිශ්ශංක වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය අනුව එම පනතෙන් ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවෙන් පහත උපලේඛනයේ 1 වැනි තීරුවේ සඳහන් සහතිකයක් හෝ සේවාවක් ලබාදීම එම උපලේඛනයේ 11 වැනි තීරුවේ ඒ ඒ සහතිකය හෝ සේවාව සැපයීම වෙනුවෙන් සඳහන් කර ඇති ගාස්තුව 2018 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවටත්, එකී සේවාව හෝ සහතිකය ලබා ගන්නා යම් තැනැත්තෙකු විසින් ඒ සේවාව හෝ සහතිකය ලබා ගැනීමට පෙර එම

ගාස්තුව පඹුවස්නුවර ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවට 2017.09.20 වැනි දින තීරණ අංක 2017/1654 යටතේ මම තීරණය කරමි.

එච්. ඒ. ජී. නිශ්ශංක.
ලේකම්,
පඹුවස්නුවර ප්‍රාදේශීය සභාව,
හෙට්ටිපොල.

2017 සැප්තැම්බර් මස 20 වැනි දින,
පඹුවස්නුවර ප්‍රාදේශීය සභාව.

උපලේඛනය

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* රු. ශත |
|---|---|
| 1. වීථි රේඛා සහ නොපරවා ගැනීමේ සහතික, ගොඩනැගිලි සීමා සහතික සහ හිමිකම් සහතිකයක් සඳහා | 700 0 |
| 2. ගොඩනැගිලි අනුකූලතා සහතිකයක් සඳහා | 600 0 |
| 3. පිඹුරුපතක් අනුමත කිරීමේ ගාස්තු සඳහා | 600 0 |
| 4. ගොඩනැගිලි අයදුම් පත්‍රවල වලංගු කාලය වසරකින් දීර්ඝ කිරීම | 600 0 |
| 5. ගොඩනැගිලි අයදුම් පත්‍රයක් සඳහා | 600 0 |
| 6. ගොඩනැගිලි අයදුම් පත්‍රය අනුමත කිරීමේ දී පෙරසැරි ගාස්තු | |
| I. ව්‍යාපාරික ස්ථාන සඳහා වර්ග අඩි 1ට | 3 50 |
| II. නිවාසයක් සඳහා | 2 0 |
| 7. ආරක්ෂිත වැට සීමා භාවිතය (දික් මීටර්) | |
| I. නේවාසික | 3 0 |
| II. ව්‍යාපාරික | 4 0 |
| (එසේ වුව ද, නාගරික සංවර්ධන අධිකාරි ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත්කර ඇති ප්‍රදේශවල ගොඩනැගිලි සැලැස්මක් අනුමත කිරීමේ දී ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ 21 වැනි වගන්තිය යටතේ නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝගවල සඳහන් ගාස්තු අයකළ යුතුය.) | |
| 8. ඉඩම් කට්ටි කිරීමේ ඉල්ලුම් පත්‍රයක් සඳහා | 1.100 0 |
| 9. මායිම් තාප්ප ඉදිකිරීම (නාගරික සංවර්ධන අධිකාරි ප්‍රදේශය තුළ) | |
| I. නේවාසික ස්ථාන | 600 0 |
| II. ව්‍යාපාරික ස්ථාන | 700 0 |
| 10. මායිම් තාප්ප ඉදිකිරීම (ග්‍රාමීය ප්‍රදේශය තුළ) | |
| I. නේවාසික ස්ථාන | 400 0 |
| II. ව්‍යාපාරික ස්ථාන | 500 0 |
| 11. පරිසර අයදුම් පත්‍රයක් සඳහා | 100 0 |
| 12. වරිපනම් ලේඛනයේ උපුටන ලබා ගැනීම, දේපළ තක්සේරු ලේඛන, වරිපනම් බදු නොගෙවන බවට සහතික නිකුත් කිරීම සඳහා | 300 0 |
| 13. අගරු චෙක්පතක් සඳහා දඩ මුදල් | 300 0 |
| 14. නැති වූ සහතිකයක පිටපතක් නැවත නිකුත් කිරීම සඳහා | 300 0 |
| 15. අස්ථාන ගතවූ පස්තකාල පොතක් වෙනුවෙන් වර්තමාන පොතේ මිළ | +25% |

| *I වැනි තීරුව* | *II වැනි තීරුව රු. ශත* |
|---|---|
| 16. ගලි බවුසර් ගාස්තුව (ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ) | |
| I. නේවාසික ඒකකයක් සඳහා | 3,000 0 |
| II. ව්‍යාපාරික ඒකකයක් සඳහා | 4,250 0 |
| III. රාජ්‍ය ආයතන සඳහා | 2,750 0 |
| IV. ආගමික ස්ථාන සඳහා | 1,750 0 |
| 17. ගලි බවුසර් ගාස්තුව (ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් පිටත) | |
| I. නේවාසික ඒකකයක් සඳහා | 4,250 0 |
| II. ව්‍යාපාරික ඒකකයක් සඳහා | 7,250 0 |
| III. රාජ්‍ය ආයතන සඳහා | 3,750 0 |
| IV. ආගමික ස්ථාන සඳහා | 2,750 0 |
| 18. ජල බවුසර් ගාස්තුව (ඉහත අංක 16, 17 සහ 18 සඳහා ට්‍රැක්ටරයට ප්‍රවාහන ගාස්තුව පළමු කි.මී. 1ක් සඳහා රු. 282ක් වන අතර, ඊට වැඩිවන සෑම කි.මී. 1ක් සඟා රු. 75 බැගින් අයකරනු ඇත.) | 1,200 0 |
| 19. මාර්ග තලනය සඳහා අවම පැය 3ක් සඳහා | 5,400 0 |
| ආරක්ෂිත ඇප | 3,000 0 |
| 20. මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය අවම පැය 3ක් සඳහා | 13,200 0 |
| ආරක්ෂිත ඇප | 5,000 0 |
| 21. බැකෝ ලෝඩර් යන්ත්‍රය අවම පැය 3ක් සඳහා | 8,700 0 |
| ආරක්ෂිත ඇප | 5,000 0 |
| 22. ට්‍රිපර් රථය ප්‍රවාහනය පළමු කි.මී. 1ක් සඳහා (ඊට වැඩිවන සෑම කි.මී. 1ක් සඳහා රු. 85 බැගින් අයකරනු ඇත) | 446 0 |
| 23. ඩුම් ට්‍රක් රථය ප්‍රවාහනය පළමු කි.මී. 1 සඳහා (ඊට වැඩිවන සෑම කි.මී. 1ක් සඳහා රු. 100 බැගින් අයකරනු ඇත) | 500 0 |
| 24. හිත් තාර බැරල් එකක් සඳහා | 200 0 |
| 25. ආදහනාගාර ගාස්තු | |
| I. ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත | 7,500 0 |
| II. ප්‍රාදේශීය සභාවෙන් පිටත | 8,500 0 |

11 - 72/2

---

**පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව**

ප්‍රජා ශාලාව සහ ක්‍රීඩාපිටිය කුළියට දීම වෙනුවෙන් ගාස්තු අයකිරීම - 2018 වර්ෂය

පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්යය, කර්තව්‍ය ඉටුකරන පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ ලේකම්, එච්. ඒ. ජී. නිශ්ශංක වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය අනුව එම පනතෙන් ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් හෙට්ටිපොල ප්‍රජා ශාලාව ප්‍රයෝජනයට ගැනීම වෙනුවෙන් පහත උපලේඛන අංක 01හි සඳහන් ආකාරයට ආරක්ෂිත ඇපයක් සහ ගාස්තුවක් ද ක්‍රීඩාපිටිය ප්‍රයෝජනයට ගැනීම වෙනුවෙන් පහත උපලේඛන අංක 02හි සඳහන් ආකාරයට ආරක්ෂිත ඇපයක් සහ ගාස්තුවක් 2018 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවටත්, එකී දේපළ ප්‍රයෝජනයට ලබා ගන්නා යම්

තැනැත්තෙකු විසින් ඒ දේපළ ප්‍රයෝජනයට ගැනීමට පෙර අදළ ගාස්තුව පඹුවස්නුවර ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවට 2017.09.20 වැනි දින තීරණ අංක 2017/1655 යටතේ මම තීරණය කරමි.

එච්. ඒ. ජී. නිශ්ශංක.
ලේකම්,
පඹුවස්නුවර ප්‍රාදේශීය සභාව,
හෙට්ටිපොල.

2017 සැප්තැම්බර් මස 20 වැනි දින,
පඹුවස්නුවර ප්‍රාදේශීය සභාව.

**උපලේඛනය 01**

| *අනු. අංකය* | *කාරණය* | *ආරක්ෂිත ඇප* රු. ශත | *පැය 6ක් හෝ ඊට අඩු කාලයක් සඳහා මුදල* රු. ශත | *පැය 6ට වැඩි පැය 12ක් හෝ ඊට අඩු කාලයක් සඳහා මුදල* රු. ශත |
|---|---|---|---|---|
| 1. | පොත් ප්‍රදර්ශනයක් සඳහා | | | |
| | I. පළමු දින | 4,000 0 | 2,000 0 | 4,000 0 |
| | II. දෙවන දින | 4,000 0 | 1,250 0 | 2,500 0 |
| | IIII. තෙවන දින | 4,000 0 | 500 0 | 1,000 0 |
| 2. | විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ උත්සවයක් සඳහා | 3,000 0 | 500 0 | 1,000 0 |
| 3. | වානිජ වෙළෙඳ ප්‍රදර්ශනයක් සඳහා | 4,000 0 | 4,000 0 | 6,000 0 |
| 4. | ව්‍යාපාරික අරමුණින් පවත්වන ප්‍රදර්ශන සම්මන්ත්‍රණ සඳහා | 4,000 0 | 4,000 0 | 6,000 0 |
| 5. | ත්‍යාග ප්‍රධානෝත්සවයක් සඳහා | 4,000 0 | 1,000 0 | 2,000 0 |
| 6. | රූපලාවන්‍ය ප්‍රදර්ශනයක් සඳහා | 4.000 0 | 2,000 0 | 4,000 0 |
| 7. | විවාහ මංගල උත්සවයක් සඳහා | 4,000 0 | 3,000 0 | 6,000 0 |
| 8. | රජයේ හෝ රජයට අනුබද්ධ ආයතන පවත්වන සංදර්ශන, ප්‍රදර්ශන සඳහා | 1,000 0 | 1,500 0 | 3,000 0 |
| 9. | රජයේ හෝ රජයට අනුබද්ධ ආයතන පවත්වන රැස්වීම්, දේශන, වැඩමුළු, සම්මන්ත්‍රණ සඳහා | 1,000 0 | 1,500 0 | 3,000 0 |
| 10. | ගාස්තු අයකරන අධ්‍යාපනික සම්මන්ත්‍රණ සඳහා | 4,000 0 | 2.500 0 | 5.000 0 |
| 11. | ගාස්තු අය නොකරන අධ්‍යාපනික සම්මන්ත්‍රණ සඳහා | 2,000 0 | 1,000 0 | 2,000 0 |
| 12. | පෙර පාසැල් උත්සවයස් සඳහා | 4,000 0 | 1,000 0 | 2,000 0 |
| 13. | රැස්වීමක් සමග සුහද හමුවක් සඳහා | 4,000 0 | 3,000 0 | 6,000 0 |
| 14. | ධර්ම දේශනා/දානමය කටයුතු සඳහා | 2,000 0 | 1,000 0 | 2,000 0 |
| 15. | මුදල් අයකර පෙන්වන නාට්‍ය, මැජික්, සර්කස්, ඒක පුද්ගල ගීත ප්‍රසංග සඳහා | 5,000 0 | 3,000 0 | 6,000 0 |
| 16. | පුද්ගලික උත්සව, දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා | 4,000 0 | 3,000 0 | 6,000 0 |

*සටහන .-*

1. යම් කාරණයක් දින දෙකකට වඩා වෙන් කරන්නේ නම් වැඩිවන සෑම දිනකටම ආරක්ෂිත ඇප රු. 3,000 බැගින් ද,

2. විදුලි ජනක යන්ත්‍රයට පැය 01ක් සඳහා ගාස්තුව රු. 1,500 බැගින්ද,

3. ශබ්දවාහිනී යන්ත්‍රයට දිනක ගාස්තුව රු. 500 ද, අයකරන අතර, ප්‍රජා ශාලාව ප්‍රයෝජනයට ගන්නා දිනට වැය වන ජලය හා විදුලිය භාවිතා කරන තැනැත්තන්ගේ ආරක්ෂිත ඇප මුදලින් අඩුකර ගනු ලැබේ.

### උපලේඛනය 02

| අනු. අංකය | කාරණය | ආරක්ෂිත ඇප රු. ශත | පැය 6ක් හෝ ඊට අඩු කාලයක් සඳහා මුදල රු. ශත | පැය 6ට වැඩි පැය 12ක් හෝ ඊට අඩු කාලයක් සඳහා මුදල රු. ශත |
|---|---|---|---|---|
| 1. | සියලුම ප්‍රසිද්ධ මහජන රැස්වීම් සඳහා | 2,000 0 | 1,000 0 | 1,500 0 |
| 2. | වාහන අලෙවි පොලක් පැවැත්වීම සඳහා | 5,000 0 | 3,000 0 | 5,000 0 |
| 3. | නොමිලයේ පෙන්වනු ලබන සංගීත සංදර්ශන, ක්‍රීඩා තරග, උත්සව හෝ එවැනි වෙනත් කාර්යයන් | 2,000 0 | 1,000 0 | 2,000 0 |
| 4. | මුදල් අයකර පෙන්වනු ලබන සංගීත සංදර්ශන, ක්‍රීඩා තරග, උත්සව හෝ එවැනි වෙනත් කාර්යයන් | 5,000 0 | 2,000 0 | 5,000 0 |
| 5. | සැණකෙලි ස්වරූපයෙන් පවත්වන වෙළෙඳ කුටි, සංගීත සංදර්ශන, වෙනත් විනෝද ක්‍රීඩා හෝ එවැනි වෙනත් කාර්යයන් | 5,000 0 | - | 10,000 0 |
| 6. | මහජන ක්‍රීඩාංගන නොවන සභාව සතු වෙනත් එළිමහන් ස්ථාන සඳහා ගාස්තු අයකිරීම | එක් දිනයක් සඳහා | එක් සතියක් සඳහා | එක් මාසයක් සඳහා |
| I. | හෙට්ටිපොල බස්නැවතුම්පල පිටුපස එළිමහන් කොටස | 2,000 0 | 1,0000 0 | 25,000 0 |
| II. | හෙට්ටිපොල නගරයේ වෙළෙඳ සංකීර්ණයේ ඉදිරිපස කොටස | 2,000 0 | 10,000 0 | 25,000 0 |
| III. | සියඹලාවැව හුදර්ශන ව්‍යාපෘති භූමිය ඉදිරිපිට කොටස | 2,000 0 | 10,000 0 | 35,000 0 |
| IV. | හෙට්ටිපොල නගර සීමාව හා උප නගර ආශ්‍රිත ස්ථාන සඳහා | 1,500 0 | 2,500 0 | 6,000 0 |
| V. | අනෙකුත් ස්ථාන සඳහා | 1,000 0 | 2,000 0 | 4,000 0 |

11 - 72/3

---

## පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව

### කුළී රථ ලියාපදිංචි කිරීම හා අවසර පත්‍ර ගාස්තු පැනවීම - 2018 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු අංක 1711 හා 2011.06.17 දිනැති අතුරු ව්‍යවස්ථාවට අනුව කුළී රථ ලියාපදිංචි කිරීම සඳහා පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2018 වර්ෂයට අදළව කුළීරථ ලියාපදිංචි කිරීම හා අවසර පත්‍ර ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2017.09.20 වැනි දින තීරණ අංක 2017/1656 යටතේ මම තීරණය කරමි.

පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව විසින් වැළඳගත් අංක 1711 දරන 2011.06.17 දිනැති අතුරු ව්‍යවස්ථාවේ කුළි රථ වාහන නවතා තැබීම පිළිබඳව අතුරු ව්‍යවස්ථාව අනුව ආදයමක් උපයා ගැනීමේ අරමුණ ඇතිව නවතා තබන සියලුම කුළී රථ ලියාපදිංචි කිරීමටත් වාර්ෂික අවසරපත්‍ර ගාස්තුවක් අය කිරීමටත්, ඒ අනුව සියලුම කුළී රථවලින් රු. 100ක ලියාපදිංචි ගාස්තුවක් හා පහත සඳහන් වාර්ෂික අවසරපත්‍ර ගාස්තුවක් 2018 වර්ෂය සඳහා පනවා අයකළ යුතු යැයි මම තීරණය කරමි.

### උපලේඛනය

| | | රු. ශත |
|---|---|---|
| * | බස් රථයක් සඳහා දිනකට අවසරපත්‍ර ගාස්තුව | 50 0 |
| * | ට්‍රැක්ටර් අත්ට්‍රැක්ටර් සඳහා මාසික ගාස්තුව | 75 0 |
| * | පාසල් සිසුන් ප්‍රවාහනය කරන බස්රථ, වෑන් රථ වාර්ෂික ගාස්තුව | 900 0 |

| | රු. ශත |
|---|---|
| * වෑන් රථයක් සඳහා වර්ෂයකට අවසරපත්‍ර ගාස්තුව | 1,300 0 |
| * ත්‍රීරෝද රථයක් සඳහා වර්ෂයකට අවසරපත්‍ර ගාස්තුව | 1.300 0 |

එච්. ඒ. ජී. නිශ්ශංක.
ලේකම්,
පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව,
හෙට්ටිපොල.

2017 සැප්තැම්බර් මස 20 වැනි දින,
පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව.

11 - 72/4

---

## පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව

(176 වැනි අධිකාරය) ප්‍රසිද්ධ රඟ දැක්වීම් ආඥාපනත යටතේ පනවනු ලබන ගාස්තු පැනවීම - 2018 වර්ෂය

පඬුවස්නුවර ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්යය, කර්තව්‍ය ඉටුකරන පඬුවස්නුවර ප්‍රාදේශීය සභාවේ ලේකම්, එච්. ඒ. ජී. නිශ්ශංක වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය අනුව එම පනතෙන් ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව "(176 වැනි අධිකාරය) ප්‍රසිද්ධ රඟ දැක්වීම් ආඥාපනතේ (31) වැනි වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර පඬුවස්නුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත මුදල් අයකර පෙන්වනු ලබන සංදර්ශන සඳහා පහත උපලේඛනයෙහි සඳහන් ගාස්තුවක් 2018 වර්ෂයට පනවා අයකළ යුතු බවටත්, එකී බලපත්‍ර ගාස්තුව ගෙවිය යුතු යම් තැනැත්තෙක් සංදර්ශනය පැවැත්වීමට පෙර පඬුවස්නුවර ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත් 2017.09.20 වැනි දින තීරණ අංක 2017/1657 යටතේ මම තීරණය කරමි.

එච්. ඒ. ජී. නිශ්ශංක.
ලේකම්,
පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව,
හෙට්ටිපොල.

2017 සැප්තැම්බර් මස 20 වැනි දින,
පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව.

### උපලේඛනය

1. මුදල් අයකර පෙන්වනු ලබන සංගීත සංදර්ශනයක් හැර අනිකුත් සංදර්ශන සඳහා -

| | රු. ශත |
|---|---|
| එක් දිනකට ගාස්තුව | 200 0 |
| එක් සතියකට ගාස්තුව | 1,000 0 |
| එස් මසකට ගාස්තුව | 2,500 0 |

1. මුදල් අයකර පෙන්වනු ලබන සංගීත සංදර්ශනයක් සඳහා එක් දිනකට රු. 1,200 බැගින් අයකරනු ලැබේ.

11 - 72/5

## පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව

### ප්‍රචාරක දැන්වීම්/දෘශ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථානුකූල ගාස්තු අයකිරීම - 2018 වර්ෂය

පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්යය, කර්තව්‍ය ඉටුකරන පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ ලේකම්, එච්. ඒ. ජී. නිශ්ශංක වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 122 (1) වැනි වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව පඩුවස්නුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2018 වර්ෂයට අදාළව ප්‍රචාරක දැන්වීම්/දෘශ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථා විධිවිධාන අනුව ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය වෙනුවෙන් ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2017.09.20 වැනි දින තීරණ අංක 2017/1658 යටතේ මම තීරණය කරමි. එනම්,

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122 (1) වැනි වගන්තිය යටතේ පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල අනුව 1988.08.23 වැනි දින අංක 520/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින්, 1952 අංක 7 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත්කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාව, පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව මගින් වැළඳගෙන 1998.08.28 වැනි දින අංක 1043 *ගැසට් පත්‍රයේ* iv (ආ) කොටසේ පළකරනු ලැබූ එම අතුරු ව්‍යවස්ථාවේ 39 වැනි අතුරු ව්‍යවස්ථාව වන ප්‍රචාරක දැන්වීම්/දෘෂ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථා විධිවිධාන අනුව, පඩුවස්නුවර ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් වීදියකට, පාරකට, ඇලකට, වැවකට හෝ අහසට පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් පරිදි අවසර පත්‍ර ගාස්තුවක් 2018 වර්ෂය සඳහා පනවා අයකිරීමටත්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු 122 (1) වැනි උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එම අවසර පත්‍ර ගාස්තුව ගෙවිය යුතු යම් තැනැත්තෙකු දැන්වීම ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන දිනට යටත් පිරිසෙයින් දින හතකට පෙර පඩුවස්නුවර ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවීමට නියම කළ යුතු බවටත් මම තීරණය කරමි.

එච්. ඒ. ජී. නිශ්ශංක.
ලේකම්,
පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව,
හෙට්ටිපොල.

2017 සැප්තැම්බර් මස 20 වැනි දින,
පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව.

**උපලේඛනය**

| *ප්‍රචාරක දන්වීම් විස්තරය* | *අවසර පත්‍ර ගාස්තුව රු. ශත* |
|---|---|
| 1. ප්‍රචාරක වෙළෙඳ දැන්වීමක්, පුවරුවක් ප්‍රදර්ශනය කිරීම සඳහා යම් ස්ථානයක සවිකිරීමේ දී හතරැස් අඩියකට - වසරකට | 50 0 |
| 2. යම් තැනැත්තෙකු විසින් උසුලාගෙන යනු ලබන හෝ ගමන් කරන වාහනයකට සවිකර ඇති හෝ මහජනතාවට දැන ගැනීමට හැකිවන පරිදි හෝ යම් තැනක සවිකර තබන ප්‍රචාරක දැන්වීමක් හෝ බැනරයක් සඳහා එක් හතරැස් අඩියකට - මසකට | 20 0 |
| 3. ඉහත අංක (02) සඳහා කාලය මාසයකට හෝ ඉන් කොටසකට වැඩි වන්නේ නම් ඒ සඳහා වර්ග අඩියකට රු. 10 බැගින් අමතර ගාස්තුවක් ගෙවිය යුතුය. | |

11 - 72/6

---

## පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව

### වෙළෙඳ බලපත්‍ර ගාස්තු පැනවීම - 2018 වර්ෂය

පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්යය, කර්තව්‍ය ඉටුකරන පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ ලේකම්, එච්. ඒ. ජී. නිශ්ශංක වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 147 වැනි වගන්තිය හා 149

වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පඩුවස්නුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2018 වර්ෂයට අදළව බලපත්‍ර ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2017.09.20 වැනි දින තීරණ අංක 2017/1659 යටතේ මම තීරණය කරමි. එනම්,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු 147 වැනි වගන්තිය හා 149 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයෙහි 1 වැනි තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා පඩුවස්නුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය අතුළත යම් ස්ථානයක් හෝ පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2018 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ 11 වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් 2018 වර්ෂය සඳහා නියම විය යුතු බවට ද,

තව ද, එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරන සංචාරක මණ්ඩල පනතේ කාර්ය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති පිළිගෙන ඇති හෝටලයක්, ආපන ශාලාවක්, නවාතැන්පලක් වන විටදී ඊට අදළ බලපත්‍ර ලබාදීමේදී එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ 2017 වර්ෂයේ ලැබීම්වලින් 1%ක් බලපත්‍ර ගාස්තු ලෙස 2018 වර්ෂය සඳහා නියම විය යුතු බවටත් මම තීරණය කරමි.

එච්. ඒ. ජී. නිශ්ශංක.
ලේකම්,
පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව,
හෙට්ටිපොල.

2017 සැප්තැම්බර් මස 20 වැනි දින,
පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව.

### උපලේඛනය

| *I වැනි තීරුව* | | *II වැනි තීරුව ස්ථානයේ වාර්ෂික වටිනාකම (රුපියල්)* | | |
|---|---|---|---|---|
| *අනු. අංකය* | *කර්මාන්තයේ ස්වභාවය (බලපත්‍ර)* | *රු.750.00 නොඉක්මවන අවස්ථාවක රු. ශත* | *රු.750.00ට වැඩි රු. 1,500.00 අඩු අවස්ථාවක රු.ශත* | *රු.1,500.00 ඉක්මවන අවස්ථාවක රු. ශත* |
| 1. | ලැගුම් නිවාස | 500 0 | 750 0 | 1,000 0 |
| 2. | හෝටල් | 500 0 | 750 0 | 1,000 0 |
| 3. | බත්කඩ, ආපන ශාලා සහ තේ හෝ කෝපි | 500 0 | 750 0 | 1,000 0 |
| 4. | බේකරි | 500 0 | 750 0 | 1,000 0 |
| 5. | කිරිපට්ටි හා කිරි වෙළෙඳාම | 500 0 | 750 0 | 1,000 0 |
| 6. | ගවගාල් | 500 0 | 750 0 | 1,000 0 |
| 7. | ආහාර විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 8. | මාළු විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 9. | මස් විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |

### උපලේඛනය - I අප්‍රසන්න ව්‍යාපාර

| | | | | |
|---|---|---|---|---|
| 10. | කෘෂිරසායන, පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ විකිණීමට තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | සත්ත්ව පාලනය (මස්, කිරි හෝ බිත්තර සඳහා) | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | පශු වෛද්‍ය ගිමන්හලක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | තොග වශයෙන් විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | පොහොර, හුණු, පිටි හෝ වෙනත් ද්‍රව්‍යයන් දමා තිබූ ගෝනි පිරිසිදු කර විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | පොල්කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | සත්ත්ව ආහාර නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |

| I වැනි තීරුව | | II වැනි තීරුව ස්ථානයේ වාර්ෂික වටිනාකම | | |
|---|---|---|---|---|
| අනු. අංකය | කර්මාන්තයේ ස්වභාවය | රු.750.00 නොඉක්මවන අවස්ථාවක රු. ශත | රු.750.00ට වැඩි රු. 1,500.00 අඩු අවස්ථාවක රු.ශත | රු.1,500.00 ඉක්මවන අවස්ථාවක රු. ශත |
| 18. | පුන්නක්කු නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | අලුත් ලෝහ හෝ පරණ ලෝහ තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 20. | ලෝහ සුන්බුන් තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | ගෘහ භාණ්ඩ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 22. | කුෂන් වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 23. | වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 24. | සිරප් හෝ පළතුරු බීම නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 25. | රසකැවිලි නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 26. | පොල් ලෙලි පෙඟවීම, පල්කිරීම හෝ කැපීම | 500 0 | 750 0 | 1,000 0 |
| 27. | ගඩොල් පිළිස්සීම | 500 0 | 750 0 | 1,000 0 |
| 28. | රා එකතු කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 29. | විනාකිරි නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 30. | දුව ඉරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 31. | කෝපි, ධාන්‍ය වර්ග පිටිකිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 32. | ටයර්, ටියුබ් වෝල්කනයිස් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 33. | සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බෙස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| | **උපලේඛනය - II අන්තරාදයක ව්‍යාපාර** | | | |
| 34. | කළුගල් කැණීම හෝ කැඩීම | 500 0 | 750 0 | 1,000 0 |
| 35. | පොල්තෙල් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 36. | කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 37. | කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් භාණ්ඩ නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 38. | පිදුරු තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 39. | පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 40. | ස්වර්ණාභරණ නිෂ්පාදනය හෝ අලුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 41. | යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 42. | යන්ත්‍රෝපකරණ පාවිච්චිකරන කම්හලක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 43. | හිස් ගෝනි හෝ බෝතල් තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 44. | පා පැදි හෝ යතුරුපැදි අලුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 45. | පාවිච්චිකරන ලද කඩදසි හෝ පත්තර තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 46. | යන්ත්‍රෝපකරණ, ආයුධ උපකරණ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 47. | නළ ළිං ඉදිකරන්නෝ | 500 0 | 750 0 | 1,000 0 |
| | **උපලේඛනය - III අප්‍රසන්න හා අන්තරාදයක ව්‍යාපාර** | | | |
| 48. | ඩ්‍රයික්ලීන් කිරීම හෝ සායම් දැමීම | 500 0 | 750 0 | 1,000 0 |
| 49. | ඇඳුම් මැසීම, රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම හෝ බතික් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 50. | විද්‍යුත් ලෝහ ආලේපනය කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 51. | ලියවන පට්ටල | 500 0 | 750 0 | 1,000 0 |
| 52. | හුණුගල් හෝ හිරිගල් පිළිස්සීම | 500 0 | 750 0 | 1,000 0 |
| 53. | ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 54. | බැටරි විද්‍යුත් ආරෝපන කිරීම හෝ අළුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 55. | ලෝහ වර්ග පෑස්සීම | 500 0 | 750 0 | 1,000 0 |
| 56. | මෝටර් වාහන අලුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 57. | මෝටර් වාහන සේවා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 58. | බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 59. | මෝටර් වාහන බොඩි තැනීම හෝ ටින්කරින් වැඩ | 500 0 | 750 0 | 1,000 0 |
| 60. | බීඩි, සුරුට්ටු නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |

| අනු. අංකය | I වැනි තීරුව<br>කර්මාන්තයේ ස්වභාවය | II වැනි තීරුව<br>ස්ථානයේ වාර්ෂික වටිනාකම<br>රු.750.00 නොඉක්මවන අවස්ථාවක රු. ශත | රු.750.00ට වැඩි රු. 1,500.00 අඩු අවස්ථාවක රු.ශත | රු.1,500.00 ඉක්මවන අවස්ථාවක රු. ශත |
|---|---|---|---|---|
| 61. | සුවඳ කූරු නිෂ්පාදනය හෝ බෙද හැරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 62. | ලී කැටයම් කැපීම හෝ ස්ටිකර් කැපීම | 500 0 | 750 0 | 1,000 0 |
| 63. | මදුරු දැල් මැසීම හෝ අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 64. | රසායනාගාර | 500 0 | 750 0 | 1,000 0 |
| 65. | කායවර්ධන මධ්‍යස්ථාන | 500 0 | 750 0 | 1,000 0 |
| 66. | අයිස්ක්‍රීම්, ජෑම්, පළතුරුබීම, සිසිල් බීම, බිස්කට්, රටකජු, තේ කොළ, අයිස් පැකට් කිරීම හෝ බෙදහැරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 67. | කරවල අලෙවිය හෝ බෙදහැරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 68. | ගෑස් සිලින්ඩර් අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 69. | ඛනිජ තෙල් අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 70. | විදුලි උපකරණ හෝ ගුවන් විදුලි, රූපවාහිනී අලුත්වැඩියාව | 500 0 | 750 0 | 1,000 0 |
| 71. | විදුලි කාර්මික ස්ථාන හෝ මෝටර් එතීම | 500 0 | 750 0 | 1,000 0 |
| 72. | එළවළු අලෙවිය හෝ පළතුරු අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 73. | ශීතකරණ හෝ වායුසමන යන්ත්‍ර අලුත්වැඩියාව | 500 0 | 750 0 | 1,000 0 |
| 74. | මිරිස්, තුනපහ, පිටි, කුළු බඩු, කුරක්කන්, ලුණු පැකට් කිරීම හෝ බෙදාහැරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 75. | ජලය පිරිසිදු කිරීම, ඇසුරුම් කිරීම හෝ බෙද හැරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 76. | දත් බඳින ස්ථාන | 500 0 | 750 0 | 1,000 0 |
| 77. | සාතකාගාර | 500 0 | 750 0 | 1,000 0 |
| 78. | රූපලාවන්‍යාගාර හෝ මනාලියන් හැඩගන්වන ස්ථාන | 500 0 | 750 0 | 1,000 0 |
| 79. | පොල් ලී පැලීම හෝ අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |

11 - 72/7

---

## පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව

### අක්කර බදු පැනවීම - 2018 වර්ෂය

පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්යය, කර්තව්‍ය ඉටුකරන පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ ලේකම්, එච්. ඒ. ජී. නිශ්ශංක වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 134 (3) වැනි වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව පඩුවස්නුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2018 වර්ෂයට අදාළව අක්කර බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2017.09.20 වැනි දින තීරණ අංක 2017/1660 යටතේ මම තීරණය කරමි. එනම්,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2010 වර්ෂයේදී බලාත්මක කරන ලද සත්‍යොක්ෂණය කිරීම 2018 වර්ෂය සඳහා පිළිගැනීමටත් එකී තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු 134 (3) වැනි උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත ඉහත කී තක්සේරුව සඳහා 135 වැනි වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තා වූ ද ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූ ද,

හෙක්ටයාර් 05කට අඩු නමුත් හෙක්ටයාර් 01කට නොඅඩු ඉඩමක් සඳහා ම 2018 වර්ෂය සඳහා රුපියල් පනහ (50) බැගින් ද,

හෙක්ටයාර් 05ක් හෝ ඊට වැඩි සෑම ඉඩමක් වෙනුවෙන් එකී ඉඩමේ සෑම හෙක්ටයාරයක් මත ම 2018 වර්ෂය සඳහා රුපියල් දහයක් (10) බැගින් වන වාර්ෂික බද්දක් පනවා අය කිරීමටත්,

ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (6) වැනි උපවගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු මස 31, ජූනි මස 30, සැප්තැම්බර් මස 30 හා දෙසැම්බර් මස 31 යන දිනවලට පෙර සමාන වාරික හතරකින් පඬුවස්නුවර ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවීමට නියම කළ යුතු බවටත් මම තීරණය කරමි.

එච්. ඒ. ජී. නිශ්ශංක.
ලේකම්,
පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව,
හෙට්ටිපොල.

2017 සැප්තැම්බර් මස 20 වැනි දින,
පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව.

11 - 72/8

---

**පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව**

සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම - 2018 වර්ෂය

පඬුවස්නුවර ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්යය, කර්තව්‍ය ඉටුකරන පඬුවස්නුවර ප්‍රාදේශීය සභාවේ ලේකම්, එච්. ඒ. ජී. නිශ්ශංක වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 153 (1) වැනි වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව පඬුවස්නුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2018 වර්ෂයට අදාළව සංවර්ධනය නොකළ ඉඩම් මත බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2017.09.20 වැනි දින තීරණ අංක 2017/1661 යටතේ මම තීරණය කරමි. එනම්,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු 153 (1) වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පඬුවස්නුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි ගොඩනැගිලි ඉදිකිරීමට හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක,

(අ) ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම් හෝ,
(ආ) ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති විට හෝ,
(ඇ) ඒ ඉඩමේ ඉදිකර ඇති ගොඩනැගිලිවලට ඇත්ත වශයෙන්ම යටවී ඇති බිම් ප්‍රමාණය සහ ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය අටට එක (8:1)ට වඩා අඩු වන්නේ නම්.

එකී ඉඩම සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැළකෙන ඉඩම මත 2018 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ ප්‍රාග්ධන අගයෙන් සියයට එකයි දශම පහ (1.5%)ක වාර්ෂික බද්දක් 2018 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවීමට නියම කළ යුතු බවට මම තීරණය කරමි.

එච්. ඒ. ජී. නිශ්ශංක.
ලේකම්,
පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව,
හෙට්ටිපොල.

2017 සැප්තැම්බර් මස 20 වැනි දින,
පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව.

11 - 72/9

## පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව

### කර්මාන්ත බදු පැනවීම - 2018 වර්ෂය

පඬුවස්නුවර ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්යය, කර්තව්‍ය ඉටුකරන පඬුවස්නුවර ප්‍රාදේශීය සභාවේ ලේකම්, එච්. ඒ. ජී. නිශ්ශංක වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 150 (1) වැනි වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව පඬුවස්නුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2018 වර්ෂයට අදළව කර්මාන්ත බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2017.09.20 වැනි දින තීරණ අංක 2017/1662 යටතේ මම තීරණය කරමි. එනම්,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 150 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පඬුවස්නුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2018 වර්ෂය සඳහා නියම විය යුතු බවට මම තීරණය කරමි.

එච්. ඒ. ජී. නිශ්ශංක.
ලේකම්,
පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව,
හෙට්ටිපොල.

2017 සැප්තැම්බර් මස 20 වැනි දින,
පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව.

**උපලේඛනය**

| *I වැනි තීරුව* | | *II වැනි තීරුව ස්ථානයේ වාර්ෂික වටිනාකම* | | |
|---|---|---|---|---|
| *අනු. අංකය* | *කර්මාන්තයේ ස්වභාවය (කර්මාන්ත)* | *රු.750.00 නොඉක්මවන අවස්ථාවක* | *රු.750.00ට ඉක්මවන එහෙත් රු. 1,500.00 නොඉක්මවන අවස්ථාවකදී* | *රු.1,500.00 ඉක්මවන අවස්ථාවක දී* |
| | | *රු. ශත* | *රු.ශත* | *රු. ශත* |
| 01 | මැටි ආශ්‍රිත නිෂ්පාදන කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 02 | කොහු ලණු අඹරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 03 | කොප්පරා මැස්සක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 04 | ඩෙසිකටි පොල් නිපදවන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 05 | බිම්මල් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 06 | බෑග් නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 07 | ගඩොල් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 08 | සපත්තු නිපදවන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 09 | කජු මද නිපදවන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 10 | වේවැල් ආශ්‍රිත භාණ්ඩ නිපදවන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

11 - 72/10

---

## පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව

### වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම - 2018 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 147 වැනි වගන්තිය හා 148 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පඬුවස්නුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2018 වර්ෂයට අදළව වාහන හා සතුන් පිළිබඳ පහත සඳහන් ආකාරයට බදු පැනවිය යුතු බවට 2017.09.20 වැනි දින තීරණ අංක 2017/1663 යටතේ මම තීරණය කරමි. එනම්,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 148 වැනි වගන්තිය යටතේ පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර පඩුවස්නුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2018 වර්ෂයේදී පහත සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙක්ගෙන්ම ඊට අදාළ බද්ද 2018 වර්ෂය සඳහා අයකළ යුතු යැයි මම තීරණය කරමි.

**උපලේඛනය**

| | | රු. ශ. |
|---|---|---|
| * | මෝටර් රථයක්, මෝටර් ට්‍රයිසිකලයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජීප් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා | 25 0 |
| * | සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා - | |
| | (අ) වෙළඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම් | 18 0 |
| | (ආ) වෙළඳ කාර්ය නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම් | 4 0 |
| * | සෑම කරත්තයක් සඳහා | 20 0 |
| * | සෑම අත් කරත්තයක් සඳහා | 10 0 |
| * | සෑම රික්ෂෝවක් සඳහා | 7 50 |
| * | සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටලුවෙකු සඳහා | 15 0 |
| * | සෑම ඇතෙකු සඳහා | 50 0 |

(2) විෂ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝක සහිත ළමා වාහන, වීල්බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්ය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළෙඳ කාර්ය සඳහා නොයොදවන අත්කරත්ත ඉහත සඳහන් ගෙවීමෙන් නිදහස් කෙරේ.

එච්. ඒ. ජී. නිශ්ශංක.
ලේකම්,
පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව,
හෙට්ටිපොල.

2017 සැප්තැම්බර් මස 20 වැනි දින,
පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව.

11 - 72/11

---

## පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව

### ව්‍යාපාර බදු පැනවීම - 2018 වර්ෂය

පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්යය, කර්තව්‍ය ඉටුකරන පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ ලේකම්, එච්. ඒ. ජී. නිශ්ශංක වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 152 (1) වැනි උපවගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව පඩුවස්නුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2018 වර්ෂයට අදාළව ව්‍යාපාර බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2017.09.20 වැනි දින තීරණ අංක 2017/1664 යටතේ මම තීරණය කරමි. එනම්,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු 152 වැනි උපවගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබාගැනීම හෝ එම පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නාවූ යම් ව්‍යාපාරයක් පඩුවස්නුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2018 වර්ෂයේදී පවත්වාගෙන යන සෑම තැනැත්තෙක්ගෙන්ම එම ව්‍යාපාරයේ 2017 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයේ 1 වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එකී පනතේ 11 වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2018 වර්ෂය සඳහා නියම විය යුතු බවට මම තීරණය කරමි.

**උපලේඛනය**

| *I වන තීරුව*<br>*2017 වර්ෂයේදී ව්‍යාපාරයේ ආදායම* | *II වන තීරුව*<br>*රු. ශත* |
|---|---|
| රු. 6,000 නොඉක්මවන අවස්ථාවක | කිසිවක් නැත |
| රු. 6,000 ඉක්මවන නමුත් රු.12,000 නොඉක්මවන අවස්ථාවක | 90.00 |
| රු. 12,000 ඉක්මවන නමුත් රු.18,750 නොඉක්මවන අවස්ථාවක | 180.00 |
| රු. 18,750 ඉක්මවන නමුත් රු.75,000 නොඉක්මවන අවස්ථාවක | 360.00 |
| රු. 75,000 ඉක්මවන නමුත් රු.1,50,000 නොඉක්මවන අවස්ථාවක | 1,200.00 |
| රු. 1,50,000 ඉක්මවන විට | 3,000.00 |

එච්. ඒ. ජී. නිශ්ශංක.
ලේකම්,
පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව,
හෙට්ටිපොල.

2017 සැප්තැම්බර් මස 20 වැනි දින,
පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව.

***උපලේඛනය***

| *අනු. අංකය* | *ව්‍යාපාර බදු* |
|---|---|
| 1. | දේශීය විදේශීය බෙහෙත් ශාලා. |
| 2. | සිල්ලර කඩ. |
| 3. | සිල්ලර හෝ තොග වෙළෙඳාම. |
| 4. | උත්සව භාණ්ඩ කුලියට දීම. |
| 5. | බිත්තර අලෙවිය. |
| 6. | ඇස් කණ්නාඩි අලෙවිය. |
| 7. | වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම. |
| 8. | සත්ව ආහාර හෝ සත්ව බෙහෙත් අලෙවිය. |
| 9. | උත්සව ශාලා පහසුකම් සැපයීම. |
| 10. | උත්සව භාණ්ඩ කුළියට සැපයීම. |
| 11. | සිංහල බෙහෙත් අලෙවිය. |
| 12. | ඉංග්‍රීසි බෙහෙත් අලෙවිය. |
| 13. | ආයුර්වේද බෙහෙත් ශාලා. |
| 14. | ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවිය. |
| 15. | නිවාස, ගොඩනැගිලි සැලසුම් හෝ සිවිල් ඉංජිනේරු කටයුතු, |
| 16. | පොත්, පත්තර අලෙවිය. |
| 17. | ලිපිද්‍රව්‍ය, පාසැල් උපකරණ අලෙවිය. |
| 18. | නොතාරිස් කාර්යාල. |
| 19. | පොල් එකතු කිරීම. |
| 20. | වාහන (පා පැදි, යතුරු පැදි, කෘෂි වාහන) අලෙවිය. |
| 21. | යන්ත්‍ර සූත්‍ර අලෙවිය. |
| 22. | වාහන අමතර කොටස් අලෙවිය. |
| 23. | වාහන දුම් පරීක්ෂාව. |
| 24. | වාහන බර කිරීම. |
| 25. | මංගල උපකරණ කුළියට සැපයීම. |
| 26. | අවමංග්‍ය භාණ්ඩ අලෙවිය. |
| 27. | සිමෙන්ති බෙදා හැරීම හෝ අලෙවිය. |
| 28. | පැළ වර්ග අලෙවිය හෝ පැළ තවාන්. |
| 29. | දේශීය ද්‍රව්‍ය මිළිදී ගැනීම හා අලෙවිය. |

| *අනු. අංකය* | *ව්‍යාපාර බදු* |
|---|---|
| 30. | සුරතල් මසුන් හෝ උපකරණ අලෙවිය. |
| 31. | බිම් උළු, සෙරමික් භාණ්ඩ, උළු හෝ ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවිය. |
| 32. | ඡායාරූප ශාලා පවත්වාගෙන යාම. |
| 33. | බුලත් විට වෙළෙඳාම. |
| 34. | ගෘහ භාණ්ඩ ප්‍රදර්ශනාගාර හෝ අලෙවිය. |
| 35. | ලී අලෙවිය. |
| 36. | පශු වෛද්‍ය (සත්ව) සායන මධ්‍යස්ථාන. |
| 37. | ජංගම දුරකථන හෝ උපාංග අලෙවිය. |
| 38. | දුරකථන, ෆැක්ස්, ලිපි සැකසීම හෝ සේවා සැපයීම. |
| 39. | පරිගණක යන්ත්‍ර අළුත්වැඩියා කරන ස්ථාන. |
| 40. | ජංගම දුරකථන අළුත්වැඩියා කිරීම. |
| 41. | විද්‍යුත් උපාංග හෝ විද්‍යුත් පරිපථ අලෙවිය. |
| 42. | සංයුක්ත තැටි අලෙවිය |
| 43. | වීදුරු අලෙවිය. |
| 44. | ප්‍රවාහන සේවා සපයන ආයතන. |
| 45. | බල මෙවලම් හෝ කුළී රථ සේවා ආයතන. |
| 46. | ස්වර්ණාභරන අලෙවිය. |
| 47. | තෑගි භාණ්ඩ හෝ විසිතුරු භාණ්ඩ අලෙවිය. |
| 48. | ඇලුමිනියම්, ප්ලාස්ටික් භාණ්ඩ අලෙවිය. |
| 49. | විදුලි උපකරණ අලෙවිය. |
| 50. | පාවහන් අලෙවිය. |
| 51. | ටයර් ටියුබ් අලෙවිය. |
| 52. | ලොතරැයි අලෙවිය. |
| 53. | මැටි හෝ සිමෙන්ති භාණ්ඩ අලෙවිය. |
| 54. | ඉදල්, කොසු හෝ ආශ්‍රිත භාණ්ඩ අලෙවිය. |
| 55. | විදේශ රැකියා නියෝජිත ආයතන. |
| 56. | රිය පුහුණු පාසැල් හෝ ආයතන. |
| 57. | උපකාරක පන්ති හෝ පුද්ගලික පන්ති පවත්වන ආයතන. |
| 58. | ගාස්තු අයකරන පෙරපාසැල්. |
| 59. | බැංකු ව්‍යාපාර, රක්ෂණ හෝ ලීසිං ආයතන. |
| 60. | ඉඩම් මිළදී ගැනීම, විකිණීම හෝ තැරැව්කරුවන්. |
| 61. | කොන්ත්‍රාත්කරුවන් හෝ කොන්ත්‍රාත් පදනම යටතේ සේවකයින් සැපයීම |
| 62. | රටබීම අලෙවි සැල් හෝ බියර් අලෙවිය. |
| 63. | පිත්තල භාණ්ඩ අලෙවිය. |
| 64. | සංගීත භාණ්ඩ හෝ උපකරණ සැපයීම. |
| 65. | රෙදිපිළි අලෙවි කරන ආයතන. |
| 66. | පින්තූර රාමු කිරීම. |
| 67. | ඔරලෝසු අළුත්වැඩියා කිරීම. |
| 68. | බෑග් අලෙවිය. |
| 69. | ශබ්ද විකාශන යන්ත්‍ර කුළියට දීම. |
| 70. | ලිහිසි තෙල් අලෙවිය. |
| 71. | ඉන්ධන පිරවුම්හලක් පවත්වාගෙන යාම. |
| 72. | ගණන් පරීක්ෂක ආයතනයක් පවත්වාගෙන යාම. |
| 73. | පුද්ගලික රෝහලක් පවත්වාගෙන යාම. |
| 74. | පුද්ගලික රථගාලක් පවත්වාගෙන යාම. |
| 75. | රේස් ඔට්ටුවක් පවත්වාගෙන යාම. |
| 76. | සමුපකාර ප්‍රාදේශිකයක්/කෝප්සිටියක් පවත්වාගෙන යාම. |
| 77. | සුපිරි වෙළඳ සැලක් පවත්වාගෙන යාම. |
| 78. | විදුලි සංදේශ කුළුණු. |
| 79. | කෘෂි උපකරණ අලෙවිය. |
| 80. | පූජා භාණ්ඩ, සුවඳ විලවුන් අලවේය. |

| *අනු. අංකය* | *ව්‍යාපාර බදු* |
|---|---|
| 81. | සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන අලෙවිය. |
| 82. | විසිතුරු මල් අලෙවිය. |
| 83. | කිරි ආශ්‍රිත අතුරු නිෂ්පාදන අලෙවිය |
| 84. | පානීය ජලය බෙද හැරීම. |
| 85. | පරණ යකඩ අලෙවිය. |

11 - 72/12

---

## පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව

### ඇතැම් ඉඩම් විකිණීම විෂයෙහි බදු අයකිරීම - 2018 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 154 (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පඩුවස්නුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2018 වර්ෂයට අදාළව ඇතැම් ඉඩම් විකිණීම විෂයෙහි බදු අයකිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2017.09.20 වැනි දින තීරණ අංක 2017/1665 යටතේ මම තීරණය කරමි. එනම්,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 (1) වැනි වගන්තිය ප්‍රකාරව පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ පාලන සීමාව තුළ පිහිටි යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයකු හෝ අනු නියෝජිතයකු විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක, එම ඉඩම විකිණීමෙන් ලත් මුදලින් සියයට එකක (1%) ට සමාන බද්දක් පනවා අයකළ යුතු බවට පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදනු ලදුව 2015.01.20 වැනි දින අංක 1898/28 හා 2015.08.28 වැනි දින අංක 1929/45 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍ර*වල පළකර සංශෝධනය කරන ලද 2014.10.01 දිනැති අංක 1882/22 දරන දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවාස දේපළ සංවර්ධනය හා ඉඩම් කට්ටිකර විකිණීම පිළිබඳ අතුරුව්‍යවස්ථාව අනුව එකී ඉඩමේ සංවර්ධන සැලැස්ම හෝ අනු බෙදුම අනුමත කරවා ගැනීම සඳහා පරීක්ෂණ ගාස්තු වශයෙන් පහත උපලේඛනයේ සඳහන් ගාස්තුවක් 2018 වර්ෂය සඳහා පනයා අයකළ යුතු බවටත්, එකී බදු හා ගාස්තු කොන්ත්‍රාත් විකුණුම්කරු, වෙන්දේසිකරු හෝ තැරැව්කරු හෝ ඔහුගේ සේවකයා හෝ අනු නියෝජිතයා විසින් පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් මම තීරණය කරමි.

එච්. ඒ. ජී. නිශ්ශංක.
ලේකම්,
පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව,
හෙට්ටිපොල.

2017 සැප්තැම්බර් මස 20 වැනි දින,
පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව.

**උපලේඛනය**

| *ඉඩමේ ප්‍රමාණය* | *සංවර්ධන සැලැස්ම අනුමත කිරීම සඳහා ගාස්තුව රු. ශත* | *අනු බෙදුම අනුමත කිරීම සඳහා ගාස්තුව රු. ශත* |
|---|---|---|
| හෙක්ටයාර් 01ට අඩු | 500 0 | 500 0 |
| හෙක්ටයාර් 01ට වැඩි 02 දක්වා | 700 0 | 700 0 |
| හෙක්ටයාර් 02ට වැඩි 04 දක්වා | 1,000 0 | 1,000 0 |
| හෙක්ටයාර් 04ට වැඩි | 1,250 0 | 1,250 0 |

11 - 72/13

## පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව

### වරිපනම් බදු පැනවීම - 2018 වර්ෂය

පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්යය, කර්තව්‍ය ඉටුකරන පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ ලේකම්, එච්. ඒ. ජී. නිශ්ශංක වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 134 (1) වැනි වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව පඩුවස්නුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2018 වර්ෂයට අදාළව වරිපනම් බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2017.09.20 වැනි දින තීරණ අංක 2017/1666 යටතේ මම තීරණය කරමි. එනම්,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දියුණු ගම් ප්‍රදේශ යැයි ප්‍රකාශයට පත් කර ඇත්තා වූ ප්‍රදේශය ඇතුළ පිහිටියා වූ නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල හා ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා 2013 වර්ෂය සඳහා වූ තක්සේරුව/සත්‍යක්ෂණය 2018 වර්ෂය සඳහා තක්සේරුව/සත්‍යක්ෂණය ලෙස සම්මත කළ යුතු බවටත් එකී තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු 134(1) වැනි උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත ඉහත කී තක්සේරුව සඳහා වාර්ෂික වටිනාකමින් සියයට පහක (5%) වාර්ෂික වරිපනම් බද්දක් නියම විය යුතු බවටත්,

තව ද , 2018 වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද පඩුවස්නුවර ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2018 වර්ෂයෙහි ජනවාරි මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%)ක වට්ටමක් ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වැනි තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බදු මුදල පඩුවස්නුවර ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක කාර්තුවකට අදාළ මුදලින් (සියයට පහක) 5%ක වට්ටමක් ද පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව ලබා දිය යුතු බවටත් තීරණය කරමි.

*උපලේඛනය*

| *කාර්තුව* | *ගෙවිය යුතු දිනය* | *5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය* |
|---|---|---|
| පළමුවන කාර්තුව | 2018.03.31 | 2018.01.31 |
| දෙවන කාර්තුව | 2018.06.30 | 2018.04.30 |
| තුන්වන කාර්තුව | 2018.09.30 | 2018.07.31 |
| හතරවන කාර්තුව | 2018.12.31 | 2018.10.31 |

එච්. ඒ. ජී. නිශ්ශංක.
ලේකම්,
පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව,
හෙට්ටිපොල.

2017 සැප්තැම්බර් මස 20 වැනි දින,
පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව.

11 - 72/14

## මාවනැල්ල ප්‍රාදේශීය සභාව

### 2018 වර්ෂය ව්‍යාපාර බද්දක් පැනවීම

මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් ඩබ්ලිව්. ඩී. කේ. ඒකනායක වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනෙත් 9:3 වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 152 (1) වගන්තිය ප්‍රකාරව මාවනැල්ල ප්‍රාදේශීය සභා ලේකම් වශයෙන් 2018 වර්ෂයට අදළව ව්‍යාපාර බදු පැනවීම සම්බන්ධයෙන් පහත සඳහන් තීරණය වර්ෂ 2017 සැප්තැම්බර් මස 28 වැනි දින අංක 2017/619 යටතේ ගන්නට යෙදුනු බව මෙයින් නිවේදනය කරමි.

ඩබ්. ඩී. කේ. ඒකනායක,
ලේකම්,
මාවනැල්ල ප්‍රාදේශීය සභාව.

2017 සැප්තැම්බර් මස 28 වැනි දින,
මාවනැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් ඩබ්. ඩී. කේ. ඒකනායක වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනෙත් 9:3 වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 152(1) උපවගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව මාවනැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2018 වර්ෂයට අදළව ව්‍යාපාර බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට මම තීරණය කරමි. එනම්,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9:3 වගන්තිය සමඟ කියවිය යුතු 152 වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබාගැනීම හෝ එම පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් මාවනැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2018 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙකුගෙන්ම එම ව්‍යාපාරයේ 2017 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණය අනුව ව්‍යාපාර බද්දක් 2018 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්,

*(අ)* 2017 වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දින පැවැති යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් යථෝක්ත බද්ද 2018 මාර්තු 31 වැනි දිනට එම බද්දට යටත් තැනැත්තා විසින් ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට විධානය කිරීමට, සහ

*(ආ)* 2018 වර්ෂයේ දී ආරම්භ කරනු ලබන ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වූ විට යථෝක්ත බද්ද ව්‍යාපාරය ආරම්භ කොට මසක් ඇතුළත ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන තැනැත්තා විසින් ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු යැයි විධානය කිරීමට, මම තීරණය කරමි.

### උපලේඛනය

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* |
|---|---|
| *2017 වර්ෂයේදී ව්‍යාපාර ආදයම* | *රු. ශත* |
| රු. 6,000 නොඉක්මවන අවස්ථාවක | කිසිවක් නැත |
| රු. 6,000 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක | 90 0 |
| රු. 12,000 ඉක්මවන එහෙත් රු. 18,750 නොඉක්මවන විට | 180 0 |
| රු. 18,750 ඉක්මවන එහෙත් රු. 75,000 නොඉක්මවන විට | 360 0 |
| රු. 75,000 ඉක්මවන එහෙත් රු. 1,50,000 නොඉක්මවන විට | 1,200 0 |
| රු. 1,50,000 ඉක්මවන විට | 3,000 0 |

*පහත සඳහන් බදු ගෙවීමට යටත් ව්‍යාපාර හා වෘත්තීන් සම්බන්ධ විස්තර ඃ*

01. වෙන්දේසි කටයුතු.
02. උකස් මධ්‍යස්ථාන.
03. පෞද්ගලික අධ්‍යාපන ආයතන.
04. රක්ෂණ නියෝජිත ආයතන.
05. කුලී රථ සේවා.
06. වාහන සහ වාහන අමතර කොටස් වෙළඳාම.
07. රියැදුරු පුහුණු පාසල්.
08. මිනින්දෝරු කාර්යාල (පෞද්ගලික).
09. උත්සව ශාලා.
10. නීති හා නොතාරිස් කාර්යාල පැවැත්වීම.
11. පෞද්ගලික රෝහලක් පවත්වාගෙන යාම.
12. රේස් ඔට්ටු භාරගන්නන්.
13. බැංකු හා මූල්‍ය ආයතනයක් පවත්වාගෙන යාම.
14. රැකියා ඒජන්සි පවත්වාගෙන යම (මෙරට/විදේශ).
15. වෛද්‍ය පරීක්ෂණාගාරයක් පවත්වාගෙන යාම.
16. යම් භාණ්ඩ ගබඩාවක් පවත්වාගෙන යාම.
17. යම් භාණ්ඩයක් බෙදාහැරීමේ කටයුතු කිරීම.
18. යම් භාණ්ඩයක් ද්‍රව්‍ය සපයන්නෙකු ලෙස කටයුතු කිරීම
(ගොඩනැගිලි ද්‍රව්‍ය, මස්, මාළු, වෙනත්).
19. මත්පැන් හා රටබීම විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
20. කුළුබඩු උයනක් සංචාරකයන් සඳහා පවත්වාගෙන යාම.
21. සිල්ලර වෙළෙඳසැල.
22. විසිතුරු බඩු/තෑගි භාණ්ඩ/සාප්පු බඩු/සෙල්ලම් බඩු අලෙවිය.
23. ග්‍රොසරියක් පවත්වාගෙන යාම.
24. මෙරට ද්‍රව්‍ය මිළට ගැනීම.
25. විසිතුරු පැල අලෙවිය.
26. ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවිය.
27. වීදුරු අලෙවිය.
28. දර විකිණීම.
29. ගුවන් විදුලි යන්ත්‍ර/රූපවාහිනී යන්ත්‍ර/විදුලි උපකරණ අලෙවිය, අළුත්වැඩියාව
30. යන්ත්‍ර සූත්‍ර සහ අමතර කොටස් අලෙවිය.
31. ඇලුමිනියම්, ප්ලාස්ටික් භාණ්ඩ අලෙවිය.
32. සන්නිවේදන පියසක්.
33. ගෘහ උපකරණ අලෙවිය/අලුත්වැඩියාව.
34. වාහන දුම්පරීක්ෂාව.
35. පරිගණක විකිණීම.
36. ෆොටෝ කොපි/ලැමිනේටින්/බයින්ඩින්.
37. ලිපිද්‍රව්‍ය අලෙවිය.
38. පාසැල් උපකරණ විකිණීම.
39. වීඩියෝ /දර්ශන පටි/සීඩී විකිණීම.
40. ස්ටිකර්/නාමපුවරු සැකසීම/අලෙවිය.
41. ජ්‍යොතිෂ කාර්යාල පවත්වාගෙන යාම.
42. ජංගම දුරකථන අලෙවිය.
43. ලොතරැයි අලෙවිය හා/හෝ බෙදහැරීම.
44. යතුරු කැපීම.
45. ඡයාරූප ශාලාවක් පවත්වාගෙන යාම.
46. සිවුරු අටපිරිකර හා පූජා භාණ්ඩ අලෙවිය.
47. මංගල, අවමංගල්‍යය උත්සව සඳහා භාණ්ඩ සැපයීම

48. ළමා ඇඳුම් හා/හෝ ළමා උපකරණ අලෙවිය.
49. ඇඳුම් මැසීම.
50. නිමි ඇඳුම් හා රෙදිපිළි විකිණීම
51. පාපැදි විකිණීම හා/හෝ අලුත් වැඩියාව
52. ඇස් කණ්නාඩි අලෙවිය.
53. ස්වර්ණාභරණ අලෙවිය.
54. බුලත් පුවක්/පොල්තෙල්/තේ කොළ/තුනපහ/ඖෂධ වර්ග/කුළුබඩු අලෙවිය.
55. ඉදල්/කොහ/ලුණු/බුරුසු ආශ්‍රිත භාණ්ඩ අලෙවිය.
56. ස්වයං රැකියා ව්‍යාපාර
57. දේශීය, බටහිර ඖෂධ වර්ග විකිණීම හා/හෝ ප්‍රතිකාර කිරීම.
58. පාවහන්, බෑග් අලෙවිය
59. සහල් අලෙවිය.
60. දුරකථන කුළුණු.

11 - 229/1

---

## මාවනැල්ල ප්‍රාදේශීය සභාව

2018 වර්ෂයට බලපත්‍ර ගාස්තු පැනවීම

මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් ඩබ්. ඩී. කේ. ඒකනායක වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9:3 වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 147 වැනි වගන්තිය හා 149 වැනි වගන්ති ප්‍රකාරව මාවනැල්ල ප්‍රාදේශීය සභා ලේකම් වශයෙන් 2018 වර්ෂයට අදාළව බලපත්‍ර ගාස්තු පැනවීම සම්බන්ධයෙන් පහත සඳහන් තීරණය වර්ෂ 2017 සැප්තැම්බර් මස 28 වැනි දින අංක 2017/620 යටතේ ගන්නට යෙදුනු බව මෙයින් නිවේදනය කරමි.

ඩබ්. ඩී. කේ. එකනායක,
ලේකම්,
මාවනැල්ල ප්‍රාදේශීය සභාව.

2017 සැප්තැම්බර් මස 28 වැනි දින,
මාවනැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් ඩබ්. ඩී. කේ. ඒකනායක වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9:3 වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 147 වැනි වගන්තිය හා 149 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මාවනැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2018 වර්ෂයට අදාළව බලපත්‍ර ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට මම තීරණය කරමි. එනම්,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9:3 වගන්තිය සමඟ කියවිය යුතු 147 වන වගන්තිය හා 149 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා මාවනැල්ල ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් ස්ථානයක් හෝ පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2018 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් අය කළ යුතු යැයි ද, එම මුදල 2018 මාර්තු 31 දිනට පෙර ගෙවිය යුතු බවද මම තීරණය කරමි.

තව ද, එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරන සංචාරක මණ්ඩල පනතේ කාර්යය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති, පිළිගෙන ඇති හෝටලයක්, ආපන ශාලාවක්, නවාතැන්පලක් වන විට දී, ඊට අදළ බලපත්‍ර ලබාදීමේ දී එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ 2017 වර්ෂයේ ලැබීම්වලින් 1%ක් බලපත්‍ර ගාස්තුව ලෙස 2018 වර්ෂයේ නියම විය යුතු බවටත් මම තීරණය කරමි.

**උපලේඛනය**

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | | |
|---|---|---|---|
| *බලය දෙනු ලබන කාර්යය* | *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම* | | |
| | *රු. 750 නොඉක්මවන අවස්ථාවක* | *රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක* | *රු. 1,500 ඉක්මවන අවස්ථාවක* |
| | *රු. ශ.* | *රු. ශ.* | *රු. ශ.* |
| ලැගුම් නිවාසයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| හෝටලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| බත් කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| ආපන ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| තේ/කෝපි කඩයක් පවත්වාගෙන යාම - (ගම්බද) | 300 0 | 500 0 | 750 0 |
| තේ/කෝපි කඩයක් පවත්වාගෙන යාම - (නගර බද) | 500 0 | 750 0 | 1,000 0 |
| බේකරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| කිරි විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| මාළු විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| ශීතකළ මස් විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| අයිස් නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| සිසිල් බීම කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| පෞද්ගලික වෙළෙඳ පොළක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| කොණ්ඩා සැකසීමේ සැලූන් හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| රූපලාවන්‍ය ආයතනයක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| කුකුළු ගොවිපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| යාන්ත්‍රික වඩුමඩුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| දැව පදම් කිරීම/තුනී ලෑලි නිෂ්පාදනය කටයුතු | 500 0 | 750 0 | 1,000 0 |
| ලී ලියවන පට්ටල් භාවිතා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| දැව ගබඩා කිරීමේ ස්ථාන | 500 0 | 750 0 | 1,000 0 |
| යාන්ත්‍රික ලී මෝලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| පොල් පරාල සකස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| ගෘහ භාණ්ඩ නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| තෙල්වලින් හෝ වෙනත් දැවෙන ද්‍රව්‍යවලින්, වාෂ්ප හෝ විදුලි බලයෙන් ක්‍රියා කරන ව්‍යාපාරයක් හෝ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| ලෝහ ලියවන පට්ටල | 500 0 | 750 0 | 1,000 0 |
| වැල්ඩින් වැඩපලක් | 500 0 | 750 0 | 1,000 0 |
| තීන්ත හා වාර්නිෂ් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| බැටරි චාර්ජ් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 750 0 |
| සිමෙන්ති ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| උළු ගඩොල් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| වාහන බොඩි සෑදීම/අලුත්වැඩියාව | 500 0 | 750 0 | 1,000 0 |
| කොන්ක්‍රීට් භාණ්ඩ නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| යතුරු පැදි අලුත්වැඩියාව | 500 0 | 750 0 | 1,000 0 |
| වාහන අලුත්වැඩියාව | 500 0 | 750 0 | 1,000 0 |
| වාහන සේදුම් පළවල් | 500 0 | 750 0 | 1,000 0 |
| ඉන්ධන පිරවුම්හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| ගරාජයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| කම්මලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| තහඩු කැපීමේ හා නැවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| බිත්තර අළෙවිය | 500 0 | 750 0 | 1,000 0 |

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | | |
|---|---|---|---|
| *බලය දෙනු ලබන කාර්යය* | *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම* | | |
| | *රු. 750 නොඉක්මවන අවස්ථාවක* | *රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක* | *රු. 1,500 ඉක්මවන අවස්ථාවක* |
| | *රු. ශ.* | *රු. ශ.* | *රු. ශ.* |
| තේ කුඩු පැකට් කර අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| කරවල විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| පොහොර හා කෘෂි රසායනික ද්‍රව්‍ය/කෘෂි උපකරණ නිෂ්පාදනය/ හෝ අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| පොල්තෙල් හිඳින ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| රසායනික ද්‍රව්‍ය නිෂ්පාදනය හා/හෝ අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| රසකැවිලි නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| යන්ත්‍රෝපකරණ භාවිතා කරන කම්හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| සිල්ක් හෝ කෘත්‍රිම රෙදි විසිතුරු කිරීම (බතික්) | 500 0 | 750 0 | 1,000 0 |
| සම් භාණ්ඩ නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| සබන් වර්ග හා සුවඳ විලවුන් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| හඳුන්කූරු නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| යන්ත්‍රානුසාරයෙන් කොහු මෝලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| පපඩම් නිෂ්පාදනය හා/හෝ අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| ගිනි පෙට්ටි නිෂ්පාදනය හා/හෝ අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| ගිනිකෙළි භාණ්ඩ ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| සුරුට්ටු, බීඩි නිෂ්පාදනය හා/හෝ අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| බෝතල්ගත කළ පානීය ජලය අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| එල්පී ගෑස් විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| රබර් ආශ්‍රිතව කරන භාණ්ඩ නිපදවීමේ කර්මාන්ත ශාලාවක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| රබර් රෝලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| කෘත්‍රිම දත් බැඳීම | 500 0 | 750 0 | 1,000 0 |
| සුදු යකඩ වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| රථ වාහන ඉලෙක්ට්‍රික් වැඩ | 500 0 | 750 0 | 1,000 0 |
| ත්‍රිරෝද රථ අලුත්වැඩියාව | 500 0 | 750 0 | 1,000 0 |
| අලුත් හෝ පරණ ලෝහ ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| පරණ ටයර්, ටියුබ් මිළදී ගැනීම/හෝ අලෙවිය | 400 0 | 650 0 | 1,000 0 |
| අබලි ද්‍රව්‍ය එකතු කිරීම හා විකිණීම | 400 0 | 650 0 | 1,000 0 |
| ටයර් ටියුබ් විකිණීම හා/හෝ වෝල්කනයිස් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| බ්‍රේක් ලයිනර් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| ධාන්‍ය/කුළුබඩු ඇඹරුම්හලක් පවත්වාගෙන යාම | 550 0 | 750 0 | 1,000 0 |
| වී මෝලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| සංචාරක වෙළෙඳාම (ආහාර ද්‍රව්‍ය) | 400 0 | 650 0 | 1,000 0 |
| හුණු පිළිස්සීම හෝ ගබඩා කිරීම, සකස් කිරීම හෝ විකිණීම/ හුණු පෝරණුව | 500 0 | 750 0 | 1,000 0 |
| ඇසිඩ් වර්ග විකිණීම හෝ ගබඩා කර තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| රිදී භාණ්ඩ නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| කළුගල් කැඩීමේ ස්ථානයක් පවත්වාගෙන යෑම | 500 0 | 750 0 | 1,000 0 |
| කළුගල් ඇඹරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| ස්වර්ණාභරණ ඔප දැමීමේ ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| මැණික් කැපීම/ඔප දැමීම හා/හෝ අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| නරක් වන සුළු ආහාර ද්‍රව්‍ය හෝ සිල්ලර බඩු ගබඩා කිරීම හෝ විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | | |
|---|---|---|---|
| *බලය දෙනු ලබන කාර්යය* | *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම* | | |
| | *රු. 750 නොඉක්මවන අවස්ථාවක* | *රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක* | *රු. 1,500 ඉක්මවන අවස්ථාවක* |
| | *රු. ශ.* | *රු. ශ.* | *රු. ශ.* |
| සත්ව ආහාර නිෂ්පාදනය හා/හෝ අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| මාළු/මස් ආශ්‍රිත නිෂ්පාදන හා/හෝ අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| ටින් කෑම, කිරි ආහාර වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| අවමංගල්‍ය කටයුතු භාරගන්නා ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| රෝගීන්ට ප්‍රතිකාර කරන ස්ථානයක් | 1,000 0 | 1,000 0 | 1,000 0 |
| එළවළු වෙළඳාම | 500 0 | 750 0 | 1,000 0 |
| පළතුරු වෙළඳාම | 500 0 | 750 0 | 1,000 0 |
| කඩල/රටකජු/රේස් වර්ග අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| සුරතල් මසුන් අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| කුෂන් වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| ඉන්ධන පිරවුම්හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| සත්ත්ව ආහාර අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| ගිනි නිවන උපකරණ අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| පරිගණක ආශ්‍රිත ක්‍රියා | 500 0 | 750 0 | 1,000 0 |

| | | |
|---|---|---|
| 01. | එළවළු, පළතුරු අලෙවිය | දිනකට රු. 50 බැගින් |
| 02. | ටොයිස් බඩු/නිමි ඇඳුම් විකිණීම | දිනකට රු. 50 බැගින් |
| 03. | සෙල්ලම් බඩු විකිණීම | දිනකට රු. 50 බැගින් |
| 04. | තාවකාලික අලෙවි ප්‍රවර්ධන කුටි | දිනකට රු. 1,000 බැගින් |
| 05. | උත්සව සමයේ දී ලාභ කළ භාණ්ඩ | දිනකට රු. 100 බැගින් |
| 06. | වෑන් රියකින්/ලොරියකින් ආහාර ද්‍රව්‍ය/බිස්කට් විකිණීම | දිනකට රු. 100 බැගින්. |

සංචාරක වෙළඳාම සඳහා අයකරනු ලබන බලපත්‍ර ගාස්තුවට අමතරව වැට් බද්ද සහ අනෙකුත් රජය විසින් පනවනු ලබන බදු මුදල් ද අයකරනු ලැබේ.

11 - 229/2

---

**මාවනැල්ල ප්‍රාදේශීය සභාව**

2018 වර්ෂයට කර්මාන්ත බද්දක් පැනවීම

මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් ඩබ්ලිව්. ඩී. කේ. ඒකනායක වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9:3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 150 (1) වගන්තිය ප්‍රකාරව මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් වශයෙන් 2018 වර්ෂයට අදාළව කර්මාන්ත බදු පැනවීම සම්බන්ධයෙන් පහත සඳහන් තීරණය වර්ෂ 2017 සැප්තැම්බර් මස 28 වැනි දින අංක 2017/621 යටතේ ගන්නට යෙදුනු බව මෙයින් නිවේදනය කරමි.

ඩබ්ලිව්. ඩී. කේ. ඒකනායක,
ලේකම්,
මාවනැල්ල ප්‍රාදේශීය සභාව.

2017 සැප්තැම්බර් මස 28 වැනි දින,
මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් ඩබ්ලිව්. ඩී. කේ. ඒකනායක වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 150(1) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව මාවනැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2018 වර්ෂයට අදාළව කර්මාන්ත බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට මම තීරණය කරමි. එනම්,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 150 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මාවනැල්ල ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයෙහි II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2018 වර්ෂය සඳහා නියම විය යුතු බවට මම තීරණය කරමි.

*(අ)* 2017 වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දින පැවති යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් යථෝක්ත බද්ද 2018 මාර්තු මස 31 වැනි දිනට එම බද්දට යටත් තැනැත්තා විසින් ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට විධානය කිරීමට ; සහ

*(ආ)* 2018 වර්ෂයේ දී ආරම්භ කරනු ලබන කර්මාන්තයක් සම්බන්ධයෙන් වූ විට යථෝක්ත බද්ද කර්මාන්තය ආරම්භ කොට මසක් ඇතුළත කර්මාන්තය පවත්වාගෙන යනු ලබන තැනැත්තා විසින් ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු යැයි විධානය කිරීමට මම තීරණය කරමි.

**උපලේඛනය**

| | *I වැනි තීරුව* | *II වැනි තීරුව* | | |
|---|---|---|---|---|
| | | *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම* | | |
| *අනු. අංකය* | | *රු. 750 නොඉක්මවන අවස්ථාවක* | *රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක* | *රු. 1,500 ඉක්මවන අවස්ථාවක* |
| | | *රු. ශ.* | *රු. ශ.* | *රු. ශ.* |
| 1. | විසිතුරු බඩු/තෑගි භාණ්ඩ/සාප්පු බඩු/සෙල්ලම් බඩු නිෂ්පාදනය | 350 0 | 650 0 | 1,000 0 |
| 2. | කඩල/රටකජු ටොෆී වර්ග නිෂ්පාදනය | 300 0 | 650 0 | 750 0 |
| 3. | යන්ත්‍ර සූත්‍ර සහ අමතර කොටස් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 4. | මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 5. | ස්ටිකර්/නාමපුවරු සැකසීම | 500 0 | 750 0 | 1,000 0 |
| 6. | පින්තූර රාමු කිරීම | 400 0 | 500 0 | 600 0 |
| 7. | රබර් මුද්‍රා සකස් කිරීම | 300 0 | 500 0 | 750 0 |
| 8. | අත්යන්ත්‍ර රෙදි නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 9. | රෙදි මුද්‍රණය කිරීම/සායම් දැමීම/පින්තාරු කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | ස්වර්ණාභරණ නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | පොල්තෙල්/තේ කොළ/තුනපහ/ඖෂධ වර්ග/කුළුබඩු නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | ඉදල්/කොහු/ලණු/බුරුසු ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදනය | 400 0 | 600 0 | 1,000 0 |
| 13. | රිදී භාණ්ඩ නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | සම් භාණ්ඩ නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | හඳුන්කූරු නිෂ්පාදනය | 300 0 | 500 0 | 750 0 |
| 16. | පපඩම් නිෂ්පාදනය | 300 0 | 500 0 | 750 0 |
| 17. | පාවහන් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | බෑග් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | සත්ත්ව ආහාර නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 20. | සහල් පිටි නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | කෘත්‍රිම මල් නිෂ්පාදනය | 300 0 | 500 0 | 750 0 |
| 22. | යම් භාණ්ඩයක් නිෂ්පාදකයෙකු ලෙස කටයුතු කිරීම | 500 0 | 750 0 | 1,000 0 |

## මාවනැල්ල ප්‍රාදේශීය සභාව

### 2018 වර්ෂයට වාහන හා සත්ත්ව බද්දක් පැනවීම

මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් ඩබ්ලිව්. ඩී. කේ. ඒකනායක වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පතෙත් 9:3 වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 147 වන වගන්තිය හා 148 වැනි වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් වශයෙන් 2018 වර්ෂයට අදළව වාහන හා සත්ත්ව බද්ද පැනවීම සම්බන්ධයෙන් පහත සඳහන් තීරණය වර්ෂ 2017 සැප්තැම්බර් මස 28 වැනි දින අංක 2017/622 යටතේ ගන්නට යෙදුනු බව මෙයින් නිවේදනය කරමි.

ඩබ්ලිව්. ඩී. කේ. ඒකනායක,
ලේකම්,
මාවනැල්ල ප්‍රාදේශීය සභාව.

2017 ඔක්තෝබර් මස 05 වැනි දින,
මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් ඩබ්ලිව්. ඩී. කේ. ඒකනායක වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9:3 වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 147 වන වගන්තිය හා 148 වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව පහත උපලේඛනයෙහි දක්වෙන ආකාරයට වාහන හා සතුන් පිළිබඳ වාර්ෂික බද්දක් මාවනැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2018 වර්ෂයට අදළව නියම කර අය කිරීමට මම තීරණය කරමි. එනම්,

**උපලේඛනය**

| | | රු. ශත |
|---|---|---|
| | මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා | 25 0 |
| | සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා - | |
| (අ) | වෙළඳ කාර්ය සඳහා යොදවන්නේ නම් | 18 0 |
| (ආ) | වෙළඳ කාර්ය නොවන කාර්ය සඳහා යොදවන්නේ නම් | 4 0 |
| | සෑම කරත්තයක් සඳහා | 20 0 |
| | සෑම අත්කරත්තයක් සඳහා | 10 0 |
| | සෑම රික්ෂෝවක් සඳහා | 7 50 |
| | සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා | 15 0 |
| | සෑම ඇතෙකු සඳහා | 50 0 |

විෂ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද ඇති ළමා වාහන වීල් බැරෝ හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්ය සඳහා යොදවන අත්කරත්ත සහ වෙළඳ කාර්ය සඳහා නොයොදවන අත්කරත්ත මෙකී ගෙවීමෙන් නිදහස් කෙරේ.

මේ උපලේඛනයේ "වෙළඳ කාර්ය" යන්නට, විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළඳ ව්‍යාපාරයක් නැතහොත් කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු හෝ යම් ලිඛිත නැතහොත් මුද්‍රිත ද්‍රව්‍ය ගෙන යාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

11 - 229/4

---

## වත්තේගම නගර සභාව

### 2018 වර්ෂය සඳහා වෙළඳ බලපත්‍ර ගාස්තු, කර්මාන්ත හා ව්‍යාපාර බදු, රථ වාහන හා සත්ත්ව බදු, අනෙකුත් ගාස්තු අයකිරීම

වත්තේගම නගර සභාවේ ධුරකාලය අවසන් වී ඇති හෙයින් 255 වන අධිකාරය වන නගර සභා ආඥපනතේ අංක 27 (3) වගන්තිය අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2017 සැප්තැම්බර් මස 22 වන දින තීරණ අංක 702 යටතේ පහත සඳහන් සම්මතයන් කරනු ලබන බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

255 වන අධිකාරය වන නගර සභා ආඥා පනතේ වගන්ති අංක 164 (අ) සහ 165 (ආ) ප්‍රකාරව වත්තේගම නගර සභාව විසින් පහත එක් එක් උපලේඛනයේ සඳහන් කර ඇති ආකාරයට නැවත දැනුම් දීමකින් අවලංගු කරන තෙක් 2018 වර්ෂයේ ජනවාරි මස 01 වැනි දින සිට ගාස්තු හා බදු පනවා අයකරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

පී. එස්. බී. මඩුගල්ලේ,
ලේකම්,
වත්තේගම නගර සභාව.

2017 සැප්තැම්බර් මස 22 වැනි දින,
වත්තේගම නගර සභා කාර්යාලයේ දී ය.

**කර්මාන්ත බදු පැනවීමේ යෝජනාව - 2018 වර්ෂය**

වත්තේගම නගර සභාවේ ධූරකාලය අවසන් වී ඇති හෙයින් 255 වන අධිකාරය වන නගර සභා ආඥපනතේ අංක 27 (3) වගන්තිය අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එකී නගර සභා ආඥපනතේ 165 අ (1) වන වගන්තියෙන් නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව වත්තේගම නගර සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත මෙහි දක්වෙන 1 වන උපලේඛනයේ 1 වන තීරුවේ සඳහන් විෂයාංකයකට අයත් එක් එක් කර්මාන්තය වෙනුවෙන් උපලේඛනයේ 11 වන තීරුවේ සඳහන් කර ඇති එක් එක් කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූපිත තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2018 වර්ෂය සඳහා පනවා අයකළයුතු බවටත්, එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තන් 2018 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර එම බදු මුදල ගෙවිය යුතු බවටත්, මෙය ගැසට් පත්‍රයේ පළ කිරීමට සුදුසු බවටත් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2017 සැප්තැම්බර් මස 22 වන දින තීරණ අංක 702 යටතේ ලබා දී ඇති බවත් මෙයින් ජනතාවට නිවේදනය කරනු ලැබේ.

*උපලේඛනය අංක 01*

*165(අ) වගන්තිය - ඇතැම් කර්මාන්ත විෂයෙහි බදු*

| *I වැනි තීරුව* | | *II වැනි තීරුව* | | |
|---|---|---|---|---|
| *අනු. අංකය* | *බද්දේ ස්වභාවය* | *වාර්ෂික වටිනාකම රු. 750 දක්වා රු. ශත* | *වාර්ෂික වටිනාකම රු. 751 සිට රු. 1,500 දක්වා රු. ශත* | *වාර්ෂික වටිනාකම රු. 1,500 ට වැඩි රු. ශත* |
| 1. | රෙදිපිළි වෙළඳම | 500 0 | 750 0 | 1,000 0 |
| 2. | සාප්පු බඩු වෙළඳම | 500 0 | 750 0 | 1,000 0 |
| 3. | අලුත් හෝ පෙර සවි ටයර් ටියුබ් විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 4. | ඇඳුම් මැසීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 5. | වඩුමඩුවක් පවත්වාගෙන යාම (අත්යන්ත්‍ර) | 500 0 | 750 0 | 1,000 0 |
| 6. | සුළු අපනයන භෝග වෙළඳම | 500 0 | 750 0 | 1,000 0 |
| 7. | සිමෙන්ති අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 8. | දැව ගබඩාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 9. | අළුත් ලෝහ වෙළඳම(හාඩ්වෙයාර්) | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | ඇස්බැස්ටස් ෂීට් වෙළඳම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | ලෝහ උපකරණ වෙළඳම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | වෙළඳම සඳහා වැලි ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | වෙළඳම සඳහා ගඩොල්, කළුගල්, උළු, ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | තීන්ත, වාර්නිස්, ඩිස්ටෙම්පර් අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | පාපැදි අළුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | මෝටර් රථ අමතර කොටස් අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | ත්‍රීරෝද රථ අමතර කොටස් අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | යතුරු පැදි රථ අමතර කොටස් අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | පාපැදි අමතර කොටස් අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 20. | ගෘහ විදුලි උපකරණ අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | කාර්මික විදුලි උපකරණ අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |

| අනු. අංකය | බද්දේ ස්වභාවය | වාර්ෂික වටිනාකම රු. 750 දක්වා රු. ශත | වාර්ෂික වටිනාකම රු. 751 සිට රු. 1,500 දක්වා රු. ශත | වාර්ෂික වටිනාකම රු. 1,500 ට වැඩි රු. ශත |
|---|---|---|---|---|
| 22. | ස්වර්ණාභරණ නිෂ්පාදනය හා අළුත්වැඩියාව | 500 0 | 750 0 | 1,000 0 |
| 23. | දැව ගෘහ භාණ්ඩ අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 24. | ලෝහ ගෘහ භාණ්ඩ අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 25. | ප්ලාස්ටික් ගෘහ භාණ්ඩ අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 26. | ජංගම දුරකථන අලෙවි කරන ස්ථානය | 500 0 | 750 0 | 1,000 0 |
| 27. | ජංගම දුරකථන අලුත් වැඩියා කරන ස්ථාන | 500 0 | 750 0 | 1,000 0 |
| 28. | බීඩි, සිගරට්, සුරුට්ටු, බුලත්විට අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 29. | ලොතරැයිපත් අලෙවි කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 30. | පරණ ලෝහ අලෙවි කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 31. | පරණ බෝතල්, කඩදාසි, ගෝනි අලෙවි කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 32. | අත්‍යන්ත්‍ර කම්හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 33. | පුවක් වෙළඳම් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 34. | දුම්කොළ වෙළඳම් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 35. | බැටරි චාජ් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 36. | ඇලුමිනියම් භාණ්ඩ අලෙවි කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 37. | ප්ලාස්ටික් භාණ්ඩ අලෙවි කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 38. | පොලිතින් අලෙවි කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 39. | පොල් ලී අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 40. | විදුලි කාර්මික වැඩපොලක් | 500 0 | 750 0 | 1,000 0 |
| 41. | බටහිර ඖෂධ අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 42. | ආයුර්වේද ඖෂධ අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 43. | වාහන සේවා ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 44. | ත්‍රී රෝද රථ සේවා ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 45. | යතුරු පැදි සේවා ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 46. | විදුලි උපකරණ අමතර කොටස් අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 47. | විදුලි උපකරණ අලුත් වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 48. | ඇසුරුම් කිරීමේ ආයතනයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 49. | වීදුරු වෙළඳම් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 50. | මහන මැෂින් අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 51. | වීදුරු කැපීම | 500 0 | 750 0 | 1,000 0 |
| 52. | පින්තූර රාමුකිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 53. | කුෂන් වැඩපලක් | 500 0 | 750 0 | 1,000 0 |
| 54. | විසිතුරු මසුන් අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 55. | විසිතුරු පක්ෂීන් අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 56. | ශබ්ද වාහිනී යන්ත්‍ර කුලියට දීම | 500 0 | 750 0 | 1,000 0 |
| 57. | ගීත පටිගත කිරීමේ ස්ථානය | 500 0 | 750 0 | 1,000 0 |
| 58. | තැටිගත කළ චිත්‍රපට අලෙවිය හෝ කුළියට දෙන ස්ථාන(වීඩියෝ සෙන්ටර්) | 500 0 | 750 0 | 1,000 0 |
| 59. | පොත් පත් ලිපිද්‍රව්‍ය අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 60. | පුවත් පත් අලෙවි ආයතන | 500 0 | 750 0 | 1,000 0 |
| 61. | මුද්‍රණාලය | 500 0 | 750 0 | 1,000 0 |
| 62. | ඡායා පිටපත් | 500 0 | 750 0 | 1,000 0 |
| 63. | පරිගණක මුද්‍රණ ආයතන | 500 0 | 750 0 | 1,000 0 |
| 64. | සම්භාණ්ඩ අලෙවි කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 65. | සම්භාණ්ඩ පාවහන් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 66. | රේස් බුකියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 67. | ඡායා රූප ශාලාව | 500 0 | 750 0 | 1,000 0 |

| අනු. අංකය | බද්දේ ස්වභාවය | වාර්ෂික වටිනාකම රු. 750 දක්වා රු. ශත | වාර්ෂික වටිනාකම රු. 751 සිට රු. 1,500 දක්වා රු. ශත | වාර්ෂික වටිනාකම රු. 1,500 ට වැඩි රු. ශත |
|---|---|---|---|---|
| 68. | කෘෂි බීජ අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 69. | කෘෂිකාර්මික පැළ අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 70. | විසිතුරු මල් පැල අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 71. | ඉදල් කොසු වැඩපල | 500 0 | 750 0 | 1,000 0 |
| 72. | නාම පුවරු හා ප්ලාස්ටික් අකුරු කැපීම | 500 0 | 750 0 | 1,000 0 |
| 73. | සිමෙන්ති බ්ලොක්ගල් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 74. | සිමෙන්ති විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 75. | සිනමා ශාලාවක් | 500 0 | 750 0 | 1,000 0 |
| 76. | දුනු කොළ අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 77. | බතික් රෙදි නිෂ්පාදනය හා අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 78. | වාහන පින්තාරු කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 79. | මැටි භාණ්ඩ අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 80. | ඇස් කණ්නාඩි අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 81. | ටයිල් හා සනීපාරක්ෂක භාණ්ඩ අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 82. | සංගීත භාණ්ඩ අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 83. | පිඟන් හෝ වීදුරු භාණ්ඩ අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 84. | අත් යන්ත්‍ර ඉරුම්හලක් | 500 0 | 750 0 | 1,000 0 |
| 85. | දර මඩුවක් හෝ දර ගබඩාවක් | 500 0 | 750 0 | 1,000 0 |
| 86. | ධාන්‍ය හෝ මාංශ භෝග වර්ග ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 87. | සත්ත්ව ආහාර අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 88. | ඔරලෝසු අලෙවි ස්ථානය | 500 0 | 750 0 | 1,000 0 |
| 89. | ඔරලෝසු අමතර කොටස් අලෙවිය හා අලුත් වැඩියාව | 500 0 | 750 0 | 1,000 0 |
| 90. | හඳුන්කූරු නිෂ්පාදනය හා අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 91. | යාන්ත්‍රික වඩු මඩුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 92. | ටයර් ටියුබ් අලුත්වැඩියා කිරීම හෝ වෝල්කනයිස් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 93. | බීරළු වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 94. | වාහන අළුත්වැඩියා කිරීම (ගරාජ්) | 500 0 | 750 0 | 1,000 0 |
| 95. | ත්‍රී රෝද රථ අළුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 96. | යතුරු පැදි අළුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 97. | රෙදිපිළි පිරිසිදු කිරීමේ ස්ථානය | 500 0 | 750 0 | 1,000 0 |
| 98. | හුණු පෝරණුවක් | 500 0 | 750 0 | 1,000 0 |
| 99. | යාන්ත්‍රික කම්හලක් | 500 0 | 750 0 | 1,000 0 |
| 100. | පොල් අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 101. | ඇණ නිෂ්පාදනය කිරීමේ කර්මාන්තයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 102. | අලෙවිය සඳහා ගෑස් ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 103. | කෘෂි රසායන ද්‍රව්‍ය අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 104. | කෘෂි රසායන පොහොර අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 105. | ගඩොල් පෝරණුව | 500 0 | 750 0 | 1,000 0 |
| 106. | ලේත් වැඩපලක් (යකඩ ලියවන පට්ටලයක්) | 500 0 | 750 0 | 1,000 0 |
| 107. | වෑල්ඩින් වැඩපලක් | 500 0 | 750 0 | 1,000 0 |
| 108. | වී ඇඹරුම්හලක් | 500 0 | 750 0 | 1,000 0 |
| 109. | වාහන බොඩි සෑදීම | 500 0 | 750 0 | 1,000 0 |
| 110. | ඉහත උපලේඛනයේ සඳහන් නොවන එහෙත් කර්මාන්ත බද්දක් අයකිරීමට සුදුසු ව්‍යාපාර සඳහා | 500 0 | 750 0 | 1,000 0 |

**වත්තේගම නගර සභාව**

ව්‍යාපාර/කර්මාන්ත බලපත්‍ර නිකුත් කිරීමේ හා බලපත්‍ර ගාස්තු අයකිරීමේ යෝජනාව - 2018 වර්ෂය

වත්තේගම නගර සභාව විසින් 2018 වර්ෂය තුළ නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන් 255 වන අධිකාරිය වන නගර සභා ආඥාපනතේ 162 වන වගන්තිය සමග කියවිය යුතු 164 වන වගන්තියෙන් නගර සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර, මෙහි පහත 2 වන උපලේඛනයේ 1 වන තීරුවේ විෂයාංකයට අයත් එක් එක් කර්මාන්තය වෙනුවෙන් එම උපලේඛනවල 11 වන තීරුවේ අනුරූප සටහනෙහි වාර්ෂික වටිනාකමට නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අයකිරීමට සුදුසු බවටත්, එම කර්මාන්ත/ව්‍යාපාර පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් ලබාගත යුතු බවට අණපනත්වලින් කර ඇති නියමයන් ක්‍රියාත්මක කිරීමට සුදුසු බවටත්, මෙය ගැසට් පත්‍රයේ පළ කිරීමට සුදුසු බවටත් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2017 සැප්තැම්බර් මස 22 වැනි දින තීරණ අංක 702 යටතේ ලබා දී ඇති බවත් මෙයින් ජනතාවට නිවේදනය කරනු ලැබේ.

පී.එස්.බී.මඩුගල්ලේ,
ලේකම්,
වත්තේගම නගර සභාව.

2017 සැප්තැම්බර් මස 22 වැනි දින,
වත්තේගම නගර සභා කාර්යාලයේ දී ය.

**164 වගන්තිය - වෙළඳ ව්‍යාපාර බලපත්‍ර ගාස්තු**

| *I වැනි තීරුව* | | *II වැනි තීරුව* | | |
|---|---|---|---|---|
| *අනු. අංකය* | *වෙළෙඳ බලපත්‍රයේ ස්වභාවය* | *වාර්ෂික වටිනාකම රු.750 දක්වා රු. ශත* | *වාර්ෂික වටිනාකම රු. 751-1,500 දක්වා රු.ශත* | *වාර්ෂික වටිනාකම රු. 1,500ට වැඩි රු.ශත* |
| 1. | සිල්ලර වෙළෙඳම | 500 0 | 750 0 | 1,000 0 |
| 2. | ශීතකල ආහාර අලෙවි කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 3. | ශීත කළ බීම අලෙවි කිරීම(සිල්ලර) | 500 0 | 750 0 | 1,000 0 |
| 4. | ශීත කළ බීම අලෙවි කිරීම(තොග) | 500 0 | 750 0 | 1,000 0 |
| 5. | ආපන ශාලාවක් (හෝටලයක්) | 500 0 | 750 0 | 1,000 0 |
| 6. | තේ හෝ කෝපි කඩයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 7. | එළවළු වෙළෙඳම(තොග හා සිල්ලර) | 500 0 | 750 0 | 1,000 0 |
| 8. | බේකරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 9. | බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | ඇසුරුම් කළ ආහාර වෙළෙඳම(ග්‍රොසරි) | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | රසකැවිලි නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | රසකැවිලි අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | බිම්මල් වගා කිරීම හා අලෙවි කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | සතුන් 100ට වැඩි කුකුළු ගොවිපළක් | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | මිරිස් හා ධාන්‍ය ඇඹරුම්හලක් | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | තේ කොළ තොග අලෙවි කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | අයිස්ක්‍රීම් හා යෝගට් ගබඩා කිරීම හා බෙදා හැරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | අයිස්ක්‍රීම් හා යෝගට් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |

| *I වැනි තීරුව* | | *II වැනි තීරුව* | | |
|---|---|---|---|---|
